

සඤ්ජීවනී ව්‍යාඛ්‍යා සහිත

# එලු සඳැස් ලකුණ



භද්‍රාභිධාන මහාස්ථවිරපාදයන්වහන්සේ විසින්

කරණ ලද

# එළු සඳස් ලකුණ.

වැලිවිටියේ පණ්ඩිත

සෝරත ස්ථවිරයන් වහන්සේ විසින්

ලියන ලද

සඤ්ජීවනී ව්‍යාඛ්‍යා සහිත යි.

---

ඇම්. ඇම්. පී. විජයරත්න අප්පුහාමි විසින්

ස්වකීය විද්‍යාප්‍රබෝධ යන්ත්‍රාලයෙහි

මුද්‍රාපිත යි.

2479

1935

# සංඥාපනය.

මේ පොතට 'සඳස් ලකුණ' 'එළු සඳස් ලකුණ' යනු සාමාන්‍ය සංඥා ය. මීට කර්තෘ විසින් තබන ලද විශෙෂනාමය කුමක් දැයි තීරණය කළ නො හේ. ව්‍යාකරණ ග්‍රන්ථයන්ට 'ශබ්ද ලක්‍ෂණ' යන නාමය මෙන් ම ඡන්දොග්‍රන්ථයන්ට 'සඳස් ලකුණ' යන නාමය ද සාමාන්‍යසංඥාවක් හෙයිනි. එහෙයින් ම මේ ග්‍රන්ථය අනික් ඡන්දොග්‍රන්ථයන්ගෙන් වෙන් කොට දැක්වීමට 'එළු' යන්න මුලට යොදා මීට 'එළු සඳස් ලකුණ' යයි කියනු ලැබේ.

මීට වර්ණනාවක් ලියූ එක් තෙරපානන්වහන්සේ කෙනෙක් මෙහි ප්‍රාරම්භගීයෙහි "සඳස් ලකුණු එළුවේ" යන පාඨය "සඳැස් ලකුණ එළුවෙන්" යි වෙනස් කොට, කර්තෘ විසින් මේ පොතට තබන ලද විශෙෂ නාමය 'සඳැස් ලකුණ' යන්න ය යි ද, එය වෙනස් කිරීම බර පතළ අපරාධයකැයි ද, මහත් වූ ශාස්ත්‍ර පරිහානියකැයි ද පවසති.

ඒ ඒ භාෂා විශෙෂයන් අනු ව ඡන්දස් ද නානාප්‍රකාර වේ. 'එළුවෙන් සඳස් ලකුණ පවසමැ' යි ප්‍රතිඥා කළොත් මාගධ සංස්කෘතාදි කවර ඡන්දසක් වුව ද එළුවෙන් පැවසීමට ඉඩ තිබේ. 'එළුවේ සඳස් ලකුණු පවසමැ' යි යන ප්‍රතිඥාව එබඳු ඉඩ නැති කරයි. මේ ග්‍රන්ථ කර්තෘ බලාපොරොත්තු වූයේ ද එළුවට විශෙෂ වූ සඳස් ලකුණු පැවසීම යි. මේ ග්‍රන්ථයෙන් කරණ ලද්දේත් එය ම ය.

මීට විශෙෂ සංඥාවක් නො තබන ලද හෙයින් 'සඳස් ලකුණ' යනුවෙන් ද එළුවට විශෙෂ වූ සඳස් ලකුණු පවසන හෙයින් 'එළු සඳස් ලකුණ' යනුවෙන් ද මෙය ප්‍රසිද්ධ වී ය. 'සඳැස් ලකුණ' යන්න ම මෙහි විශෙෂ නාමය වේවා. එය 'එළු සඳස් ලකුණ' යයි වෙනස් කිරීමෙන් ක්‍රම විරොධයක් වත් ශාස්ත්‍ර පරිහානියක් වත් නො වේ. බරපතළ අපරාධ ගැණ කියනු ම කවරේ ද? තවද 'සඳැස්' යන්නට වඩා 'සඳස්' යන්න ම 'ඡන්දස්' යන්නට ඉතා කිට්ටු ය. එහෙයින් අපි ද මීට "එළු සඳස් ලකුණ" යන නම ම යෙදීමු.

මේ ග්‍රන්ථයෙහි කර්තෘ භද්‍ර නම් ස්ථවිර නමකි. උන්වහන්සේ කවර කාලක කවර ප්‍රදෙශක විසූසේක් ද? යනු නිශ්චය කොට

කිය නොහැකි ය. **දෙවෙනි පැරකුම්බා** මහ රජතුමාගෙන් පසු කාලෙක විසූ බව නම් පැහැදිලි ය. **කව්සිළුමිණෙන්** උපුටා ගත් නිදසුන් මෙහි ඇතුළත් හෙයිනි.

බොහෝ සිංහල කවීහු සංස්කෘතාදිය අනුගමනය කළ නමුත් බෙහෙවින් සංස්කෘතච්ඡන්දස අනුගමනය නො කළහ. පැරණි සිංහල කාව්‍යග්‍රන්ථ වශයෙන් අප ඉදිරියෙහි තිබෙන පොත් වල සංස්කෘතච්ඡන්දසෙහි දක්වූ වෘත්ත වලින් බැඳි පද්‍ය විරල ය. ගී පොත්වල නම් එකක් වත් නැත. එසේ හෙයින් සිංහලච්ඡන්දෝ ග්‍රන්ථකාරයා ද සංස්කෘතච්ඡන්දස අනුගමනය නො කිරීම යුතු ම ය. එසේ වුවත් එළු සඳස් ලකුණ කළ ආචාර්යවරයා සංස්කෘතච්ඡන්දස අනුගමනය කරන්ට උත්සාහ දැරූ නමුත් සිංහලච්ඡන්දස ම ඊට ඉඩ දී නැත. මේ ග්‍රන්ථයෙහි මාත්‍රාච්ඡන්දසට ම ප්‍රධානස්ථානයක් ලැබෙන නමුත්, මාත්‍රාච්ඡන්දස් ප්‍රස්තාරය පැහැදිලි ලෙස ඉගැන්වූ නමුත්, සංස්කෘතච්ඡන්දසෙහි වර්ණ වෘත්තයන්ට නියම කළ, මාත්‍රා සංඛ්‍යා වශයෙන් විෂම වූ, ගණ ම දක්වන ලදී. මාත්‍රාච්ඡන්දසට අයත් ගණ ගැණ වචනයකුදු නො කියන ලදී. එසේ ම ප්‍රාකෘතච්ඡන්දසුන්ට විශෙෂ වූ පඤ්ච මාත්‍රාදි ගණ තිබෙන බවකුදු නො කීහ.

ලංකා ද්වීපය සිංහලයන්ට වාසස්ථාන වන්නට බොහෝ කල කට පෙර ද ශිෂ්ට දෙශයක් වී ය. ශිෂ්ටාචාරයත් සමග ම ශිල්ප ශාස්ත්‍ර ද දියුණු වේ. මනුෂ්‍යයන්ගේ විනොදය පිණිස උපකාර වන සංගීතය විශෙෂයෙන් ශිෂ්ටාචාරයත් සමග ඉදිරියට ගමන් කෙරේ. සංගීතය දියුණු වනු සමග ම, එහි කොටසක් වූ ගීතයන් බැඳීමට උපදෙස් දෙන ඡන්දස ද දියුණු වේ. එහෙයින් විජය රජු පැමිණෙන කල්හි ද ලංකාද්වීපයෙහි ඡන්දශ්ශාස්ත්‍රයක් තිබුනු බව සිතිය හැකි ය.

සිංහලච්ඡන්දස හුදු සංස්කෘතච්ඡන්දසින් ම උපන්නක් නො වේ. ලංකාද්වීපයෙහි පෙර පටන් පැවත්තා වූ ඡන්දසත් අන්‍ය ප්‍රාකෘතච්ඡන්දසුත් වර්තමාන සිංහලච්ඡන්දසට ප්‍රභව වූ බව නිසැක ය. සිංහල භාෂාශාස්ත්‍රයෝ සංස්කෘත භාෂාශාස්ත්‍රයන්ගෙන් පොෂණය ලැබූහ. එහෙයින් ම අන්‍යවූ ඡන්දස් ප්‍රභව කොට ඇති සිංහලච්ඡන්දස ද සංස්කෘතච්ඡන්දසින් පොෂිත වී ය. වියන්(=විතාන) සදුල්සෙළි (=ශාර්දූල වික්‍රීඩිත) යනාදි වෘත්තනාම (ඡන්දස් දෙකෙහි ඒ නාමයන්ගෙන් හඳුන්වනු ලබන වෘත්තයන්ගේ විෂමත්වය තිබුනත්) සංස්කෘතච්ඡන්දසෙහි බන්ධුත්වය පෙන්වයි. මෙහි හා සංස්කෘතච්ඡන්දසෙහිත් **තොටක** වෘත්තයාගේ ලක්ෂණ හා නාමය ද

සමාන මැයි. **ගාහ**, **ඛඩවක්** ආදි නාම ප්‍රාකෘතවිජ්ඤයින් ගන්නා ලදැයි සිතිය හැකි ය. එහෙත් වෘත්තලක්‍ෂණ නම් බොහෝ විෂම ය. මෙහි **ගාහ** විරිත් ලකුණු 84 වැනි පිටෙහි පෙණේ. ප්‍රාකෘතයෙහි 'ගාහා' නමින් පළ වන්නේ සංස්කෘතයෙහි උපගීති නමින් හඳුන්වනු ලබන වෘත්තය යි.

උපගීතිලක්‍ෂණ වෘත්තරත්නාකර සරලාව්‍යාඛ්‍යාවෙහි 43 වැනි පිටෙහි සඳහන් වේ. **ගාහ** වෘත්තයට දක්වන ලද ප්‍රාකෘත නිදර්ශනය මෙසේ යි:—

"වංදෙ චංදණහාරෙ-තාවඅ රූඅං පඅාසංති,
වණ්ණ සරම්භ කිතී-ජාවඅ අප්පං දංසෙඉ"

මෙහි **කඩවක්** විරිත් ලකුණු 77 වැනි පිටෙහි පෙණේ. ඒ සූත්‍රගීයෙහි "සපද විලසින්" යනු "සපදැ සෙයින්" (=සපද ඇ සෙයින්) යි ශුද්ධ කර ගත යුතුයි. ප්‍රාකෘතයෙහි "කඩවක" යනු දහයේ පටන් සොළොස තෙක් පද්‍යාඞ්ඝ ඇති පද්‍ය විශෙෂයෙකි. සමහර විට සවිස්ස, තිහ බැගින් ඇත්තා වූ ද, විෂම සඞ්ඛ්‍යක පද්‍යාඞ්ඝ ඇත්තා වූ ද **ඛඩවකජාතිහු** වෙත්. **භවිසයත්තකහා** නම් අපභ්‍රංසකාව්‍යයෙහි එබඳු ඛඩවකජාතිහු පෙණෙත්. එහි ආරම්භයෙහි ම දක්වන ලද ඛඩවකය මෙසේයි:—

1. පණවිප්පිණු ජිණු තඉලොය බංධු
   දුත්තර තරභවනිව්වූඪ බංධු.

2. හව්වය ණව යණපංකය පයංගු
   කාය කාසණ මොහ තිමිරොහ භංගු.

3. ණිසෙස හරිය භුවණංතරු ලු
   උක්ඛය දුක්කම්ම තරු මූල ජාලු.

4. අවිසාළු අරාළු අකොඋහල්ලු
   කංදප්ප දප්ප දලණෙක්කමල්ලු.

5. සංසාර සමුද්දුත්තරණසෙළු
   අවිරොහු අලොහු අණාවලෙළු.

6. පරමෙසරු පරම ගුණප්පහාණු
   සංපත්තු පරම නිව්වුඉ ණිහාණු.

7. අරහංතු අණංතු මහංතු සංතු
   සිළුසංකතු සුහුමු අණාඉවංතු.

8. පරමපපළු පහු පංසීළු මහන්නූ
පරම්ටසී පරම කාරණ කායන්නූ.

සතතා 9. සෝ හියඟු ඛරෙව් පවරමහා සිරිකුල හරහො
10. විත්ථාරම් ලොංඟු කිත්තඤ්ඤු හවිසණ රාහිවහො.

මෙහි මූල අටෙහි එකක් එකක් ම එළිසම සහිත පාද දෙක කින් යුත් පද්‍යඬියකි. 9, 10 වැනි දෙක එක් පද්‍යඬියකි. මේ සියල්ල පාද වශයෙන් ගණිතොත් මාත්‍රා සොළොස බැගින් ඇති පාද අටළොසකි. සියලු ම කඩවකයෝ 'සතතා' නම් වෘත්ත යෙන් බැඳි පද්‍යඬියකින් අවසන් වෙත්. මෙතෙකින් මේ කඩ වක් ජාතීන්හි හා එළු කඩවක් විරිත්හිත් පවත්නා වෙනස තේරුම් ගත හැකි ය.

සිංහල පද්‍යයන්හි එළි සමය මෑත දී පටන් ගන්නා ලද්ද කැ යි ඇතැම්හු සිතත්. ගීතගොවින්දයත්, යථොක්ත ප්‍රාකෘත කාව්‍යාදියත් බැලූ කල ඔවුන්ගේ ඒ මතය පහසුවෙන් ම දුරු වනු එකාන්ත ය. සීගිරිගලෙහි ද එළි සම සිව්පද කොටා තිබේ. ඒ සිව්පද දැන් පවත්නා ගී පොත්වලට ද වඩා පුරාතන ය. මූල පටන් ම සිංහලච්ඡන්දසෙහි ගී සිවුපද දෙකොටස ම පැවති බව මෙ කී කරුණු වලින් නිශ්චය කළ හැකි ය.

'වන්නම්, අවදනම්' යනාදි වෘත්ත විශෙෂයන් ගැණ එළු සඳස් ලකුණෙහි කිසිවක් නො කියන ලදි. එළු සඳස් ලකුණ කරණ කාලයෙහි ඒ වෘත්ත සිංහලයන් අතර ප්‍රසිද්ධියට නො පැමිණීම ඊට හේතු විය හැකිසි. ඒ වන්නම් දහ අටෙහි හා අවදනම් හතරෙහිත් නම් ඇතුළත් කොට මෑත දී කිසිවෙකු විසින් බඳින ලද කව් සයක් තිබේ.

ඒ වන්නම් ආදිය සම්බන්ධ විස්තර දැක්වීමට මෙහි ඉඩක් නැත. රාජකීය ආසියාතික සමිතියේ ලඞකා ශාඛාව විසින් ප්‍රසිද්ධ කරණු ලබන ශාස්ත්‍රීය සංග්‍රහයෙහි 21 වැනි කාණ්ඩයෙහි *No.* 61 දරණ කලාපයෙහි 129 වැනි පිටෙහි පටන් 162 වැනි පිට තෙක් "*Kandyan Music*" යන මාතෘකාවෙන් ලියනලද ඉංග්‍රීසි ලිපි යෙහි වන්නම් ආදිය සම්බන්ධ නිදර්ශනාදිය සහිත දීර්ඝ විස්තරයක් ඇතුළත් වේ. විස්තර කැමැතියන් එයින් ම බලා ගත යුතුයි.

එළු සඳස් ලකුණ කරන්නට පෙර ද සිංහලච්ඡන්දොග්‍රන්ථයක් තිබුනේ ය. එය මීට වඩා මාහැඟි යයි හෝ නො එසේ යයි හෝ කිමට පොහොසත් නො වෙමු. දැන් තිබෙන එක ම සිංහලච්ඡන්දො ග්‍රන්ථය නම් මේ එළු සඳස් ලකුණ යි. මෙහි වනාහි නොයෙක්

අඩුපාඩු තිබෙන බව රහසක් නො වේ. කාව්‍යග්‍රන්ථයන්හි සුප්‍රසිද්ධ සුමධුර වෘත්තරාශියක් ම මේ ග්‍රන්ථයෙහි නො දක්වන ලදී. ඡන්දෝග්‍රන්ථකාරයා විසින් ෂට්ප්‍රත්‍යය විශෙෂයෙන් ඉගැන්විය යුතු නමුත් මෙහි ප්‍රස්තාර ප්‍රත්‍යයෙන් වැඩියක් නො කියන ලදී. දක්වන ලද සමහර වෘත්ත ලක්ෂණ ද ආකුල ව්‍යාකුල ය.

එසේ වුවත් අතීතයෙහි දී මේ ග්‍රන්ථය සුධීන්ගේ ගෞරවාදරයට පාත්‍ර වූ බව නොවගමුවේ සිරි රහල් මාහිමියන්ගේ—

“ගෙලෙ මිණිමල් පව      ර
මුහුලත කුසුම් සිරිග      ර
තලළත තලා ද      ර
සඳස් ලකුණෙන් එලඳ සැදි යු      ර”

යන පද්‍යයෙන් සපුට වේ. ක්‍රිස්තු වර්ෂ 1874 වන තෙක් මේ පොතට ව්‍යාඛ්‍යාවක් නො පැවැත්තේ ය. එහෙයින් ම ඡන්දශ්ශාස්ත්‍රය සම්බන්ධ අවබොධයක් නැති ලෙඛකයන් විසින් මෙහි නොයෙක් විපරීත කරණ ලදී. නිදසුන් පිණිස බැහැරින් ගෙණ යොදන ලද බොහෝ පද්‍යයෝ අර්ථයක් නැති වචන මාලාවන් බවට පෙරළුනහ. භද්‍ර තෙරණුවන්ගේ සමහර සූත්‍ර ගී ද, නිදසුන් පැහැදිලි නැති තැන, නිසාම් ප්‍රලාපබවට පත් විය. මෙහි පෙණෙන නොයෙක් අඩුපාඩුත් ආකුලව්‍යාකුලතාත් අව්‍යක්ත ලෙඛකයන්ගේ දොෂ සඞ්ඛ්‍යාවට ම එකතු කරන්ට අපි ඉතා කැමැත්තෙමු. ව්‍යාඛ්‍යා සහිත වූ ද දුර්බොධ නුවූ ද ග්‍රන්ථයන්හි ලෙඛකයන් විසින් කළ විපරීතයන්ගේ මහත්ත්වයත් අනෙකත්වයත් දක්නා විට මෙහි දොස් පෙණීම පුදුමයට එතරම් හෙතුවක් නො වේ. පුරාතන ප්‍රාඥයන්ගේ ගෞරවාදරයට පාත්‍ර වුව ද, මෙසේ වූ දොෂකාලුෂ්‍යයන් නිසා මෑතක් වන තෙක් මේ පොත බොහෝ උගතුන්ගේ පරිහාසයට ම භාජන වූයේ ය.

එසේ පවත්නා අතර වරින් වර ඒ ඒ උගතුන් විසින් කරණ ලද ව්‍යාඛ්‍යාන-ශොධන-මුද්‍රාපණයන් නිසා මෙහි දුර්භාග්‍ය දශාව ක්‍රමයෙන් ගෙවී යන බව පෙණේ. ඒ පිළිබඳ ගෞරවයට වැලිතර ශ්‍රී ඥානාවාස ස්ථවිරයන් වහන්සේත්, වැලිපටන්විල ශ්‍රී දීපඞ්කරාභිධාන මහා ස්ථවිරයන් වහන්සේත් හිමියෝ වෙත්. උන්වහන්සේලා විසින් පිළියෙල කළ මේ පොතෙහි පිටපත් බොහෝ දෙනා ලඟ තිබෙන හෙයින් ඒ පිළිබඳ විස්තර ලිවීම අනවශ්‍ය ය.

ඒ පොත් බැලූ කල එලුසඳස්ලකුණ සම්බන්ධයෙන් තවත් කළ යුතු දේ තිබෙන බව පෙණී ගියේ ය. එහෙයින් ම මේ ව්‍යාපාරයෙහි යෙදුනෙමු. මෙහි දී අපට වඩා ම උපකාර වූයේ ඥානාවාස ස්ථවිරයන් වහන්සේගේ සංස්කරණය ය යන බව ස්තුතිපූර්වකව සඳහන් කරමු. එහෙත් දීපඞ්කර ස්ථවිරපාදයන් වහන්සේගේ සංස්කරණය ද ඉවහල් නුවූයේ නො වේ.

මෙහි ඒ ඒ වෘත්තයන්ට නිදසුන් වශයෙන් නොයෙක් පොත් පත්වලින් ගෙණ යොදන ලද, පූර්වාපර සම්බන්ධයක් නො මැති, පද්‍යයන් සංස්කරණයට පැමිණවීම ඉතාමත් අපහසු බව තතු දන්නෝ දනිත්. ඒ පද්‍යයන් නිරවද්‍ය කර ගත හැකි නම්, එය සිංහල සාහිත්‍යයට රුකුලක් විය හැකි වුවත්, දැන් පවත්නා තත්ත්වයෙහි තිබුනත් මේ ග්‍රන්ථයෙන් අපේක්ෂා කරණු ලබන ප්‍රයෝජනය අඩු වීමට එයින් බාධාවක් නො වේ. වෘත්තලක්ෂණ ඉගෙණීමට නිදසුන් වල අර්ථ දැන ගැණීම අවශ්‍ය නො වේ. වෘත්තලක්ෂණාභ්‍යාසය සඳහා අර්ථශූන්‍ය පදයන් පවා යොදා පද්‍යයන් රචනා කිරීමට කාව්‍යානුශාසනකාරයෝ අනුශාසනය කෙරෙති. එහෙයින් මෙහි දැක්වූ බොහෝ නිදසුන් අර්ථයක් ගෙණ දෙන පරිදි සංස්කරණය කරන්ට උත්සාහ නො කෙළෙමු. මේ පොත ඉගෙණගන්නන් විසින් මෙහි දක්වනලද නිදසුන් කටපාඩම් කර ගැණීම ද අවශ්‍ය නො වේ. උගත් අධ්‍යයන පරීක්ෂකයෝ ද ඡන්දෝග්‍රන්ථයන්හි එන නිදසුන් ම දක්වන්නට යයි නියම නො කරති. ඒ ඒ වෘත්තයන්ට තමන් විසින් ම නිදසුන් තනා ගැණීම හැම ලෙසින් ම ඵලදායක වේ. පරීක්ෂකයෝ ද එබඳු නිදසුන් වලට ම වඩා සලකති.

මෙහි ගී ලකුණු පැවසූ සියලු ම සූත්‍ර ගී පාඩම් කිරීම ද අවශ්‍ය නො වේ. සියලු ම ගී වල සාමාන්‍ය ලක්ෂණ දක්වා අප විසින් තනන ලද මේ පොතෙහි 23, 24 වැනි පිටුවල දැක්වූ ගී පාඩම් කර ගැණීමෙන් කීපයක් හැර අනික් සියලු ගී වල ලක්ෂණ සිත තබා ගත හැකි ය. එහි "පි-ම-බ" යනාදි කලු අකුරු වලින් දක්වනු ලබන්නේ පියුම්, මත්වල, බමර ආදි ගී නම්වල මුල් අකුරුයි. 24 වැනි පිටෙහි ගී නම් පෙළෙහි 9 වැනි අඞ්කය ලඟ 'යොන් ගී' යනු 'සොන් ගී'යි වැරදී වැටී තිබේ. සිවුපද ලකුණු පැවසූ සූත්‍ර ගී ද පාඩම් නො කොට පහසුවෙන් හිතෙහි තබා ගැණීමට මෙ වැනි ක්‍රම සාදා ගත යුතුයි

අපේ මේ සංස්කරණය හා ව්‍යාඛ්‍යාවත් කෙවල පරිපූර්ණය යි ද, සර්වතොභද්‍රය යි ද උදන් නො ම අනමු. මේ පොත හා මීට පෙර

ප්‍රකාශයට පැමිණි පොත් ද සසඳා බලත්වා. බලා විමසත්වා. එවිට මෙහි තත්ත්වය නිරූපණය සඳහා අපගේ මාර්ගදෙශකත්වය නුවුව මනා ය. මෙහි අපේ ප්‍රමාදයෙන් වූ වැරදි ද තිබිය හැකි ය. එලු සඳස් ලකුණ වැනි ව්‍යාකූල වූ පොතක් එක් වරකින් දෙකකින් පිරිසිදු බවට පත් කිරීම අපහසු ය. දෙවෙනි වර මුද්‍රණය කිරීමෙහි දී මේ පොත තවදුරටත් සංස්කරණය කිරීමට බලාපොරොත්තු වෙමු. ඒ සඳහා පැරණි පිටපත් ආදිය සපයා එවීම් ආදියෙන් ශාස්ත්‍රාර්ථීනු අපට උපකාරී වෙත්වා.

මීට,

වැලිවිටියේ සොරත ස්ථවිර.

සඤ්ජීවනී ව්‍යාඛ්‍යා

සහිත

# එළු සඳැස් ලකුණ.

## නමවු මුනිසරණ.

1. පිණිපා කොටින් සතර-සඳැස් ලකුණු හෙළුවේ,
පවසම් පොරණ ඇජරන්-ගිය මඟිනැළුප් හෙ මෙසේ.

2. මතෙක් ලුහු ගුරු වේ-දෙමත් දිගු හා පසුහල්,
ගුරු වක් කොටින් අඳනේ-ලුහු ඉදු අදු ඇඳමේ.

---

සිංහලච්ඡන්දොග්‍රන්ථයක් කටැටි වූ භද්‍රාභිධාන මහාස්ථවිර පාදයෝ ප්‍රාරබ්ධමාණග්‍රන්ථයාගේ නිර්විඝ්න පරිසමාප්ති සඳහා සෞවෂ්ට ශ්‍රී සිද්ධාර්ථ ගෞතම සම්බුද්ධප්‍රණාමය කරණුවෝ "පිණිපා කොටින් සතර" යනාදිය කියත්.

**1. අන්වය:—** සතර පිණිපා කොටින් හෙළුවේ සඳැස්ලකුණු පොරණ ඇජරන් ගිය ඇළුප්මඟින් පවසම්. හේ මෙසේ:—

**අර්ථ:—** ශාස්තෲන්වහන්සේ වැඳ සිංහලයෙහි ඡන්දෝලක්ෂණ පුරාණාචාර්යයන් ගමන් කළ වචනමාර්ගයෙන් ප්‍රකාශ කරමි. ඒ මෙසේ යි—

**විස්තර:—** "පොරණ ඇජරන් ගිය ඇළුප් මඟින්" යනුවෙන් මීට පෙර ද සිංහලච්ඡන්දොග්‍රන්ථයක් තුබූනු බවත් එය අනුව මෙය කළබවත් හැඟේ. මීට පෙර ඡන්දොග්‍රන්ථයක් තුබූනු බව **ශිලාමේඝවර්ණාභය** නරේන්ද්‍රයෝ ද

"කාලාගුරුසුලුපා-වැසි වූ කුළුණු නුවණ යුත්,
කලණමිතෙව්යතුන්-ගත්හි පියුම් ලකුණු ඇ"

යනාදීන් පැවසූහ.

**2. අන්වය:—** එක්මත් ලුහු වේ. දෙමත් දිගු හා පසුහල් ගුරු වේ. ඇඳමේ ගුරු වක් කොටින් අඳනේ (යුතු ය.) ලුහු ඉදු කොටින් අඳු.

**3. අඩමත් මලකර වේ-වගතිනුදු බඳ අඩවණ ***
**ගඟ දඬු සඳ'ඹ ඈ සද-නිදසුන් මෙයට දන්නේ.**

---

**අර්ථ:—** සුබෝධ යි.

**විස්තර:—** ඇස්පිය හෙළුමකට ගත වන පමණ කාලය එක් මාත්‍රාවකි. එබඳු එක් මාත්‍රාවක් ඇත්තෝ හෙවත් එක් මාත්‍රාවක් තුළ උච්චාරණය කට හැක්කෝ ලුහු (=ලඝු) නම් වේ. එනම් අ, ඉ යනාදි හ්‍රස්වාක්ෂරයි. 'ක' යනාදිය ද ('ක්' යන්නෙහි අඩ මාත්‍රාවක් ද 'අ' යන්නෙහි එක් මාත්‍රාවක් දූ යි) මාත්‍රා එක හමාරක් ඇතත් ලඝු වශයෙන් ම ගණිනු ලැබේ. මාත්‍රා දෙකක් ඇති 'ආ' යනාදි දීර්ඝාක්ෂර ද, හල් අකුරක් පසු කොට ඇති හෙවත් හල් අකුරකට මුලින් සිටි 'අල් කල්' යනාදිය ද 'ගුරු' නම් වේ. 'යි, වු' යන අකුරු දෙකට මුලින් සිටි හ්‍රස්වය ද සමහර විට ගුරක් සේ සිංහල කවීහු සලකති. "වයන්තන් පෙදෙසි පා තබා ගී ගයන්නේ" "කමල්වන් වතින් ගී මතින් රැවු නැගුම් ලා" යන මයූරසන්දෙශ පද්‍යපාද ඊට නිදර්ශන යි.

ගුරුලඝුන් ඇඳීමෙහි හෙවත් ඡන්දස් ප්‍රස්තාර කිරීමෙහි ද වෘත්තවින්‍යාසයෙහි ද ගුරු අකුර උදෙසා අඳිනු ලබන රේඛාව '◡' යන්න මෙන් වක් (=ඇද) කොට ද, ලුහු අකුර උදෙසා අඳිනු ලබන රේඛාව '—' යන්න මෙන් ඍජු කොට ද ඇඳිය යුතු යි.

**3. අන්වය:—** මලකර අඩමත් වේ. ඉනුදු බඳ වගත් අඩවණ වේ. ගඟ, දඬු, සඳ, අඹ ඈ සද මෙයට නිදසුන් (ය යි) දන්නේ.

**විස්තර:—** ස්වරයෝ ප්‍රාණාක්ෂරයෝ යි. ඔවුන් නැති 'ක්, ග්' යනාදි හල් අකුරු 'මලකර' (=පණ නැති අකුරු) නම් වේ. 'ගතකුරු' යනු ද ඔවුන්ට ම නමි. ඒ මෘතාක්ෂරයෝ අර්ධමාත්‍රාවක් ඇත්තෝ යි. හෙවත් ඇස් පිය හෙළන කාලයෙන් අඩියක් තුළ උච්චාරණය කරණු ලබන්නෝ යි. අන්තන්හි ද "ව්‍යඤ්ජනඤ්චාර්ධමාත්‍රකම්" යි මෙය ම කියන ලදී. ඒ මෘතාක්ෂරයන් අතුරෙන් ද (වර්ගාක්ෂරයක් හා) බැඳුනු වර්ගාන්තාක්ෂර අර්ධවර්ණ නම් වේ 'ගඟ' යනාදීන්හි පෙණෙන අර්ධවර්ගාන්තය මීට නිදර්ශන යි.

---

* වගතින් දනු අඩඩමත්. වගතුන් දනු අඩවණ
(අඩපණ & අඩමත්)

**4. යතිගේ නි කිසි ගුරු–ලුහු වේ ලුහු දු ගුරු වේ,**
**පදලකුණෙහි දු ගුරුලුහු–පිරිගේ වැඩෙ* වඩුත් ගේ.**

---

‘ගඟ, දඬු, සඳ, අඹ’ යන ශබ්දයෝ ‘ගඞ්ගා, දණ්ඩ, චන්ද්‍ර, අම්බ’ යන මේ ශබ්දයන්ගෙන් බිඳී එති. ඒ ශබ්දයන්හි පෙණෙන ‘ඞ් ණ්, න්, ම්’ යන මොහු වර්ගාන්තාක්ෂරයෝ යි. ඔහු අන්‍යාක්ෂර හා බැඳුනාහු වෙත්. එහෙයින් සිංහලයෙහි දී ඔවුන්ගේ අර්ධයක් ලොප් කරණු ලැබේ. ‘ගඟ’ යනාදීන්හි පෙණෙන්නේ ඒ ඉතිරි අර්ධය යි. එය අර්ධවර්ණයකි. හෙවත් අර්ධව්‍යඤ්ජනයකි.

ශුද්ධ සිංහල ශබ්දයන්හි බැඳි අකුරු ලිය හැකි තන්හි ද බැඳි අකුරු නො ලියනු ලැබේ. එහෙයින් ම ‘කඳ’ ලඳු, පඳු’ යනාදිය වැරදිය යනුත් ‘කන්ද, ලන්දු, පන්දු’ යි ලිය යුතුය යනුත් ආචාර්‍ය්‍යසම්ප්‍රදායයි. මේ සම්ප්‍රදාය පටන් ගත්තේ වර්ගාක්ෂරයන් හා බැඳුනු වර්ගාන්තාක්ෂර අර්ධවර්ණ වන හෙයිනි.

මේ අර්ධවර්ණය සහිත අක්ෂරය ‘සඤ්ඤක අකුර’ යන නමින් ද හඳුන්වනු ලැබේ. සඤ්ඤක ‘ග’ යන්නැ යි කීසාල ‘ඟ’ යන්න ගැණේ. මේ ‘සඤ්ඤක’ යන්න ‘සංයොග’ යන්නෙහි විකෘතියකි.

පාලි සංස්කෘත භාෂාවන්හි සංයොගයකට මුලින් සිටි හ්‍රස්ව ස්වර ගුරු සේ සලකතත් සිංහලයෙහි දී මේ ‘සඤ්ඤකයට’ මුලින් සිටි හ්‍රස්වය ලඝුවක් සේ ම සලකනු ලැබේ. එහෙයින් ‘ගඟ’ යන්න මාත්‍රා දෙකක් ලෙස ම ගැණේ.

4. අන්වය හා අර්ථ සුබොධ යි.

විස්තර– යති හෙතුවෙන් සමහරවිට සමහර ගුර්‍වක්ෂර යෝ ලඝු වෙති. එහෙයින් යතිස්ථානයෙහි වූ ‘ආ, ඊ’ ආදීහු ‘අ, ඉ’ ආදිබවට පැමිණිය හැකි වෙත්. මේ නීතිය අනු ව බලන විට පද්‍යයෙහි දී ‘බලා’ යන්න ‘බල’ යි සිටිය ද දොෂක් නො වන බව හැගේ. එබඳු තැන් මහා කවිප්‍රයොගයන්හි ද පෙණේ. **සැළලිහිණි අස්නෙහි—**

“දන තැන් ගෙණ දමන ගොදුරට නො හැකි ළි ය,
ප නි මි න් දියෙන් ඔවුනොවුනැහෙහි පෙර ළි ය”.

යන තන්හි ‘හැකිළි, පෙරළි’ යන පද යති හෙතුවෙන් හ්‍රස්ව කොට යකාරයකුදු ආගම කොට යොදන ලදී.

---

* වඩී.

'යති හෙතුවෙන් හෝ ඡන්දෝ හෙතුවෙන් ගුරු අකුර ලඝු වක් වේ ය' යි නීතිය තුබුනත්, එබඳු විපය්‍යාසයක් කිරීමෙන් අර්ථාවබොධය දුෂ්කර විය හැකි තන්හි එය නො කට යුතු යි.

**යති හෙතුවෙන් ලඝු අක්ෂරයෝ ද ගුරු වෙති.** පළමු කී නීතියට වඩා මේ නීතිය බල පැවැත්වූ තැන් සිංහල කාව්‍ය ග්‍රන්ථයන්හි ඉතා සුලභ ය. "පව්රද කඳ නාලෝ මුල් දිගතුබර" යන සමුද්‍රඝොෂ වෘත්තපාදයෙහි අන්තිමාක්ෂරය වූ (රකාරසථ) අකාරය ගුරක් ලෙස සලකනු ලැබේ. එසේ නො සලකාතොත් මාත්‍රාවක් අඩු වීමෙන් 'හතවෘත්ත' දෝෂය වේ. මෙසේ ම "මහත්මා ඒ ගුරුන්ගේ පා පියුම් යුග දී මූදුන නා" යන තන්හි අන්තයෙහි වූ අයන්තට ආයන්ත ම ආදෙශ වී ය. අනික් හ්‍රස්වාක්ෂරයන් යති හෙතුවෙන් මෙසේ ම දීඝී වන බවත්, සමහර තැන අසවර්ණයන් පවා ආදෙශ කරණ බවත් 'ලඳු' යනු 'ලන්දු' යි යොදන්නාක් මෙන් අඞ්වගීාන්තාක්ෂර මාත්‍රා වෘද්ධ කොට යොදන බවත් දත යුතු යි.

**හෙතු වැඩෙන කල්හි හෙවත් මාත්‍රාවන්ගේ අධිකත්ව යක් හෝ ඌනත්වයක් නැත හොත් ගණයන්ගේ විෂමත්ව යක් ඇති කල්හි පාදලක්ෂණයෙහි ද සමහර ගුරු අකුරු පිරිහේ හෙවත් ලඝුභාවයට පැමිණේ. එසේ ම ලුහු අකුරු වැඩේ හෙවත් දීඝී වීමෙන් ගුරුත්වයට හැරේ.**

පද්‍යබන්ධනය කරණ විට යම් කිසි ගුරු අකුරක් නිසා මාත්‍රා අධික වීමෙන් හෝ ගණ වෙනස් වීමෙන් හෝ වෘත්තලක්ෂණ බිඳේ නම්, එබඳු තැන ඒ ගුරු අකුර ලඝුවක් කොට යෙදිය යුතු ය. උදාහරණ:—

"නුවණ නිසයු රා-විනේ කුමුදු නිස යු රා,
කෙලෙස්තුසර දිවයුරා-බව දුකුලැවග අයුරා".

මෙය **ගජගාමි** වෘත්තයෙන් බඳනා ලද්දකි. එහි ප්‍රථමපාදය මාත්‍රා අටකින් යුක්ත විය යුතු ය. නදීවාචක 'නී' ශබ්දය 'නුවණ' සඳ හා සමාස නොව "නුවණ නීසයුරා" යි යෙදුව හොත් ඒ පාදයෙහි මාත්‍රා නවයක් වීමෙන් පාදලක්ෂණය බිඳේ. එහෙයින් රකාරය හ්‍රස්ව කොට එසේ යොදන ලදී. **නොමග** වෘත්තොදාහරණයෙහි "අනෙයා විනෙයා දනනා වණනා" යන පාදයෙහි 'අනේ, විනේ' යි සිටිය යුතු තැන් ගණ හෙතුවෙන් හ්‍රස්ව කොට 'යා' යන්නකුදු ආගම කොට යොදන ලදී.

**5. ලුහු දෙ'ක් ගුරෙක් ගුරු-දෙලුහු අකුරු දෙමතෙක්,**
**කිසියම් තෙනෙක ගුරු හුන-ගණනේ ඒ මත් ගණනින්.**

---

යම් කිසි ලඝු අක්‍ෂරයක් නිසා වෘත්තයෙහි නියතමාත්‍රා ගණන අඩු වේ නම්, නොහොත් නියත ගණය වෙනස් වේ නම්, එබඳු තැන ඒ ලඝු අකුර ගුරක් කොට යෙදිය යුතු යි. උදාහරණ:—

"අනතානය සමත-පවන් නුවණැති සුනිසිත"

මෙය අවිකෘත සේ යොදතොත් වන්නේ 'අනතනය' යන්න යි. එවිට මාත්‍රාවක් අඩු වේ. එහෙයින් 'අනත' යන් නෙහි තකාරසථ අකාරය දීඝී කොට යොදන ලදී. එසේ ම

"රකින මුනිවදන් සිත්හි තබා සිත් මිණක් මෙන්"

යන ගඞ්ගාරොහණවණ්නා ශ්ලොකපාදයෙහි 'සිත්හි' යන පදය 'සිත්හී' යි දීඝී කොට යොදන ලද්දේ 'දන්සිත්හී' යි මගණය සම්පූණී කරණු සඳහා ය. එසේ නො කොළොත් පාද ලක්‍ෂණ භග්න වේ.

මෙසේ යත්‍යාදි හෙතුවෙන් ගුවීක්‍ෂර ලඝුත්වයට පැමිණවීම් ආදිය මෙබඳු තන්හි ම කළ යුතු ය යි නියම කළ නො හැකි ය. ඡේකප්‍රයොගානුසාරයෙන් හා පරිචිතියෙනුත් ඒ කළ යුතු ය. නුසුදුසු තැන එබඳු විපයඖාස කිරීම දොෂජනක ය.

**5.** අන්වය:- දෙ ලුහු ගුරෙක් (වේ). ගුරු දෙලුහු අකුරු දෙම තෙක් (වේ). කිසියම් තෙනෙක ගුරු හුන ඒ මත්ගණිනින් ගණනේ.

අර්ථ:- ලඝු දෙකක් එක් ගුරක් වේ. (එක්) ගුරු අකුරක් හෝ ලඝු වූ අකුරු දෙකක් හෝ මාත්‍රා දෙකක් වේ. (මාත්‍රා වෘත්තයන්හි) කිසියම් තැනෙක්හි ගුරු අකුරක් යෙදුනොත් ඒ ගුවීක්‍ෂරය මාත්‍රා ගණනින් ම ගිණිය යුතු ය.

විස්තර:- සිංහලච්ඡන්දසෙහි මාත්‍රාවෘත්තයෝ ම ප්‍රධාන වෙත්. ඒ මාත්‍රාවෘත්තයන්හි ලඝු දෙකක් එක් ගුරකට සමාන වේ. එහෙයින් එක් ගුරු අකුරක් හෝ ලුහු අකුරු දෙකක් හෝ මාත්‍රා දෙකක් වශයෙන් ම ගත යුතු ය. මාත්‍රා සඞ්ඛ්‍යා දක්වී මෙන් ලක්‍ෂණ පැවසූ වෘත්තයන්ට උදාහරණ කළ පද්‍යයන් පරීක්‍ෂාවෙන් බැලූ විට මෙය පැහැදිලි වේ.

**6. මන තුන් තුන් ගුරු ලුහු-බදස ඈ මැද කෙළ ගුරු,**
**සරතැ මැදවසන් ලුහු-අට ගණ මෙසේ දන්නේ.**

---

**6. අර්ථ:-** ගුරු ලඝු තුණ තුණ ඇත්තේ 'මගණ' නම් ද 'නගණ' නම් ද වේ. ආදි මධ්‍ය අවසානයන්හි ගුරු ඇත්තේ බගණ, දගණ, සගණ නම් වේ. ආදි මධ්‍ය අවසානයන්හි ලඝු ඇත්තේ යගණ, රගණ, තගණ යි. ගණ අට මෙසේ දත යුතුයි.

**විස්තර:-** සිංහලච්ඡන්දස මාත්‍රාවෘත්ත ප්‍රධාන කොට ඇති නමුත්, මෙහි දක්වනලද්දේ වර්ණවෘත්තයට අයත් ගණ යි. මේ ගණ අට වර්ණ වශයෙන් මිස මාත්‍රාවශයෙන් සම නො වේ. මාත්‍රාච්ඡන්දසෙහි එක් එක් ගණයක වන්නේ මාත්‍රා සතරකි. එහෙයින් සර්වගුරු ගණයෙහි ගුරු අකුරු දෙකක් වන නමුත් සර්වලඝු ගණයෙහි ලඝු අක්ෂර සතරකි. මාත්‍රා සතර විධි ලෙස ප්‍රස්තාර කළ විට පඞ්ක්ති පසක් ලැබේ. ඒ පස ම මාත්‍රාච්ඡන්දසට අයත් ගණ වශයෙන් සංස්කෘතච්ඡන්දස්හි ගණු ලැබේ. ඒ ගණ පස ප්‍රස්තාර ක්‍රමයෙන් මෙසේ යි:-

◡ ◡ සර්වගුරු ගණය
– – ◡ න ගණය
– ◡ – ද ගණය
◡ – – බ ගණය
– – – – සර්ව ලඝු ගණය.

මේ පොතෙහි මාත්‍රාවෘත්තලක්ෂණ කථනාවසරයෙහි ගන්නා ලද්දේ වර්ණවෘත්තයට අයත් ගණ යි. ඒ වර්ණවෘත්තායත්ත ගණයන්හි මාත්‍රා සඞ්ඛ්‍යාව නො ව වර්ණසඞ්ඛ්‍යාව ම සලකනු ලැබේ. එහෙයින් මගණයෙහි මාත්‍රා හයක් වන නමුත් නගණයෙහි මාත්‍රා තුණක් ම වේ. එහෙත් ඒ දෙකෙහි ම අකුරු තුණ බැගින් වේ.

කවර හෙයින් වර්ණවෘත්තයෙහි ගණයකට අකුරු තුණක් ම වේ ද? යත්:- 'ගණ' නම් සමූහ යි. සමූහයක් වන්නේ යටත් පිරිසෙයින් තුණක් එක් වූ විට ය. එහෙයින් ගණයක් හෙවත් සමූහයක් ඇති වන ඉතා අඩු ගණන ගෙණ ගණය අකුරු තුණකින් පරිමිත බව තැකිය යුතු යි.

කවර හෙයින් අඩුවැඩි නො ව ගණ අටක් ම වේද? යත්:- අකුරු තුණක් ඇති ඡන්දස වර්ණවෘත්තච්ඡන්දස් ප්‍රස්තාර ක්‍රමයෙන් ප්‍රස්තාර කළවිට වෘත්ත අටක් ම ලැබෙන හෙයිනි. මෙහි 'ගණ' නාමයෙන් ගන්නා ලද්දේ ඒ වෘත්ත අට යි. මෙහි පහත දක්වනු ලබන කොෂ්ඨයෙන් ගණනාමාදිය දත හැකි වේ.

| ගණනාම | ප්‍රස්තාරය. | දෙවතා. | මිත්‍රාදි | ඵල. | ශුභාදි. | උදාහරණ. |
|---|---|---|---|---|---|---|
| මගණ | ◡ ◡ ◡ | මහී | මිත්‍ර | ශ්‍රී | ශුභ | සෙත්දේවා |
| යගණ | – ◡ ◡ | ජල | දාස | ආයුෂ | ශුභ | සුගත් දෙවි. |
| රගණ | ◡ – ◡ | අග්නි | ශත්‍රැ | දහ | අශුභ | රෝද්‍රබික් |
| සගණ | – – ◡ | වායු | ශත්‍රැ | විදෙශගමන. | අශුභ | ඇවිදී |
| තගණ | ◡ ◡ – | ආකාශ | උදාසීන | ශූන්‍ය | අශුභ | ආකාශ |
| ජගණ | – ◡ – | රවි | උදාසීන | රුජා | අශුභ | රුදාව |
| බගණ | ◡ – – | චන්ද්‍ර | දාස | යශස් | ශුභ | සේකර |
| නගණ | – – – | දේව | මිත්‍ර | වෘද්ධි | ශුභ | වුවන |

('ජ-ර' ගණ උදාසීන යයි ද, 'ත-ස ගණ' ශත්‍රැ යි ද මත යෙක් වේ.)

ශාන්ත්‍යාදිය උදෙසා පද්‍යබන්ධනය කරන විට පද්‍යයාගේ ආරම්භයෙහි හා කාව්‍යනායකයාගේ නාමයට දෙපසෙහි ද ඉෂ්ට ගණ යෙදිය යුතුයි. දුෂ්ටඵල ඇති ගණයක් කාව්‍යප්‍රාරම්භයෙහි යෙදුන හොත් එය රකිනු සඳහා ඊට සිහෙන්තක් දෙවනුව යෙදිය යුතුයි. මතු දක්වනු ලබන කොෂ්ඨයෙන් ඒ දත හැකි වේ.

| | මිත්‍රගණ වුවොත් | දාසගණ වුවොත් | උදාසීන ගණවුවොත් | ශත්‍රැගණ වුවොත් |
|---|---|---|---|---|
| මිත්‍රගණයෙන් | සමෘද්ධි ආදිය වේ | ජයාදිය වේ. | ශුභ වේ. | බන්ධු පීඩා වේ. |
| දාස ,, | සර්වකාර්‍ය්‍ය සිද්ධිවේ | සියලුලාභ වේ | ධනනාශය වේ. | ශොකවේ. |
| උදාසීන ,, | ස්වල්පකාර්‍ය්‍ය සිද්ධිවේ | ප්‍රභූත්වය වේ | මන්දධෛර්‍ය්‍ය වේ. | බන්ධුවෛර වේ. |
| ශත්‍රැ ,, | භ්‍රම-නාශාදිය වේ | භාර්‍ය්‍යානාශය වේ. | සියකුල නැසීම වේ | විනාශය වේ. |

"මිත්‍රගණයෙන් පර ව මිත්‍රගණ වුවොත් සමෘද්ධ්‍යාදිය වේ. දාසගණ වුවොත් ජයාදිය වේ" යනාදි වශයෙන් යොදා ගත යුතුයි. සිදත්සඟරාවෙහි අලඞ්කාරාධිකාරව්‍යාඛ්‍යාවෙහි විස්තර පෙණේ.

**7. සවහන් ලකුණු එළි-සැනපුම් ද දනු අතුරේ,**
**ඉවු ඇසද පියවි හා-කිරියත්පද ද හඳුනවූ.**

**සන්විදි නිමි.**

---

**7.** අර්ථ පහසු සි.

**විස්තර:-** (1) **සවහන් ලකුණු** පිළිබඳ විස්තරය සිදත් සඟරා සත්තයෙන් දත යුතු සි.

(2) **'එළි'** යනු අවකාශ (ඉඩ) ස්ථානය සි. පද්‍යයක අවකාශ ස්ථානය නම් පාදන්තය සි.

සිව්පද නාමය ලබන පද්‍යයන්ගේ පද සතරෙහි කෙළවර සම විය යුතු ය. හෙවත් එක ම අකුරක් තැබිය යුතු ය.

අභ්‍යාසවශයෙන් පාදවසානයට ම 'එළි' නාමය යෙදෙතත් පාදමධ්‍යයෙහි සමානාක්ෂරාදිය යොදා සම කරණු ලබන තැන් ද 'එළි' යන නමින් හඳුන්වනු ලැබේ. පාදන්තයෙහි වන එළිය සමහර තැනක ස්වර රහිත ව්‍යඤ්ජනයන්ගෙන් ද, සමහර තැන එක ම ස්වරයක් සහිත (සවර්ණ) ව්‍යඤ්ජනයන්ගෙන් ද යෙදේ.

ස්වර රහිත ව්‍යඤ්ජනයෙන් වූ එළිසමයට උදාහරණ:-

"සග අපවග සැප  ත් - සිදු කර නො හැර බලව  ත්
වදහල හැම සුග  ත් - දහම් වෙත වඩවමින් බැති සි ත්"

මේ පද්‍යයෙහි එළිය සම කරණලද්දේ ස්වරරහිත ව්‍යඤ්ජනයක් වූ 'ත්' යන්නෙනි. (මහා කවිහු ද ව්‍යඤ්ජනයෙන් එළි සම කිරීමෙහි දී සමහර තැනක 'ම්' යන්නට 'න්' යන්න ආදෙශ කළහ. උදාහරණ:-

"පළමු අනැවැසියන්-හැදින අනදර නො කෙළෙ කිසියන්"

මෙහි 'කිසියන්' යන්න 'කිසියම්' යන්නෙන් එළිසමය සඳහා සිද්ධ කර ගත් රූපය සි. මෙබඳු දේ කිරීමට මහාකවීන්ට මිස අන්‍යයන්ට ඉඩ නැත.)

"අලකුරු මෙළේ දන්-පද අත්හි නො ම සිටුවවූ"

යනුවෙන් අල් අකුරුවලින් එළිසම නො කට යුතු ය යි ලකුණු ඇරෙහි කළ නියමය ගැණ කවීන් ගරු කළ බවක් සිංහල කාව්‍යග්‍රන්ථයන්ගෙන් නො පෙණේ.

සමානස්වරසහිත ව්‍යඤ්ජනයෙන් එළි සම කළ තැන් ඉතා බොහෝ ය. එළි සම කිරීමෙහි දී තණ, ලළ වර්ණයන්ගේ සවර්ණත්වය වර්තමානයෙහි මෙන් ම අතීතයෙහි ද බොහෝ ආචාර්යවරයෝ සැලකූහ. ඒ තුරුස්නා සමහර වාර්තිකයෝ මහා කවිප්‍රයෝගයන් වෙනස් කරති.

පාදමධ්‍යයෙහි එළිය වනාහි 1. මාත්‍රාවන්ගෙන් ද, 2. ස්වර යන්ගෙන් ද, 3. ස්වරසහිතව්‍යඤ්ජනයන්ගෙන් ද, 4. කෙවල ව්‍යඤ්ජනයන්ගෙන් ද සම කරණු ලැබේ.

1 වැන්නට උදහරණ:—

"දී නු ඛිම මහිම ඇති මුනි මා ර බ ල
වැ නු තැනක් වැති සත පින් සා ර ප ල
තැ නු නොයෙක් කෙත්වත් සරු සා ර ප ල
ද නු පසිඳු වෙහෙරෙක සැදි සෑ ර ග ල

මෙහි මාර, සාර, සාර, සෑර යන සිව්පදලෙහි දීර්ඝාක්ෂර හෙවත් මාත්‍රා දෙකක් ඇති අකුරු යෙදීමෙන් එළි සම කරණ ලදී.

"ජ ය ස ක් බෝ වා ර ගොස තුඟු නාද සා ර
රු පු ස ක් නා ෂෑ ර ගත් ගජ නොසර සු ර
මු එ ස ක් වළ නෑ ර ඇස තොද පිරි ඉති ර
අ ල ග ක් කෝනා ර හිමිසඳ දින මෙ පු ර"

යන්නෙහි ද මාත්‍රාවන්ගෙන් එළි සම කළ බව පෙනේ.

2 වැන්නට උදහරණ:—

"බ සේ ම හ රු කියමි න් අමරස සදි සී
සි තේ කු එ ණු ව ඩ මි න් තොව මුළා සී
ව ලේ ව ස න තවු ස න් දූකවැඳ සුබැ සී
ගි යේ කු ම ර සතු ටි න් මහ තො ව වෙහෙ සී"

මෙහි 'බසේ, සිතේ, වලේ, ගියේ' යන තන්හි ඒකාරයෙන් එළි සම කරණ ලදී.

3, 4 වැනි අංකයන්ට නිදර්ශන කාව්‍යග්‍රන්ථයන්හි ඉතා සුලභ ය. ව්‍යඤ්ජනයෙන් එළි සම කිරීමෙහි දී සමහර තැන බිඳු වර්ණයට ද 'න්' යන්න ආදෙශ කරණු ලැබේ. උදහරණ:—

"දි ය ම න් දිය ගති දූත ගත් අය ති සි
පැත ගන් ඉවුරෙන් දිය හී ගැඹුරැ සි"

මෙහි 'ගන්' යන තැන ප්‍රකෘතිය 'ගං' යන්න යි.

සමහරු 'එළි' සද 'එලි' යි ගෙණ "අලින් වනුයේ= එලි" යි විග්‍රහ කොට ව්‍යඤ්ජනාක්ෂරවාචී 'අල්' සදින් ඉ ප්‍රත්‍යය කොට නිපදවති. 'කල්, මල්, වල්' යනාදි ශබ්දයන්ගෙන් ඉප්‍රත්‍යය ව නිපන් 'කැලි, මැලි, වැලි' යනාදි ශබ්ද හා සසඳ බලන විට 'අල්' සදින් ඉපස වූ විට සිද්ධ වන්නේ 'ඇලි' යන රූපය ම ය යනු වැටහේ. අලින් පමණක් එළි සම නො කරණ බව යට දැක්වූ උදාහරණයන්ගෙන් ප්‍රසිද්ධ වේ ම ය. සමහර පුරාතනයන් අලින් එළි සම කිරීමට පවා විරුද්ධ වූ බව ලකුණුසරින් ගෙණ යට දැක්වූ නිදසුනෙන් පැහැදිලි වේ. එහෙයින් ප්‍රපඤ්ච නො කරමු.

මෙසේ එළි සම කොට කවි බැඳීම සිංහලකවින්ට පුරුදු වූයේ සංස්කෘත ගීතානුසාරයෙනි. ගීතගෝවින්දය බෙහෙවින් එළි සම කොට බඳනාලද සංස්කෘතකාව්‍යයෙකි.

(3) **'අතුරේ සැතපුම්'** යනු පාදයන්ගේ ඒ ඒ තන්හි පදපාඨනය සිඳිනු ලබන නොහොත් බෙදනු ලබන නැවතුම් පළ ල් ය. ඒ වනාහි දිවට පහසුතැන් විය යුතු සි. යති, විශ්‍රාම, විරාම, ඡේද යනාදි නාමයන්ගෙන් ද මෙය හඳුන්වනු ලැබේ. යුක්ත ස්ථානයෙහි කළ ඒ විරාමය ශ්‍රවණමාධුර්‍යයට පිණිස පවතී. ස්ථාන විපරීත වුව, ඵල ද විපරීත වේ. ඒ පිළිබද නියමයෝ මතු දක්වනු ලැබෙත්—

(අ) සාමාන්‍යයෙන් සියලු පාදයන්ගේ අවසන්හි යතිය තැබිය යුතුයි. උදාහරණ:—

"පැලඹි කල්පහස-බඹලොවිනා මහත්ගු දූ,
පිරිහුනුහු හා! රජ ෙන් – අන්දනතතුරෙ හා! කෙවදන්?."

ඒ පාදාන්තයතිය පදමධ්‍යයෙහි නො කට යුතුයි.

"බලා සසල සමු – දුර මහසත් සිති මෙසේ"

මෙහි ප්‍රථමපාදාන්තය වූයේ 'සමුදුර' යන පදයාගේ මධ්‍යයෙහි ය. එහෙයින් දුෂ්ට යි.

"දිය පතළ තෙද කිත් – සිරිමේ තිරිළු පුන්සඳ"

යන තන්හි 'කිත්සිරිමේ' යන සංඥානාමයාගේ මධ්‍යයෙහි පාදාන්තයතිය වූ හෙයින් දුෂ්ට වී ය.

එසේ ද වුවත් ප්‍රථමපාදයෙහි අග හා ද්විතීයපාදයෙහි මුලත් එකතු කොට සන්ධි සමාස ආදිය කට හැකි වේ.

(ආ) විශෙෂයෙන් ද්විතීයපාදයාගේ අන්තයෙහි යතිය වේ. එහෙයින් ඒ හා තෘතීයපාදයාගේ ආදියත් එක් කොට සන්ධි

සම්බන්ධ ආදිය නො කට යුතුයි. එසේ කළ හොත් පදිදුබාදෙස වෙයි. විස්තර සිදත්සඟරාසන්නයෙන් උගත යුතු යි.

(ඉ) ඒ ඒ වෘත්තයන්හි මැද ද සැතපුම් තබන්නට ඒ වෘත්ත පිළිබඳ සූත්‍රයන්හි නියම කරණු ලැබේ. එබඳු පාදමධ්‍යයතිය (*a*) විභක්ත්‍යන්ත පදයෙන් පර ව ද, (*b*) විභක්තිරහිත ශබ්ද ප්‍රකෘතියෙන් පර ව ද; (*c*) යතියෙන් දෙපසෙහි එකකට වැඩි සම අකුරු ගණනක් ඇති පදයන්ගේ මධ්‍යයෙහි ද වේ.

(*a*) "සිකි පිල්- වටමින්- ගිරිහිස- රැඳියේ"

යනු විභක්ත්‍යන්ත පදයෙන් පර ව වූ යතියට උදාහරණ යි. රේඛාඞ්කිත ස්ථානයන්හි යතියි.

(*b*) "අඳිමින් රිටි–සුඹුළුන් ඉස - බඳිමින් පිල මියුරු"

මේ කමලාවෘත්තපාදයෙහි 'රිටි' යන ලුප්තවිභක්තික ශබ්දප්‍රකෘතියෙන් පර ව යතිය යි.

මෙසේ විභක්ත්‍යන්තපදයන්ගෙන් ද ශබ්දප්‍රකෘතින්ගෙන් ද පර ව යතිය කිරීමෙන් කිසි දොසක් වීමට ඉඩ නො ලැබේ.

(*c*) පදයන්ගේ මධ්‍යයට යතිය පැමිණිවිට යතියෙහි දෙපස ට අකුරු කීපයක් සිටින සේ යතිය තැබිය යුතු යි.

"පැන පැන- යන වදු- රන පල වගුරණ"

යන තන්හි "වදුරන" යන පදයාගේ මධ්‍යයෙහි යතිය තබන ලදී. 'ව' යන්නෙන් පර ව 'ව–දුරන' යි කියා හෝ 'න' යන්නෙන් පෙරටු ව 'වදුර–න' යි කියා හෝ යතිය තබනලද නම් දුෂ්ට ය.

"මහලු මි- නිසුන්ට- නො කර අ- නාදර
හැසිරෙව- මතුවැඩ- වනලෙස- නිරතුර"

යන තන්හි 'මිනිසුනට' යන්නෙහි 'මි' යන්නෙන් ද 'අනාදර' යන්නෙහි 'අ' යන්නෙන් ද පර ව යති වූ හෙයින් දුෂ්ට ය.

(ඊ) පූර්වපදයන් හා සම්බන්ධ වන 'ද, හා' යනාදි අව්‍යයන් යතියෙන් පූර්වභාගයෙහි ම තැබිය යුතු යි.

"සැරියුත් මුගලන්- ද යන මහතෙර දෙනමට"

යන්නෙහි පූර්වපදය හා සම්බන්ධ වූ 'ද' යන්න යතියෙන් පර භාගයෙහි වී ය. එහෙයින් ඒ දුෂ්ට ය.

"සිවුරු බෝසත් පිළි - ගෙණ බඹහු දුන් මහණ ව"

යන්නෙහි පරපදය හා නිත්‍යසම්බන්ධය ඇති 'පිළි' යන්නෙන් පර වී යතිය වූ හෙයින් දුෂ්ට ය.

මෙහි මේ දක්වන ලද්දේ යති සම්බන්ධ විස්තරයෙන් ස්වල්ප මාත්‍ර යකි. විස්තර කැමැතියන් වෘත්තරත්නාකර සරලාව්‍යාඛ්‍යාව බලා උගත යුතු සි.

යතිය නියම නො කළ වෘත්තයන්හි ද ශ්‍රැතිසුඛය වන සේ යතිය කළ යුතු සි.

සමහර සංස්කෘතකවීන් මෙන් ම ඇතැම් සිංහල කවීහු ද සමහරවෘත්තයන්හි යතිය අපෙක්ෂා නො කළහ. සමුද්‍රඝොෂ වෘත්තයෙහි යතිය මාත්‍රා දශයකින් පර ව කාටයුතු ය යි නියමය ඇතත්, එය උල්ලඞ්ඝනය කොට බැඳි කව් කාව්‍යයන්හි පෙණේ.

යතිය වෘත්තලක්ෂණයෙන් අන්‍යයක් වුවත්, කාව්‍යගුණාදි අපෙක්ෂාවෙනුත් වෘත්තමධ්‍යයෙහි වුවක් හෙයිනුත් ආචාර්‍යයන් විසින් ඒ ඒ වෘත්තලක්ෂණප්‍රකාශක සූත්‍රයන්ට අන්තර්ගත කරණ ලදී. මාත්‍රා–ගුරු–ලඝු සඞ්ඛ්‍යා ස්ථානනියමය වෘත්තලක්ෂණ යයි දත යුතු සි.

(4) "ඉටු ඇ සදිසි හා කිරියත් පද ද" යන තන්හි 'ඇ' සදින් අනිෂ්ට මධ්‍යස්ථ ශබ්දප්‍රකෘති හා කිරියත්පද ද ගත යුතු සි. ක්‍රියාවක් අර්ථ කොට ඇති ආඛ්‍යාත පද 'කිරියත් පද' සි.

එසින් ඉෂ්ටශබ්දප්‍රකෘතීහු නම් බුද්ධාදිරත්නත්‍රය– දෙවතා වාචක ශබ්ද හා සුන්දරාර්ථවාචකශබ්දයෝ ද වෙත්.

"සුව සිරි පින් සුබ – සුසිරි සතුටු අම බද,
දිය විැඩ නඳන් සොම්නස්–පිවිතුරු වෙසෙස් යාපත්"

යනුවෙන් ලකුණුසරෙහි සුන්දරාර්ථවාචක ශබ්දයෝ දක්වන ලදහ. එහි ම:—

"නො සුබ නොසිරි අකුසල් – පව් දුසිරි නොසතුටු,
නැසුම් දෙම්නස් අවැඩ – පීඩා මරණ දුක් හා.
සුද ගිනි තල රුදුරු – සෙන ගුවන් වලබාමුව,
නරක රකුස් බූ පිසස් – සැව සැඩොලවමගුල් යක්"

යනාදින් අනිෂ්ටාර්ථවාචක ශබ්දයෝ ද,

"දෙනේ දේ රුකෝ – පිහිටා ඉවා සුවටා,
බබුලුවා සඳ සොඳ – පැහැදේ බෙජේ තිර වේ"

යනුවෙන් ඉෂ්ටක්‍රියාපදයෝ ද දක්වන ලදහ.

## ගීලකුණු.

**8. නෙවෙන් ඇරින් වසමැ - යති පෙර අඩෙහි විසිමත්,**
**පසඩෙහි දෙවිසි මත් වෙ ද-ගී ලකුණු වේ හෙ මෙසේ.**[1]

මරණ වධ බන්ධන රොදනාදි අනිෂ්ටාර්ථ ඇති ක්‍රියා පදයෝ අනිෂ්ටයෝ යි.

අනිෂ්ටාර්ථවාචකශබ්ද ශුභකාව්‍යයන්ගේ ආදියෙහි නො ම යෙදිය යුතුයි. යෙදුව හොත්, අක්ෂර ගණ ආදිය කොතරම් ශුභ වුවත්, අනිෂ්ට ඵල ම උපදී. ඉෂ්ටාර්ථ වාචක පදයක් ආරම්භයෙහි යෙදූ විට අනිෂ්ටාක්ෂර අනිෂ්ටගණ යෙදීමෙන් වන සියලු දොෂ දුරු ව ශුභඵල ම උපදී. ඒ බව භාමහාචාර්‍ය්‍යයන් විසින් ද-

"දෙවතාවාචකාඃ ශබ්දා යෙ ච භද්‍රාදිවාචකාඃ,
තෙ සර්‍වෙ නෛව නින්ද්‍යාඃ ස්‍යුර්ගණතො ලිපිතො'පි වා"

යනුවෙන් කියන ලදී.

ඉෂ්ටානිෂ්ටාක්ෂර විභාගය **සිදත්සඟරාවෙන්** දත යුතු යි.

**සංඥාවිධිය සමාප්ත යි.**

—— × ——

**8. අර්ථ:**- විෂමපාදයන්හි (මාත්‍රා) නවයකින් ද, එකොළොස කින් ද (පාදාන්ත) යතිය වේ ද, පූර්වාර්ධයෙහි මාත්‍රා විස්සක් වේ ද, පශ්චිමාර්ධයෙහි මාත්‍රා දෙවිස්සක් වේ ද, ඒ ගීති (නම් වෘත්ත යෙහි) ලක්ෂණයි. ඒ මෙසේ යි (=නිදසුන් මෙසේ යි):—.

**"පෙර මඟ බලා අප - නියැලුනු[2] සේ කිය කියා,**
**තොප මෙ තුනු[3] දවස දවස - ගියරමෙහි සේ සේ වේ**[4]

මේ පද්‍යයෙහි යට කී ලක්ෂණ ඇතිබව මාත්‍රා ගැණ බැලීමෙන් දත හැකි වේ. ගුරු-ලඝු ඇඳ ගැණීම කාට වුවත් අපහසු නො වන හෙයින් ඒ සඳහා කාලය ගත කරන්ටත් පොතෙහි ඉඩ වැඩි කරන්ටත් උත්සාහ නො කරමු.

**විස්තර:**— විෂමපාද නම් පළමුවැනි තුන්වැනි පාද යි. පූර්වාර්ධය නම් පළමුවැනි දෙවෙනි පාද දෙක යි. ගීතිවෘත්තයෙහි පූර්වාර්ධයෙහි මාත්‍රා විස්සකි. "නෙවෙන් ඇරින් වසමැ"යි කී හෙයින් එයින් මාත්‍රා නවයක් ප්‍රථමපාදයට බෙදේ. එහෙයින් ඉතිරි මාත්‍රා එකොළොස ද්විතීයපාදයට අයත් වේ. තෘතීයපාදයෙහි ද මාත්‍රා

1 පසඩෙහි දෙවිසිමත්නෙන් ගී වේ ලකුණු හෙ මෙසේ.
2 නිසලනු. 3 තුබු. 4 සෙන්නේ වේ.

එකොළොසකි. අපරාර්ධයෙහි මාත්‍රා දෙවිස්සක් යෙදෙන හෙයින් චතුර්ථපාදයට ද මාත්‍රා එකොළොසක් ම වේ.

{ 1. පාදයෙහි මාත්‍රා 9; 2. පාදයෙහි මාත්‍රා 11 =මාත්‍රා 20 }
{ 3. පාදයෙහි මාත්‍රා11; 4. පාදයෙහි මාත්‍රා 11 =මාත්‍රා 22 }

මාත්‍රා සඞ්ඛ්‍යාව මිස අතික් ගුරු-ලඝු නියමයක් නො කළ හෙයින් මෙහි ප්‍රථමපාදයෙහි මාත්‍රා නවය පස් පණස් අයුරකින් යෙදිය හැකි වේ. සෙසු එක් එක් පාදයක් මාත්‍රා එකොළොස බැගින් ඇති හෙයින් එක්සිය සිව්සාළිස් අයුරකින් යෙදිය හැකි යි. මතු දක්වනු ලබන මාත්‍රා ඡන්දස් ප්‍රස්තාරවිධිය ඉගෙණ නවමාත්‍රච්ඡන්දස හා එකාදශමාත්‍රච්ඡන්දස ද ප්‍රස්තාර කර බැලූ කල යට කී සේ පස් පණස් අයුර හා එක්සිය සිව්සාළිස් අයුරත් පැහැදිලි වේ. එසේ නොයෙක් අයුරින් යෙදිය හැකි වුවත් ශ්‍රැති සුඛය නොනැසෙන පරිදි යෙදිය යුතු යි.

ඒ ඒ පාදයන්ට අයත් භෙද එකිනෙක ගුණ කිරීමෙන් විරිත් පිළිබඳ භෙද සඞ්ඛ්‍යා ලැබේ. මෙහි ප්‍රථමපාදයෙහි භෙද පස් පණසකි. එය ද්විතීය පාදයෙහි භෙද සඞ්ඛ්‍යාව වූ එක්සිය සිව්සාළිසෙන් ගුණ කළ විට (55 × 144=7920) හත්දහස් නවසිය විස්සක් ප්‍රභෙද පූර්වාර්ධයෙහි ලැබේ. එසේ ම තෘතීයපාදයෙහි භෙද එක්සිය සිව්සාළිස චතුර්ථපාදයෙහි භෙද එක්සිය සිව්සාළිසෙන් ගුණ කළ විට ද්විතීයාර්ධයෙහි භෙද (144 × 144=20736) විසිදහස් හත්සිය සතිසක් ලැබේ. ප්‍රථමාර්ධභෙද හා ද්විතීයාර්ධභෙද එකිනෙක වැඩි කිරීමෙන් (7920 × 20736=22049120) දෙකෝටි විසිලක්ෂ හතළිස් නවදහස් එකසියවිස්සක් භෙද ලැබේ. මේ සඞ්ඛ්‍යාවෙන් වනාහි මේ පාද සතර වෙන් වශයෙන් ගත් විට යෙදිය හැකි ආකාර කොතෙක් දැ යි දක්ව යි. ප්‍රථමපාදයෙහි මාත්‍රා නවය ප්‍රස්තාර කිරීමෙහි දී මුලට යෙදෙන '– ◡ ◡ ◡ ◡' යන ලක්ෂණ ඇති වෘත්තය සමග ඊ ළඟ පාදයට නියත මාත්‍රා සඞ්ඛ්‍යාව යෙදිය හැකි සියලු ආකාරයෝ ම යෙදෙත්. එසේ ම ප්‍රථමපාදයට නියත මාත්‍රා නවය ප්‍රස්තාර කිරීමෙහි දී ලැබෙන දෙවෙනි පෙළ වූ '◡ – ◡ ◡ ◡' යන්න සමග ද ද්විතීය පාදයෙහි භෙදයෝ යෙදෙත්. මෙලෙසින් ම සෙස්ස ද සිතිය යුතු යි. මෙසේ මිශ්‍ර වීම නිසා ඒ සා මහත් භෙද සඞ්ඛ්‍යාවක් ලැබේ.

ගීතිච්ඡන්දස අර්ධවශයෙන් ගෙණ ප්‍රස්තාර කරන්ට ය යි නියම කාරණ හෙයින් අර්ධවශයෙන් ගත් කල ප්‍රථමාර්ධයෙහි මාත්‍රා විස්සක් ඇති හෙයින් මාත්‍රා විස්සක් ඇති ඡන්දසට නියත සියලු වෘත්ත ම ප්‍රථමාර්ධයෙහි යෙදේ. එනම් (10946) දසදහස් නවසිය

9. වසම්හි අටමත් – සමසෙදේ ඇර තුදුරෙන්,
මනෙක්හලිනි බඳුයේ – පියුම් නම් වේ හෙ මෙසේ

10. වසම්හි අට මත් – සෙමෙ අට තෙළෙස් මත් වූ,
සත්හිස් මතින් මත්වල – හි වේ දනු හෙ මෙසේ.

---

හතළිස් හයකි. එසේ ම අපරාර්ධයෙහි (28657) විසිඅට දහස් හසිය පණස් සතකි. මේ පූර්වාර්ධ අපරාර්ධභෙද මිශ්‍ර වීමෙන් ලැබිය හැකි භෙද සංඛ්‍යාව පූර්වාර්ධ අපරාර්ධභෙද එකිනෙක ගුණ කිරීමෙන් දතහැකි වේ.

සෙසු ගීවිරිත්හි ද භෙද සංඛ්‍යා මේ ක්‍රමයෙන් ම දතයුතු සි.

**9. අර්ථ:—** විෂමපාදයන්හි මාත්‍රා අටබැගින් ද සමපාදයන්හි (=2, 4 වැනි පාදයන්හි) (ඇරතුදුරෙන්) එකොළොසකින් හා චතුර්දශයකින් දූ සි (මෙසේ සතරපාදයෙහි) මාත්‍රා එක් සාළිසකින් (41 න්) බඳනාලද්දේ පියුම් නම් වෘත්තය වේ. ඒ මෙසේ සි:—

උදාහරණ:—

"ළෝ සියලු ම දෙය [1]-මන දී බලන අයු'නා,
මෙ වන්මන ද වණ-සාහන සුව සන්න ගින් [2] දුක්ද"

විස්තර:—

{ 1. පාදයෙහි මාත්‍රා 8; 2. පාදයෙහි මාත්‍රා 11–19 }
{ 3. ,, ,, 8; 4. ,, ,, 14=22 } =41

මෙහි ද ගුරු ලඝු නියමයක් නො කළ හෙයින් ඒ ඒ පාදයන්ට නියත මාත්‍රාසංඛ්‍යා නො ඉක්මවා කැමැති සේ ගුරු ලඝු යොද බැන්ද හැකි සි. මතු දක්වනු ලබන සංඛ්‍යාන ප්‍රත්‍යයයෙන් ඒ ඒ පාදයන්හි හෝ අර්ධයන්හි භෙද සංඛ්‍යා සොයා ඔවුන් එකිනෙක ගුණ කිරීමෙන් වෘත්තයෙහි සියලු භෙද දත හැකිසි.

**10. අර්ථ:—** විෂමපාදයන්හි මාත්‍රා අට බැගින් ද, සම පාදයන්හි මාත්‍රා අටක් හා තෙළෙසක් දූ සි මාත්‍රා තිස්සතරකින් යුක්ත වූයේ මත්වල හි වේ ය සි ජානනය කරණු. උදාහරණ මෙසේ සි.

**විස්තර:—** මෙහි 1– 2– 3 වැනි පාදයෝ මාත්‍රා සංඛ්‍යාවෙන් සම වෙත්.

---

1. සියලු මේ හෙදු. 2. මෙවත් මනුකරණ ගයන සිය සන්තාසින්.

11. වසම්හි නව නව - සෙමෙහි දස දස මත් වූ,
අටතිස්මතින් බැඳියේ - උමතුගී නම් හෙ මෙසේ.

12. වසම්හි මත් නෙවන්-දෙසන් සෙමෙහි දසෙ සොළොස්,
සතළිස් මතින් බඳහොත්-සාවි නම් මෙ වේ නිදසුන්.

13. වසමැ අට දස මත්-සෙමෙහි දු ඇර තෙළෙසින්,
ගෙතූ බතළිමත්තෙන්-බමරගී නම් හෙ මෙසේ.

---

සිව්වැනි පාදයෙහි පමණක් මාත්‍රා දහතුණකි නිදශිතː—

"අඟන් රඟ වහල - ඩාපුන් වුවනත්,
නහමා සොමලග - මල මත මම කෙසේ දෙන්නෙම්" 1

11. අර්ථ:— විෂමපාදයන්හි මාත්‍රා නවය බැගින් ද, සම පාදයන්හි මාත්‍රා දසය බැගින් දූ යි මාත්‍රා තිස් අටකින් බඳනා ලද්දේ උමතුගී නම් වෘත්තයයි. නිදශීත මෙසේ යිː—

"පට වැරලි හන්නෙම් - සරඟ මල් පලන්නෙම්.
මන සා නො ගන්නෙම් - නටන්නෙම් වයන්නෙම්"

උදහරණ ගීයෙහි එළිසම්යක් පෙනෙන නමුත්, එළි සම කට යුතු ය යි සූත්‍රයෙහි නො කී හෙයින්, මෙහි එය අනවශ්‍ය ය.

මෙහි අඩි දෙක ම මාත්‍රා සඞ්ඛ්‍යාවෙන් සමාන වේ.

12. අර්ථ:— විෂමපාදයන්හි මාත්‍රා නවයකින් හා දශය කින් ද, සමපාදයන්හි මාත්‍රා දශයකින් හා එකොළොසකින් දූ යි (මුළුල්ලෙහි) මාත්‍රා සතළිසකින් බඳනා ලද වෘත්තය සාවිගී නම් වේ. නිදශීත මෙසේ යිː—

"පනල ගහුල් සැලඹි-අඳුරු සවස් අඹියෙස්,
හමල බොල් තුරු තෙළෙන්-සර මැසි නැති සාවරනට."

13. අර්ථ:— විෂමපාදයන්හි මාත්‍රා අටකින් හා දශයකින් ද, සමපාදයන්හි මාත්‍රා එකොළසකින් හා තෙළෙසකින් දූ යි මාත්‍රා දෙසාළිසකින් ගොතන ලද්දේ බමරගී නම් වේ. උදහරණ මෙසේ යිː—

"දූසා සාල පත හිගු-වැළි යන රතු'පුල දෙදෙ,
සනාරෙසෙනද නුවන්-නිල්බැමලේ ම. සඳහන් වී."

---

1. අහාරගවතිව - ඩා පුන් වූව වත්,
ශ්‍යාමා දූන් ලඟ - මල මහරම කොයේ දීත් රම.

14. නවෙකොළොස් වසමැ-එකොළොස බැගින් සෙමෙහි,
ලුහු බහළින් බඳුයේ-ශාගී ය මෙ නිදසුන්.

---

14. අර්ථ:— 1. 3 වැනි පාදයන්හි මාත්‍රා නවයකින් හා එකොළොසකින් ද, 2. 4 වැනි පාදයන්හි එකොළොස බැගින් ද යි (සිව්පදයෙහි) ලඝු අක්‍ෂර දෙසාළිසකින් බඳනාලද්දේ ශා ගී නම් වෘත්තය යි. නිදර්ශන මෙසේ යි:—

"කුසනිරිඳු එදවස - පිවිතුරු උයනනට වැද,
වැජඹ වසන ගුණමුහුදු - නො මඳ දියනට සෙන දිනි."1

විස්තර:— ගී විරිතෙහි හා මේ විරිතෙහිත් ලක්‍ෂණ එක්සම නො වේ ද? යත්.— සර්වප්‍රකාරයෙන් සම නො වේ. ඒ ඒ පාද යන්ට අයත් මාත්‍රාසංඛ්‍යාව වෘත්ත දෙකෙහි ම සමාන ය. එහෙත් ගී විරිතෙහි ගුරු ලඝු මිශ්‍ර කොට යෙදිය හැකි වුවත්, මේ වෘත්ත යෙහි ගුරු අකුරු යෙදිය නො හැකි ය. 'ලුහු බහළින්' යි කී හෙයින් සතරපාදයට අයත් මාත්‍රා දෙසාළිස ලුහු අකුරු දෙසාළිස කින් ම යෙදිය යුතු ය. ගී විරිත සර්වගුරු වෘත්තයක් හෝ ගුරු ලඝු මිශ්‍ර වෘත්තයක් වන අතර යහ ගී විරිත සර්වලඝුවෘත්තයක් ම වේ. මේ මෙහි වෙනස යි.

ඇතැම්හු 'ලුහු' යන්නට 'මාත්‍රා' යි අර්ථ කියති. එහෙත් මේ පොතෙහි මේ ගීයෙහි හා අනන්තර ගීයෙහිත් යෙදුනු 'ලුහු' යන්න ම මිස 'මාත්‍රා' යි අර්ථ කී අනික් 'ලුහු' ශබ්දයක් නැත. අනන්තර ගීයෙහි 'ලුහු' යන්න ද කාලාන්තර සඤ්ජාත දෝෂ යෙකි. 'ලුහු' යන්නට 'මාත්‍රා' යි අර්ථ කියතොත් ගී, යහගී දෙක්හි භෙදයක් ද නො පෙණේ. ගී විරිතට නිදර්ශන කළ ගීය බලා එහි පෙණෙන චිතීය, තෘතීය පාදාන්ත යමකය ම ගීවිරිත යහගීවිරිතෙන් වෙනස් කරණ ලකුණකැයි කිය හැකි වුව ද සූත්‍රයෙහි එබන්දක් නො කී හෙයින් ඒ ද ප්‍රතිඥාරහිත ය. එහෙයින් 'ලුහු' යන්නට 'මාත්‍රා' යි අර්ථ කිම නුසුදුසු ය. මීට දැක්වූ නිදර්ශනයෙහි ද සියලු අකුරු ලුහු විය යුතු යි.

---

1. "කුසා සුරිඳෙදවස් - පිවිතුරු උයන් තොට වර
වැජඹිවසනමහමුහුදු-නොමඳ දියනට සෙන්දේ."-මුද්‍රිත.

15. නවෙකොළොස් විසමැ-ඇරින් තෙරින් සෙමෙහි දු,
සිවුහල්මතින් බඳ හොත් *-දුවගගී මෙ වේ නිදසුන්.

16. අටින් දසෙන් විසමැ-ඇරිනෙකොළොසින් සෙමෙහි,
සමහල්නි බඳ යොන් ගී-නමින් පළ වේ හෙ මෙසේ.

17. විසම්හි අට නවෙ-කොළොසින් තෙරින් සෙමෙහි.
ලුහු පස්විසි අටගුරින්-බඳ කාරිකා හෙ මෙසේ.

---

15. අර්ථ– විෂමපාදයන්හි මාත්‍රා නවයකින් හා එකොළොස කින් ද, සමපාදයන්හි මාත්‍රා එකොළොසකින් හා තෙළෙසකින් දැයි මාත්‍රා සිවුසාළිසකින් යුක්ත කොට බැන්දෙත් ද්වගගී යි උදහරණ මෙසේ යි:—

"පැලඹි කල්පහස – බඹලොවිනා මහත්හු දු,
පිරිහුනුහු හා! දැහැනෙන්†–අන්දනනතුරෙ හා! කෙවදන්?"

16. අර්ථ:— විෂමපාදයන්හි මාත්‍රා අටකින් හා දශයකින් ද, සමපාදයන්හි එකොළසකින් හා එකොළොසකින් දැ යි මාත්‍රා සම සතළිසකින් බඳනා ලද්දේ යොන් ගී නමින් ප්‍රකට වේ. නිදර්ශන මෙසේ යි:—

"බඹා යදුන් ගෙණ – හිය ගේ සතන් පිළිපන්,
දියට සෙනට සැහැසි – මහබා නට දිය දෙනේ."

17. අර්ථ:— විෂමපාදයන්හි මාත්‍රා අටකින් හා නවයකින් ද, සම පාදයන්හි එකොළසකින් හා දහතුණකින් දැ යි (සිවුපද යෙහි) ලඝු විසිපහකින් හා ගුරු අටකින් ද බඳහොත් කාරිකා නම් ගීය වේ. නිදර්ශන මෙසේ යි:—

"සැදූ සපන් බිසා – පිරිහුනු උදකළා වූ,
මහල්නාකම ද – පරළ කරලු වැනි වියත් කම්."

විස්තර:– මෙහි කියනලද ගුරු අකුරු අට පාද සතරට සම සේ බෙදා යෙදිය යුතු යි එවිට එක්පාදයෙක්හි ගුරු දෙකකට වඩා නො සිටී. උදාහරණ ගීයෙහි ද එක්පාදයෙක්හි ගුරු දෙකකට වඩා නැත. ඒ ගුරු අකුරු යෙදිය යුතු තැන් නියම නො කළ හෙයින් කාව්‍යකතෘහුගේ කැමැත්ත සේ යෙදිය හැකි ය. එහෙයින් අෂ්ට මාත්‍රාවර්ජනයෙහි විගුරුවෘත්ත පසළොසින් යම් කිසි වෘත්තයක් මුලට ද, නවමාත්‍රාවර්ජනයෙහි විගුරුවෘත්ත විස්සෙන් යම් කිසි වෘත්තයක් ඊලඟට ද, ඒකාදශමාත්‍රාවර්ජනයෙහි විගුරුවෘත්ත පන් තිසෙන් (35 න්) යම් කිසිවක් තෙවැන්නට ද, ත්‍රයෝදශමාත්‍රාවර්ජනයෙහි විගුරුවෘත්ත සපණසෙ (56) න් එකක් සිවුවැන්නට ද යෙදිය හැකි යි. මෙයින් ම මේ වෘත්තයෙහි භෙදසංඛ්‍යාව දත යුතු යි.

---

* ලුහු සිවල්නෙන් බඳ හොත්. † රජනෙන්.

18. දියුණු ඇ'වසන් - සදින් යුතු මෙ ම ලකුණෙන්,
දකුණු වම් තොහොළ් ගී - නිදසුන් එයට මේ වේ.

19. පෙදෙන් පෙදෙ පිරියන - අකුරු ඩැහැ * පද නැගෙ නම්,
බහල්මත් ඇ† ලකුණු - දනු සඳහට හෙ මෙසේ.

---

1 වැනි පාදයෙහි හෙද 15 කි. 2 වැනි පාදයෙහි හෙද 20 කි.
3 වැනි පාදයෙහි හෙද 35 කි. 4 වැනි පාදයෙහි හෙද 56 කි.

මේ එකිනෙක ගුණ කිරීමෙන් මුළු වෘත්තයෙහි හෙද (15 × 20 × 35 × 56=5,88,000) පන්ලක්ෂ අසූඅට දහසක් ලැබේ.

18 අර්‍ථ:— දියුණු වූ හෙවත් දෙවරක් යොදනලද ආදි ශබ්දයෙන් හා අවසාන ශබ්දයෙන් ද මේ (කාරිකා) ලක්‍ෂණයෙන් ද යුක්ත වූයේ දකුණුතොහොළ්ගී, වම්තොහොළ් ගී නම් වේ.

**විස්තර:**— දකුණු තොහොළ් ගීයෙහි ආදිශබ්දය හෙවත් ප්‍රථමපාදයෙහි මූල ශබ්දය විත්ව කටයුතු යි. අවසානශබ්දය හෙවත් චතුර්‍ථපාදයෙහි අනන්‍තිමශබ්දය විත්ව වන්නේ වම් තොහොළ් ගියෙහි ය. "මෙම ලකුණෙන්" යි කියනලද්දේ කාරිකා ලක්‍ෂණ උදෙසා ය. එහෙත් කාරිකාවට කී සියලු ම ලක්‍ෂණ තොහොළ් ගීයෙහි නොයෙදෙන බව පෙණේ. මේ දෙක සමාන වන්නේ මාත්‍රාසංඛ්‍යාවෙනි. ගුරු ලඝු සංඛ්‍යාවෙන් සම නො වේ.

(1) දකුණුතොහොළ්ගීයට නිදසුන්:—

"පිනිපිනිනද ලඳ - ලිය ගැම්මෙනෙන මඳ පවන්,
මුවරඳ ගෙණ මමන - මමන තැබිය නුවර නුබු නම්" †

(මෙහි ප්‍රථමපාදදියෙහි 'පිනි පිනි' යන යමකය ද කාරිකාවෙහි මෙන් මාත්‍රා සඛ්‍යාව ද පෙණේ.)

(2) වම්තොහොළ්ගීයට නිදසුන්;—

"පවතු සිකි සඳ - සියන් නද දූන් කල ‡ සෙ ව,
පැනට මහවන තුඹු-කලෙහි නො කලේහි නො කලේහි."

(මෙහි අනන්‍තිමපාදයෙහි අවසාන ශබ්ද විත්ව වී ය.)

19. අර්‍ථ:— පදයෙන් පදයෙහි (පාදයක් පාසා) අක්‍ෂරයන් දෂට කොට පද නැගේ නම්, දෙසාළිස් මාත්‍රා ආදි ලක්‍ෂණ ඇති ඒ වෘත්තය සඳැෂටක යි දත යුතු යි. උදාහරණ මෙසේ යි:—

---

* ඩැඩැ. † මමත තිබියුනුවරැ තිබෙනම්. ‡ පෙර.
‡ පියන්සාල දූන් කළ.

20. සගණ දගණ ගුරු – ලුහුනෙන් නබ දෙගණෙන්,
දෙලුහු ද සගණලුහු – සගණෙන් යලි දු ලුහු වෙ ද.[1]
21. ඇරැ ස අට පසින් – යති හා කොමල පද වත්,
නළඟි නමැයි දන්නේ – නිදසුන් එයට මේ වේ.

---

“රජ පැමිණි බෝසත් – සත් රජුනෙඬි මැඩ විසි,
විසි නමා කර කලෙ‘ක – කලෙක දසරජ දම්නෙන්.”

**විස්තර,**— ‘සන්දෂ්ට’ යනු එක්තරා ශබ්දාලඞ්කාරයක් වූ යමක විශෙෂයෙකි. පළමුවනපාදයෙහි අග පදය හෝ ඊට අයත් කොට සක් දෙවෙනිපාදයෙහි මූල ද, දෙවෙනිපාදයෙහි අගවචනය හෝ එහි කොටසක් තෙවෙනි පාදයෙහි මූල ද, තෙවෙනිපාදයෙහි අගවචනය හෝ එහි කොටසක් සතරවැනිපාදයෙහි මූල ද යොදා බඳනා ලද්දේ සන්දෂ්ට යමක නම් වේ. යට දක්වූ උදාහරණ යෙහි එය පැහැදිලි ව පෙණේ. මේ සන්දෂ්ටයමකය තමන්ට කැමැති වෘත්තයක යෙදිය හැකි යි. අසවල් වෘත්තයෙන් ම බැඳිය යුතු ය යි නියමයක් නැත. එහෙයින් ම “බහල්මත් ඇලකුණු” යි කියන ලදී. මෙහි ආරම්භයෙහි ම දක්වූ ගීවිරිතට මාත්‍රා දෙසාළිසකි. එහෙයින් ගීවෘත්තය ආදි කොට ඇති ඕනෑ ම වෘත්තයකින් මෙය බැඳිය හැකි යි. මෙහි එක ම ලක්ෂණය නම්, පෙදෙන් පෙදෙ පිරියත අකුරු ඩැහැගෙණ පද නැගීම යි. සංස්කෘතඡන්දසෙහි ශබ්දාලඞ්කාරලක්ෂණ වෘත්තලක්ෂණ හා මිශ්‍ර කොට නො කියනලද නමුදු සිංහලඡන්දසෙහි සමහර ශබ්දාලඞ්කාරලක්ෂණ ද කියනලදී. තොහොල්ගී ලකුණු ද ශබ්දාලඞ්කාරය ප්‍රධාන කොට ඇත්තේ ය. ඡන්දසට අයත් නුවූ ද ශබ්දාලඞ්කාර ඇතුළත් කොට වෘත්තලක්ෂණ දක්වන ලද්දේ බොහෝ සිංහලකවීන් ශබ්දාලඞ්කාරයට විශෙෂ ආදරයක් දක්වනලද හෙයිනැයි සිතිය හැකි ය. නො එසේ නම්, වෘත්තලක්ෂණයන්ට ශබ්දාලඞ්කාර ඇතුළත් කිරීමට යුක්තියක් නැත. ඒ ඒ පාදයන්හි මාත්‍රා, වර්ණ, ගුරු, ලඝු පිරිසිඳ දක්වීම පමණක් ම ඡන්දොග්‍රන්ථකාරයාට අයත් වේ.

**20–21.** අර්ථ:— සගණ, දගණ, ගුරු, ලුහු යන මෙයින් පර වූ නගණ බගණ දෙකින් පර ව ලඝු දෙකක් වේ ද, (නැවත) සගණයක් හා ලඝුවක් වේ ද, (නැවත ද) සගණයක් හා ලඝුවක් වේ ද, (21) මාත්‍රා එකොළොසකින් හා සයකින් ද, අටකින් හා පසකින් ද, (පාදාන්ත) යතින් වේ ද, කොමල පද ඇති ඒ වෘත්තය නළඟී නමැයි දතයුතුයි.

---

1. ලුහුනෙන්.

**22. ද බ දෙ ගෙණෙන් දෙමත් – කොමල පද සමඅත්[1] වූ,**
**සසපුළුතු ගී නම් වේ – නිදසුන් මෙසේ දන්නේ.**

---

විස්තර:— මෙහි පාද සතරෙහි ම ලක්ෂණ මිශ්‍ර කොට කියන ලද බව පෙණේ. පාද සතරෙහි ම ගුරුලඝු වින්‍යාසය මෙසේ යි:-

| සගණ | දගණ | ගුරුලුහු | තගණ | බගණ |
|---|---|---|---|---|
| – – ⏑ | – ⏑ – | ⏑ – | – – – | ⏑ – – |

| ලුහු2 | සගණ | ලුහු | සගණ | ලුහු |
|---|---|---|---|---|
| – – | – – ⏑ | – | – – ⏑ | – |

මෙහි පාද වෙන් කර ගැණීම සඳහා යතිස්ථාන වෙන් කොට දක්වන ලදී. එසේ හෙයින් තළුගීයෙහි ප්‍රථමාර්ධයෙහි මාත්‍රා සතළොසක් (17) වේ. ප්‍රථමාර්ධයෙහි ගුරු ලඝු මෙසේ යෙදේ:—

| 1. පාදය. මාත්‍රා 11 | 2. පාදය. මාත්‍රා 6 | |
|---|---|---|
| – – ⏑ – ⏑ – ⏑ – | – – – ⏑ – – | (=11 + 6=17) |

ද්විතීයාර්ධයෙහි මාත්‍රා තෙළෙසක් වේ. ඒ යෙදෙන්නේ මෙසේ යි:—

| 3. පාදය. මාත්‍රා 8 | 4. පාදය. මාත්‍රා 5 | |
|---|---|---|
| – – – – – ⏑ – | – – ⏑ – | (=8 + 5=13) |

ලක්ෂණ කථනයෙහි පාද සතර මිශ්‍ර කොට කියන ලද නමුත් යතිස්ථාන වෙසෙසා දැක්වූ හෙයින් ඒ තැන් දූත පාදාන්තයතිය තැබිය යුතු යි. මේ වෘත්තයෙහි භේදයක් නො ලැබේ. පාද සතරෙහි ම ගුරුලඝුස්ථාන නියත හෙයිනි.

උදාහරණ මෙසේ යි:—

“සිකි කැන් විඳු සඳුය – නලමඳුය,
සුවඳඹ සඳුය – නො මඳුය.”

**22.** අර්ථ:— දගණ බගණ දෙකින් පර ව මාත්‍රා දෙකක් වේ ද, සමාන අන්ත ඇති කොමල පද යුක්ත වූ ඒ වෘත්තය **සසපුළුතු ගී** නම් වේ.

නිදසුන් මෙසේ යි:—

**“මඳු සඳු අද විල් – සඳු සඳු සිකි කල්.**
**සඳු සඳු සකිපිල් – සඳු සඳු මැසි කල්.**

---

1. සැම යුත්. යහයුත්.

23. විසම්හි අට නව – සෙමෙහි දු ඇර බව්නෙන්,
සම එළි කොට්න් බඳහොත්–උනුවිලඹු නම් ගෙ මෙසේ.

24. විසමැ අට එකොළොස් – සම පෙදෙහි ඇර බව්නෙන්,
සම එළි කොට්න් බැඳියේ – ගජගැමි නමැයි දන්නේ.

---

**විස්තර**:— මෙහි ලක්‍ෂණ කියන ලද්දේ එක් පාදයක පමණකි. එය චතුරාවෘත්ත කළ විට පද්‍යය සම්පූර්ණ වේ. මෙහි එක් එක් පාදයක් කොටස් දෙකකට බෙදිය හැකි ය. එයින් පළමුවන කොටස නිත්‍යයෙන් ම – ◡ – ◡ – – මෙසේ සිටී. දෙවෙනි කොටස එක් ගුරකින් හෝ ලඝු දෙකකින් යුක්ත විය හැකි බැවින් එහි භෙද දෙකක් ලැබේ. එහෙයින් පාද සතරෙහි භෙද සොළසක් වේ.

මෙය සුපිහිටි නම් සිව්පද ඡන්දසට අයත් වෘත්තයක් වුවත් 'ගී' නාමයෙන් හඳුන්වනු ලබන හෙයින් මේ ගී කාණ්ඩයෙහි ම යොදන ලදී.

**23. අර්ථ**:— විෂමපාදයන්හි මාත්‍රා අට නවය බැගින් ද සම පාදයන්හි එකොළොස බැගින් ද ලා එළි සම කොට බැන්දෙත් උනුවිලඹු නම් විරිත වේ. නිදසුන් මෙසේ යි:—

"විදමිනි සිකි පිල් – තුඟුතුරැ මන නැසි[2] සැ ල්
නරංග සුසැදි වල්[3]– වනන්ට වෙ[4] සඳුළු මු ල්"

**24 අර්ථ**:— විෂමපාදයන්හි මාත්‍රා අට, එකොළොස බැගින් ද, සමපාදයන්හි මාත්‍රා එකොළොස බැගින් ද ලා එළි සම කොට බඳනාලද්දේ ගජගාමි නමැයි දත යුතු යි.

උදාහරණ මෙසේ යි:—

"නුවණනිසයු රෑ – විනේ කුමුදු නිසයු රා
කෙලෙස් තුසර දිවයුරා – බව දුකුලැවග අයු රා"

**සංලක්‍ෂ්‍ය**:— උනුවිලඹු, ගජගැමි යන මේ වෘත්ත දෙක හැම පොත්හි ම පෙණෙන්නේ සිව්පද කොටසෙහි පිහිටි නම් ඡන්දස්හි ය. එසේ වුවත් මේ විරිත් දෙක පිහිටි ඡන්දසට ඇතුළත් කළ නො හැකි ය. පිහිටි ඡන්දසට අයත් වෘත්තයක මාත්‍රා අටකට වඩා නො සිටී. එවිට පාදසතරෙහි මාත්‍රා දෙතිසකට වඩා නො ලැබේ. එහෙත් මේ විරිත් දෙකෙහි ම පාදසතරෙහි මාත්‍රා අටතිසකටත් වැඩි ය. සිව්පද කොටසෙහි අතික් කිසි ම තැනක

---

1. සැම යුත්. යහයුත්. 2. ම සැනසී. 3. විල්. 4. වී.

මෙබන්දක් නො පෙණේ. එළිසමය පෙණෙන හෙයින් මෙය සිව්පද කොටසට කියිවෙකු විසින් ඇතුළත් කරණලද සි සිතිය හැකි ය තළගී, සඤපුලූතුගී විරිත්හි ද එළිසමය පෙණේ. ඒ දෙවිරිත ගිවලට ඇතුළත් නම්, මේ දෙවිරිත ද ගිවලට ඇතුළත් විය යුතු ය. එහෙයින් ම අප විසින් මෙතැන්හි යොදන ලදී.

විශෙෂයෙන් සැලකිය යුත්තක් නම් තළගී, සසපුලුතුගී, උනුවිලඹු, ගජගැමි යන විරිත් සතරෙහි ම සිව්පදයන්හි යෙදෙන සමගර ලක්‍ෂණ තිබෙන බව යි. ගී විරිත්හි ඡන්‍දොහෙතුවෙන් වන දීර්ඝත්‍වාදිය විරල ය. (කාව්‍යසිළුමිණෙහි සගාවසාන ගීවල එබඳු දීර්ඝත්‍වාදිය කරණලද්දේ ද එළිසමය වැනි යමකලක්‍ෂණ රකිනු සඳහා ම ය.) එහෙත් මේ වෘත්ත සතරට දැක්වූ උදහරණ යන්හි එළිසමය පමණක් නො ව එබඳු දීර්ඝත්‍වාදිය ද පෙණේ.

ගිලකුණු මෙතෙකින් අවසන් ය. කව්සිළුමිණ ආදියෙහි මෙහි නො දැක්වූ ගී විරිත්වලින් බැඳි පද්‍යයෝ පෙණෙත්. එළිසම කව්පොත්වල බෙහෙවින් පෙණෙන,

"සියපින් සිරින් ස රැ
දෙතිස් ලකුණෙන් විසිතු රැ
කෙලෙසුන් කෙරෙන් දු රැ
වදිම් මුනි උතුමන් තිලෝ ගු රැ"

යනාදිය ද එළිසම කොට බැඳි ගී විරිත් මැ යි. එහෙයින් මෙහි ලක්‍ෂණ නො කී තවත් ගිවිරිත් ඇතිබව දත යුතු යි. මෙහි කී ලක්‍ෂණයන්ට වෙනස් ලෙසකින් බැඳි පද්‍ය බලා දොෂාරොපණය කරන්ට ඉක්මන් නො විය යුතු යි. මේ පෙතෙහි අවසන්හි පෙණෙන "කොළ සුවහස් විරිත්" යනාදි ගිය ද බැලිය යුතු යි.

මෙහි දැක්වූ වෘත්තයන්ගේ සාමාන්‍ය ලක්‍ෂණ සැකෙවින් මෙසේ යි:—

1. සි– ම– බ– ශො– තො– උ– ග නම් – ගී පළමුපද අටමත්,
 සෙසු ගීහි එ ම පද – අටමත් සහිත වනුයේ.
2. මහි දෙවෙනි පෙදෙහි – අටෙකි උ–ක දෙක දසයෙකි,
 සෙස්සෙහි එකොළොස් මත් – බැයින් වේ ගී බැඳුමෙහි.
3. තෙවෙනිපද සි–ම 'වින්–උ– තො– උනුහි නවයෙන් වේ,
 කා–බ–යොන්හි දසයෙන් – ශී– ෂ– දු– ග වලෙ 'කොළොසින්.

**25. ගොමු පියාපත් සල - දලවුල් තිසුල් නැව්දද,
මෙ ඈ කිවින් පෙර බඳ - නියරින් ම සක් බඳනේ.**

---

4. උගි වසන් පෙදෙ දස - වේ පිහි තුදුස්මත්ති,
ම-බ-දු-තොහි මත් තෙළෙසින්-එකොළොස්මතින් සෙස්සෙහි.

5. යහ- කාරිකා- නළු- සසපුලුතුගී වෙසෙසින්,
ගුරුලුහු නියමින් ම වේ - සඳහටෙහි වේ අනියම්.

| වෘත්ත නාමය. | 1. පාදය. මාත්‍රා | 2. පාදය. මාත්‍රා | 3. පාදය. මාත්‍රා | 4. පාදය. මාත්‍රා | සියලු මාත්‍රා |
|---|---|---|---|---|---|
| 1. ගී | 9 | 11 | 11 | 11 | 42 |
| 2. පියුම්ගී | 8 | 11 | 8 | 14 | 41 |
| 3. මත්වලගී | 8 | 8 | 8 | 13 | 37 |
| 4. උමුතුගී | 9 | 10 | 9 | 10 | 38 |
| 5. කව්ගී | 9 | 10 | 10 | 11 | 40 |
| 6. බමරගී | 8 | 11 | 10 | 13 | 42 |
| 7. යහගී | ලුහු 9 | ලුහු 11 | ලුහු 11 | ලුහු 11 | 42 |
| 8. දුවහගී | 9 | 11 | 11 | 13 | 44 |
| 9. සොන්ගී | 8 | 11 | 10 | 11 | 40 |
| 10. කාරිකාගී | ලුහු4 ගුරු2. | ලුහු7 ගුරු2. | ලුහු5 ගුරු2. | ලුහු9 ගු2. | 41 |
| 11. තොහොල්ගී | 8 | 11 | 9 | 13 | 41 |
| 12. නළුගී | – –◡–◡–◡–/ | – – –◡ / | – – – – –◡–/ | – –◡– | 30 |
| 13. සසපුලුතුගී | –◡–◡– –2/ | –◡–◡– –2/ | –◡–◡– –2/ | –◡–◡– –2 | 40 |
| 14. උතුවිලඹුගී | 8 | 11 | 9 | 11 | 39 |
| 15. ගජගැමිගී | 8 | 11 | 11 | 11 | 41 |
| 16 සඳහටගී | ? | ? | ? | ? | ? |

'?' මේ ලකුණෙන් හඟවන්නේ මාත්‍රා සඞ්ඛ්‍යාව අවිනිශ්චිත බව යි. 2 අඞ්කයෙන් හඟවන්නේ මාත්‍රා දෙකක් යෙදිය යුතු බව යි.

**25. අර්ථ:—** ඉක්බිත්තෙන් ගොමූත්‍රිකා ය, පක්ෂපත්‍ර ය, ජාලාකුල ය, ත්‍රිශූල ය, නෞකාය, ධ්වජය යන මේ ආදි චක්‍ර පූර්වයෙහි කවීන් විසින් බඳනා ලද ක්‍රමයෙන් ම බැන්ද යුතු ය.

**විස්තර:—** ගොමූත්‍රිකාදිය ද ශබ්දාලඞ්කාර විශෙෂයෝ යි. ගවයෙකුගේ මූත්‍ර පාරක් සේ අකුරු පිහිටින ලෙස බඳනා ලද චිත්‍රය **ගොමූත්‍රිකා** නම්. පක්ෂපත්‍රය(=පියාපත)ක් සේ බඳනාලද්දේ **පක්ෂපත්‍ර** යි. සෙස්ස ද මෙසේ යි. ගොමූත්‍රිකාදි චිත්‍රබන්ධ කව් **සිළුමිණි** ආදියෙහි දක්ක හැකි ය, චිත්‍රයන්ගේ සඞ්ඛ්‍යා නියම

**26. ගී පෙර පසු දෙකඩ - දෙ ඳෙ පෙදෙහි වෙන වෙන,**
**සව්ගුරු විරිත් උපයා - වෙන වෙන කරවු ඒ පතර.**

---

යක් නැති හෙයින් ද, එයින් ඡන්දසට ප්‍රයෝජනයක් නැති හෙයින් ද ගොමුත්‍රිකාදි චිත්‍රලක්ෂණ නො දක්වමු. මෙහි 'ඈ' සඳින්, තොරණ, මඤ්ර, මෙරු, මාලා, කුසුම, හාර ආදි ප්‍රසිඩ වස්තූන්ගේ සටහන් සිටින සේ බඳනාලද චිත්‍ර ගැණේ. මේ චිත්‍ර බන්ධ මෙපමණක, මෙසේ ම කටයුතු ය, මේ වෘත්තයෙන් ම කට යුතු ය යන නියමයෙක් නැත. එහෙයින් පුරාතන කවීන් කළ චිත්‍ර බන්ධයන් බලා නමන් විසින් ම උගත යුතු ය. එහෙයින් සංස්කෘත කාව්‍යශාස්ත්‍රකාරයෝ ද "චිත්‍රං ස්වයමූහ්‍යම්" යනුවෙන් එය ම කිහ.

මේ චිත්‍රබන්ධයන් නිසා පද්‍යයන්ගේ අර්ථරසය විනෂ්ට වේ. එහෙයින් ආලඞ්කාරිකයෝ සියලු ම දුෂ්කරචිත්‍රබන්ධ කලිෂ්ටපද දෝෂයෙහි ම ලා සලකති. එහෙයින් චිත්‍රබන්ධකරණයෙන් ආධු නිකයන් වැලකිය යුතු යි.

—— × ——

දැන් ගීත්‍යාදි ලක්ෂණකථනයට අනතුරු ව ඡන්දස් සංඛ්‍යා ප්‍රස්තාරප්‍රත්‍යය දක්වනුවෝ "ගී පෙරපසු දෙකඩ" යනාදිය කියත්.

**26.** අර්ථ:— ගීයෙන් පූර්ව පශ්චිම අර්ධ දෙකෙහි වෙන් වෙන් වශයෙන් පද දෙකෙහි දෙකෙහි සර්වගුරු වෘත්තය සොයා වෙන් වෙන් වශයෙන් ඒ ප්‍රස්තාරය කරවු.

**විස්තර:**— 'ඒ පතර' යන්නෙහි අර්ථය 'ඡන්දශ්ශාස්ත්‍රයෙහි ප්‍රසිද්ධ වූ ප්‍රස්තාරය' යනු යි. 'ඒ' සඳ මෙහි ප්‍රසිද්ධාර්ථයෙහි ය. එසේ නො වතොත් මුලින් 'යම්' සඳ නොයෙදුනු හෙයින් සදෙස් වේ.

ගීතිවඡන්දස පිළිබඳ ප්‍රස්තාරයට අවශ්‍ය පළමුවන උපදෙශය මේ ගීයෙන් ප්‍රකාශ වේ. ගීතිලක්ෂණ කථනයෙහි දී පාද සතරක් දක්වන ලදී. එහෙත් ප්‍රස්තාරයෙහි දී එක් එක් පාදයක් වෙන් වශයෙන් නො ව පාද දෙකක් ම එක් කොට එක් පාදයක් වශ යෙන් ගෙණ ප්‍රස්තාර කට යුතුබව මෙයින් හැඟේ. සංස්කෘත වඡන්දශ්ශාස්ත්‍රයෙහි දී ආයර්‍යාඡන්දස ප්‍රස්තාර කරණ විට ආයර්‍යාවෙහි පාද සතර ම එක් කොට එක ම පාදයක් වශයෙන් ගෙණ

**27. ගුරු යට ලුහු සාර - පෙර සේ ම සෙස් අඳනේ,**
**ගුරින් පුරා උනු තැන් - සව් ලුහු විරින් දක්වා.**

---

ප්‍රස්තාර කරන්නාක් මෙන් මේ ගීතීන්හි ද පාද සතර ම එක් පාදයක් වශයෙන් ගෙණ ප්‍රස්තාර කට හැකි වේ. එසේ ම පාද සතර වෙන් වශයෙන් ගෙණ ප්‍රස්තාර කට හැකි ද වේ. එහෙත් පාද දෙකක් ඇති අර්ධය එක් පාදයක් වශයෙන් ගෙණ ප්‍රස්තාර කිරීම මේ ගීතිච්ඡන්දසට ම අයත් විශෙෂලක්‍ෂණයකි.

වර්ණප්‍රධාන වූ හෝ මාත්‍රාප්‍රධාන වූ හෝ ඡන්දසක් ප්‍රස්තාර කිරීමෙහි දී පළමු කොට ලියා ගත යුත්තේ ඒ ඡන්දසෙහි සර්වගුරුවෘත්තය යි. නොහොත්, සර්වගුරුවෘත්තයක් නැති විෂම මාත්‍රච්ඡන්දස්හි නම්, ආදියෙහි ලඝුවක් ඇති සෙසු සැම තන්හි ගුරු ඇති වෘත්තය යි. මාත්‍රා සයක් ඇති ඡන්දස ප්‍රස්තාර කිරීමෙහි දී මුලට යෙදෙන්නේ ⏑ ⏑ ⏑ යන මේ පෙළ යි. මත්වල ගීසඳසෙහි පූර්වාර්ධයෙහි මාත්‍රා සොළසක් ඇතිබැවින් එහි සර්වගුරු වෘත්තය මෙසේ යි — ‘⏑ ⏑ ⏑ ⏑ ⏑ ⏑ ⏑ ⏑’. මාත්‍රා හතක් ඇති ඡන්දස ප්‍රස්තාර කරණ විට මුලට යොදා ගණු ලබන්නේ ‘– ⏑ ⏑ ⏑’ යන පාදයයි. මත්වල ගීයෙහි විතීයාර්ධයෙහි මාත්‍රා එක් විස්සකි. එය විෂමහෙයින් සර්වගුරුවෘත්තයක් නො ලැබේ. එහෙයින් මාත්‍රා එක්විස්සක් ඇති ඡන්දස ප්‍රස්තාර කිරීමෙහි දී මුලට යොදා ගතයුත්තේ ‘– ⏑ ⏑ ⏑ ⏑ ⏑ ⏑ ⏑ ⏑ ⏑ ⏑” යන පාදයයි. සෙසු තන්හි ද විෂමමාත්‍රා ඇති කල්හි ඒ විෂම මාත්‍රාව මුලට ලියා ගෙණ ඉතිරි මාත්‍රාසඞ්ඛ්‍යාවට පොහොනා ගුරු ලියා ගෙණ ප්‍රස්තාර කට යුතු යි. ‘ප්‍රස්තාරය’ යනු ඡන්දසක ඇති තාක් වෘත්ත පතුරුවා ලීම යි.

වර්ණවෘත්ත ච්ඡන්දස් ප්‍රස්තාර කිරීමෙහි දී ආදි ලඝුවෘත්තය මුලට යොදනු නො ලැබේ. යම් පමණ අකුරු ඇති ඡන්දසක් ප්‍රස්තාර කරන්නට යන්නේ එපමණ ගණනක් ගුරු ඇති පාදය මුලට ලියා ගන්නේ ය. වර්ණ දශයක් ඇති ඡන්දස ප්‍රස්තාර කිරීමෙහි දී ගුරු දශයක් මුලට ලියා ගත යුතු යි.

**27.** අන්වය-ප්‍රථම ගුර යට ලඝුවින්‍යාසයක් කොට ඉතිරි කොටස පූර්වපාදයෙහි එම කොටස මෙන් ඇඳිය යුතුයි. ඌනස්ථාන ගුරින් පුරවනු. (මෙසේ කරමින්) සර්වලඝුවෘත්තය (ලැබෙන) තෙක් ඇන්ද යුත්තේ ය.

**විස්තර:—** ඒ ඒ ඡන්දස් අනු ව ප්‍රස්තාරය ද වෙනස් වතත් සිංහලයෙහි දී ප්‍රධානවශයෙන් මාත්‍රා වර්ණ වශයෙන් ඡන්දස් දෙකක් ම හෙයින් සිංහලච්ඡන්දශ්ශාස්ත්‍රයෙහි දී ප්‍රස්තාරය ද වර්ණවෘත්තච්ඡන්දස්ප්‍රස්තාරය, මාත්‍රාවෘත්තච්ඡන්දස්ප්‍රස්තාරය යි දෙවැදෑරුම් වේ. මේ ගීයෙන් දක්වන ලද්දේ ඒ දෙකට ම සාමාන්‍ය වූ ලක්ෂණයි. එයින් වර්ණවෘත්තප්‍රස්තාරය පළමු කොට උගත් කල්හි මාත්‍රාච්ඡන්දස්ප්‍රස්තාරය ඉගෙණීම පහසු වේ. මෙ කී උපදෙශ අනු ව පළමු කොට ද්ව්‍යක්ෂරච්ඡන්දස ප්‍රස්තාර කරමු. එහි සර්වගුරු වෘත්තය '◡ ◡' යන්නයි. ඒ ප්‍රථම පඞ්ක්තිය යි. ද්විතීය පඞ්ක්තිය ලිවීමෙහි දී 'ගුරු යට ලුහු කර' යි කී හෙයින් ප්‍රථම පඞ්ක්තියෙහි මුල තිබෙන ගුරට යටින් ලඝුව ලියා "පෙර සේ ම සෙස් අඳනේ" යි කී හෙයින් දෙවෙනි පෙළෙහි ඉතිරි කොටස ඊට උඩින් පෙළෙහි ඒ කොටස මෙන් ඇඳි කල්හි '– ◡' යන්න ලැබේ. නැවත ද තුන්වන පෙළ ලිවීමෙහි ද දෙවෙනි පෙළේ මුල ගුර යටින් ලඝුව ලියා ගත්විට මුල් ස්ථානය හිස් වේ. "ගුරින් පුරා උනු තැන්"යි කී හෙයින් ඒ හිස් තැන ගුරක් ලියූ විට '◡ –' යන්න ලැබේ. නැවත ද සතරවැනි පෙළ ලිවීමෙහි දී තුන්වැනි පෙළෙහි මුල තිබෙන ගුර යට ලඝුවක් ලියා සෙස්ස පූර්වපාදය මෙන් ඇඳි කල '– –' යන්න ලැබේ. මේ සර්වලඝුවෘත්තය යි. සර්වලඝුවෘත්තය ලැබුනුකල්හි තවත් දුර ප්‍රස්තාර කට නො හැකි යි. යටින් ලඝුවක් ලිවීමට ගුරක් නැති හෙයිනි. මීට වඩා අධික වර්ණ ඇති වර්ණච්ඡන්දස් ප්‍රස්තාර කරන්නේ ද මෙලෙසින් ම ය. තවත් විස්තර අවශ්‍ය නම් වෘත්තරත්නාකර සරලව්‍යාඛ්‍යාවෙන් උගත යුතු යි. ත්‍ර්‍යක්ෂරච්ඡන්දසෙහි ප්‍රස්තාරය මුල දී දක්වා ඇත. චතුරක්ෂරච්ඡන්දසෙහි ප්‍රස්තාරය මෙසේ යි:—

| | | | |
|---|---|---|---|
| 1 | ◡ ◡ ◡ ◡ | 9 | ◡ ◡ ◡ — |
| 2 | — ◡ ◡ ◡ | 10 | — ◡ ◡ — |
| 3 | ◡ — ◡ ◡ | 11 | ◡ — ◡ — |
| 4 | — — ◡ ◡ | 12 | — — ◡ — |
| 5 | ◡ ◡ — ◡ | 13 | ◡ ◡ — — |
| 6 | — ◡ — ◡ | 14 | — ◡ — — |
| 7 | ◡ — — ◡ | 15 | ◡ — — — |
| 8 | — — — ◡ | 16 | — — — — |

28. මත් පිරිහුනු විරිත - දැනෙනෙ'තැන මතො'ව අතින්,
මත් වැඩි විරිත් දුට - එහි ම එම මත සමනවු.

---

පඤ්චාක්ෂරච්ඡන්දසෙහි ප්‍රස්තාරය මෙසේ යි:—

| | | | |
|---|---|---|---|
| 1 | ◡ ◡ ◡ ◡ ◡ | 17 | ◡ ◡ ◡ ◡ — |
| 2 | — ◡ ◡ ◡ ◡ | 18 | — ◡ ◡ ◡ — |
| 3 | ◡ — ◡ ◡ ◡ | 19 | ◡ — ◡ ◡ — |
| 4 | — — ◡ ◡ ◡ | 20 | — — ◡ ◡ — |
| 5 | ◡ ◡ — ◡ ◡ | 21 | ◡ ◡ — ◡ — |
| 6 | — ◡ — ◡ ◡ | 22 | — ◡ — ◡ — |
| 7 | ◡ — — ◡ ◡ | 23 | ◡ — — ◡ — |
| 8 | — — — ◡ ◡ | 24 | — — — ◡ — |
| 9 | ◡ ◡ ◡ — ◡ | 25 | ◡ ◡ ◡ — — |
| 10 | — ◡ ◡ — ◡ | 26 | — ◡ ◡ — — |
| 11 | ◡ — ◡ — ◡ | 27 | ◡ — ◡ — — |
| 12 | — — ◡ — ◡ | 28 | — — ◡ — — |
| 13 | ◡ ◡ — — ◡ | 29 | ◡ ◡ — — — |
| 14 | — ◡ — — ◡ | 30 | — ◡ — — — |
| 15 | ◡ — — — ◡ | 31 | ◡ — — — — |
| 16 | — — — — ◡ | 32 | — — — — — |

මේ ක්‍රමයෙන් ඡන්දස් කීපයක් ප්‍රස්තාර කොට වර්ණච්ඡන්දස් ප්‍රස්තාරය පුහුණු කර ගත යුතුයි.

**29. අර්ථ:—** මාත්‍රාවක් පිරිහුනු වෘත්තයක් දැනෙතොත් එතැන අතින් මාත්‍රාවක් බහා ලවු. මාත්‍රාවක් වැඩි වෘත්තයක් දක්නොත් එහි ම ඒ මාත්‍රාව (ඊට උඩින් පෙළෙහි මාත්‍රාව හා) සම කරවු

**විස්තර:—** මෙයින් දක්වනලද්දේ මාත්‍රාච්ඡන්දස් ප්‍රස්තාරයෙහි දී ලැබෙන වෙනසයි.

ෂණ්මාත්‍රච්ඡන්දසෙහි සර්වගුරුවෘත්තය ගුරුඅකුරු තුනකි. එහෙයින් ඒ ඡන්දස ප්‍රස්තාර කටයුතු කල්හි '◡ ◡ ◡' මෙසේ ගුරු රේඛා තුනක් මුලට යොදගත යුතුයි. වර්ණවෘත්තච්ඡන්දස් ප්‍රස්තාරයෙහි මෙන් ම ප්‍රථම ගුරුහු යට ලඝුවක් ලියා ශෙෂය

උඛ පෙළ සේ කළ විට '— ◡ ◡' යන්න ලැබේ. එහි මාත්‍රා පසකි. එහෙයින් එහි මාත්‍රාවක් අඩු ව තිබෙන බව පෙණේ. මේ ඡන්‍දසෙහි සියලු ම වෘත්තයන්හි මාත්‍රා සය බැගින් තිබිය යුතු ය. මාත්‍රාව අඩු ව තිබෙන්නේ ද මුල ම ය. එහෙයින් ආදි යෙහි වූ ලඝුවට මුලින් තවත් මාත්‍රාවක් '—' මෙසේ යොදගත යුතු. 'මත් . . . අතින්' යි කියනලද්දේ එය යි. එසේ මාත්‍රා වක් එකතු කළවිට '— — ◡ ◡' යන්න ලැබේ. නැවත තුන් වන පෙළ ඇඳීමෙහි දී දෙවෙනි පෙළෙහි මුල ගුරු යට ලඝු විභාගය ලියා සෙස්ස පෙර සේ ඇඳි කල '— ◡' යන්න ලැබේ. මීට මුලින් ස්ථාන දෙකක් හිස් ව තිබේ. "ගුරින් පුරා උනු තැන්"යි කළ නියමය පරිදි ඒ දෙතැන ගුරින් පුරවන්ට ගිය කල මාත්‍රා වක් වැඩි වේ. එහෙයින් මුලින් යෙදිය යුතු ගුරු නො ලියා ඊට උඩින් පෙළ හා සම කළ විට හෙවත් ලඝු විභාගයක් ඇඳි විට තුන්වන පෙළ '— ◡ — ◡' මෙසේ වේ. මෙහි පළමු වන ගුරු යටින් ලඝුව ඇඳ ශෙෂය උඛ පෙළ සේ කොට ඌන ස්ථානය ගුරින් පිරවූ කල '◡ — — ◡' යන සතර වැනි පෙළ ලැබේ. විෂමමාත්‍රාඡන්‍දස් ප්‍රස්තාරයෙහි දී ද ක්‍රමය මේ මැයි.

මෙහි ඡන්‍දස් කීපයක් ප්‍රස්තාර කරණු ලැබේ. එය බලා මාත්‍රා ප්‍රස්තාරය පුහුණු කරගත යුතුයි.

| මාත්‍රා: 4. | මාත්‍රා: 5. | මාත්‍රා: 6. |
|---|---|---|
| ◡ ◡ 1. | — ◡ ◡ 1. | ◡ ◡ ◡ 1. |
| — — ◡ 2 | ◡ — ◡ 2. | — — ◡ ◡ 2 |
| — ◡ — 3. | — — — ◡ 3. | — ◡ — ◡ 3. |
| ◡ — — 4. | ◡ ◡ — 4. | ◡ — — ◡ 4. |
| — — — — 5. | — — ◡ — 5. | — — — — ◡ 5. |
| | — ◡ — — 6. | — ◡ ◡ — 6. |
| | ◡ — — — 7. | ◡ — ◡ — 7. |
| | — — — — — 8. | — — — ◡ — 8. |
| | | ◡ ◡ — — 9. |
| | | — — ◡ — — 10. |
| | | — ◡ — — — 11. |
| | | ◡ — — — — 12. |
| | | — — — — — — 13. |

ගීතිවෘත්තයස් ප්‍රස්තාර කිරීම ද මෙසේ යි.

නෂ්ටප්‍රත්‍යයාදිය මෙහි දක්වා නැති නමුත් එය ද ඉතා අවශ්‍ය හෙයින් ඒ පිළිබඳ විස්තරයක් දක්වමු.

### නෂ්ටප්‍රත්‍යය.

ප්‍රස්තාරයෙහි ශුද්ධාශුද්ධත්වය හා 'ප්‍රස්තාරයෙහි මේ අඞ්කය දරණ පෙළෙහි ගුරු ලඝු කෙසේ යෙදී තිබේ ද'යි දත මනා කල එයත් දැන ගැණුමට නෂ්ටප්‍රත්‍යය ඉතා අවශ්‍ය වේ. 'නෂ්ට වූ හෙවත් ගුරුලඝු නො පෙණෙන වෘත්තයාගේ ගුරුලඝු සොයා ගැණීමට උපකාර වන ක්‍රමය' යනු 'නෂ්ටප්‍රත්‍යය' යන්නෙහි අර්ථ යි. වර්ණච්ඡන්දසට හා මාත්‍රාච්ඡන්දසටත් නෂ්ටප්‍රත්‍යය දෙකකි. මෙපමණ අකුරු ඇති ඡන්දසෙහි මේ අඞ්කය දරණ වෘත්තයෙහි ගුරු ලඝු කෙසේ දැ යි කිසිවෙකු ඇසුවොත් එය දැනගැණීමට වර්ණවෘත්ත නෂ්ටප්‍රත්‍යය අවශ්‍ය වේ.

එසේ වෘත්තයක් සෙවීමෙහි දී කියන ලද සඞ්ඛ්‍යාව අඩ කළ (දෙකින් බෙදිය) හැකි නම්, අඩ කොට ලඝුරේඛාවක් ලියා ගත යුතු. දෙකින් බෙදිය නො හැකි නම් එකක් එකතු කොට බෙදා ගුරු රේඛාවක් ලියා ගත යුතු. නැවත ද දෙකින් බෙදා ලැබුනු ඵලය දෙකින් බෙදිය හැකි නම් බෙදා ලඝුවක් ද, බෙදිය නොහැකි නම් එකක් එකතු කොට බෙදා ගුරක් ද ලියා ගත යුතු. වුවමනා අක්ෂර සඞ්ඛ්‍යාව පිරෙණ තෙක් මෙසේ ම කටයුතු.

චතුරක්ෂරච්ඡන්දසෙහි එකොළොස් වන වෘත්තය කෙසේ ද?

එකොළස දෙකින් බෙදිය නො හැකිබැවින් එකක් එක් කොට බෙදා '◡' මෙසේ ගුරු චිහ්නයක් ලියාගත යුතු. දොළස (11 + 1) බෙදීමෙන් ලැබුනු ඵලය වූ සය දෙකින් බෙදිය හැකි බැවින් බෙදා ලඝු චිහ්නයක් (මුලින් ලියාගත් ගුරු චිහ්නයට ඉක්බිත්තෙන්) ලියනු. සය දෙකින් බෙදීමෙන් ලත් ඵලය තුණයි. එය දෙකින් බෙදිය නොහැකි බැවින් එකක් එකතු කොට බෙදා අනතුරු ව ගුරුචිහ්නයක් ලියනු. බෙදීමෙන් ලත් ඵලය වූ දෙක දෙකින් බෙදිය හැකි බැවින් බෙදා ලඝු චිහ්නයක් ලියනු. දැන් චිහ්න සතරක් සම්පූර්ණ ය. චතුරක්ෂරච්ඡන්දසෙහි වෘත්තයක ගුරුලඝු විතාළ හෙයින් මින් මතු බෙදිය යුතු නො වේ. චතුරක්ෂරයට අධික අක්ෂර ඇති ඡන්දසක නම් දෙකින් බෙදා ලත් ඵලය එකක් වී නම්, එය නො බෙදා ම වුවමනා අකුරු ගණන සම්පූර්ණ වන්නට ගුරුචිහ්න ලියාගත යුතු. චතුරක්ෂරච්ඡන්දසෙහි එකොළොස්වන වෘත්තයෙහි '◡ — ◡ —' යන වශයෙන් ගුරු ලඝු පිහිටා තිබෙන බව යථොක්ත ක්‍රම

යෙන් පෙණේ. මෙසේ ම පඤ්චාක්‍ෂර ෂඩක්‍ෂරාදි වූ ඡන්දස් ප්‍රස්තාර කොට නෂ්ටප්‍රත්‍යයෙන් ඒ ඒ වෘත්තයන්හි ගුරු ලඝු සොයා නෂ්ටප්‍රත්‍යය ප්‍රගුණ කර ගත යුතු.

චතුර්දශාක්‍ෂරච්ඡන්දසෙහි දෙදහස් නවසිය තිස්තුන්වන වෘත්ත යෙහි ගුරුලඝුවින්‍යාසය කෙසේ ද?

```
    2933
       1
   -----
2 )2934
   -----
    1467 = ◡ (1)
       1
   -----
2 )1468
   -----
2 ) 734 = ◡ (2)
   -----
    367 = — (3)
      1
   -----
2 ) 368
   -----
2 ) 184 = ◡ (4)
   -----
2 )  92 = — (5)
   -----
2 )  46 = — (6)
   -----
     23 = — (7)
```

```
      23
       1
    ----
2)    24
    ----
2)    12 = ◡ (8)
    ----
2)     6 = — (9)
    ----
       3 = — (10)
       1
    ----
2)     4
    ----
2)     2 = ◡ (11)
    ----
       1
    ----   = — (12)
             ◡ (13)
             ◡ (14)
```

මෙසින් වෘත්තයෙහි ගුරු ලඝු මෙසේ පිහිටි බව පෙණේ:—

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ◡ | ◡ | — | ◡ | — | — | — | ◡ | — | — | ◡ | — | ◡ | ◡ |

ගුරු ලඝු සොයාගත යුතු සෙසු වර්ණවෘත්තයන්හි ද මේ ක්‍රමයෙන් සොයා ගත යුතු යි.

## මාත්‍රාවෘත්තනෂ්ටප්‍රත්‍යය.

මේ වනාහි යට කී ක්‍රමයට වෙනස් වේ. පළමු කොට ගුරු ලඝු වින්‍යාසය සොයා ගත යුතු වෘත්තය අයත් මාත්‍රාච්ඡන්දසෙහි සර්වලඝුවෘත්තය ලියා ගත යුතු. පඤ්චමාත්‍රිකච්ඡන්දස නම්:—

— — — — — මෙසේ ඇඳගත යුතු යි. ඉන් පසු මූල ලඝු චිහ්නය මතුවෙහි එකසඞ්ඛ්‍යාව ද, දෙවෙනි ලඝුව මතුවෙහි ද්වි සඞ්ඛ්‍යාව ද, ඒ දෙක එකතු කොට ත්‍රිසඞ්ඛ්‍යාව තුන්වැනි ලඝුව මතු වෙහි ද, ඒ තුණ සහ ඊට මුලින් තිබෙන දෙකත් එකතු කොට පඤ්චසඞ්ඛ්‍යාව සතරවැනි ලඝුව මතුවෙහි ද, ඒ පස සහ ඊට මුලින් තිබෙන තුණත් එකතු කළ විට ලැබෙන අට පස්වැන්න මතුවෙහි ද ලියනු. එවිට මෙසේ වේ:—

'1 2 3 5 8'
— — — — —

මීට අධිකමාත්‍රා ඇති ඡන්දසක් වුවත් සර්වලඝුවෘත්තය ලියා ගෙණ මේ පිළිවෙළින් මුලින් මුලින් යෙදූනු සඞ්ඛ්‍යා දෙක එක් කොට ඉදිරියෙහි වූ ලඝුව මතුවෙහි ලියා ගත යුතු. නෂ්ටවෘත්ත යාගේ සඞ්ඛ්‍යාව ලඝුමතුවෙහි තිබෙන ඉතා වැඩි සඞ්ඛ්‍යාවෙන් (සඞ්ඛ්‍යානයෙන්) අඩු කරණු. පඤ්චමාත්‍රිකච්ඡන්දසෙහි සතර වැනි වෘත්තය සොයා ගත යුතු නම්, ඒ සතර පස්වැන්න මතු වෙහි වූ අටෙන් අඩු කරණු. එවිට සතරක් ලැබේ. ඒ සතරෙන් අඩු කළහැකි (මාත්‍රාමස්තකයෙහි වූ) ඉතා වැඩි ගණන නැවතත් අඩු කරණු. වැඩිගණන නම් තුණයි. එය සතරෙන් අඩු කළ විට එකක් ඉතිරි වෙ යි. ඒ එකෙන් ද ප්‍රථමස්ථානයෙහි තිබෙන එක අඩු කළ හැකි හෙයින් අඩු කරණු. මෙසේ අඩු වූ සඞ්ඛ්‍යා වන් යට පිහිටි මාත්‍රා ඒ ඉදිරියෙහි සිටි මාත්‍රාවත් සමග එකතු කොට ගුරක් කරණු. මෙහි පළමුවන මාත්‍රාව උඩ සිටි අඞ්කය අඩු වූ හෙයින් ඒ ඉදිරියෙහි සිටි දෙවන මාත්‍රාවත් එක් කොට ( 1. 2 ) මෙසේ ගුරක් කරණු. තුන්වන මාත්‍රාව ළඟ පිහිටි

— —
⏑

සඞ්ඛ්‍යාව ද අඩු වූ හෙයින් තුන්වන මාත්‍රාව හා සතරවන මාත්‍රාවත් එක් කොට ගුරක් කරණු. අනික් මාත්‍රාවන්ගේ වෙනසක් නො වේ. දැන් පඤ්චමාත්‍රිකච්ඡන්දසෙහි සතරවැනි වෘත්තය "⏑ ⏑ —" මෙසේ බව මෙයින් පෙණේ.

සප්තමාත්‍රවර්ණඡන්දසෙහි පස්වැනි වෘත්තයෙහි ගුරුලඝු කෙසේ ද?

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | + | | | + | |
| 1 | 2 | 3 | 5 | 8 | 13 | 21 |
| — | — | — | — | — | — | — |
| | | ◡ | | | ◡ | |

| | |
|---|---|
| සඞ්ඛ්‍යානය | 21 |
| නෂ්ටවෘත්තාඞ්කය | 5 |
| | 16 |
| | 13 |
| | 3 |
| | 3 |

\+ මේ ලකුණ ලඟ පිහිටි අඞ්ක අඩු වූ හෙයින් ඊට යටින් සිටි මාත්‍රාවෝ, ඉදිරියෙහි වූ මාත්‍රාවන් සමග එක් ව, ගුරු වූහ.

වෘත්තය මෙසේ යි:—

" — — ◡ — ◡ "

මාත්‍රා දොළසක් ඇති ඡන්දසෙහි හැත්තෑහත් වැනි වෘත්තය කෙසේ ද?

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | | + | | + | | | | | | + | |
| 1 | 2 | 3 | 5 | 8 | 13 | 21 | 34 | 55 | 89 | 144 | 233 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — |
| ◡ | | ◡ | | ◡ | | | | | | ◡ | |

| | |
|---|---|
| සඞ්ඛ්‍යානය | 233 |
| නෂ්ටාඞ්කය | 77 |
| | 156 |
| | 144 |
| | 12 |
| | 8 |
| | 4 |
| | 3 |
| | 1 |
| | 1 |

ඒ වෘත්තය මෙසේ යි:—

" ◡ ◡ ◡ — — — — ◡ "

සෙසු තන්හි ද මේ ක්‍රමයෙන් ම නෂ්ටවෘත්ත සෙවිය යුතු.

## උද්දිෂ්ටප්‍රත්‍යය.

'උද්දිෂ්ටප්‍රත්‍යය' යනු ගුරුලඝු පෙන්වා 'මේ වෘත්තය ප්‍රස්තාරයෙහි කවර ස්ථානයෙහි ලැබේ ද' යි ඇසූ විට ප්‍රස්තාර නො කොට ම එය දත ගැණීමට උපකාර වන ක්‍රමය යි. මේ ද ප්‍රස්තාර ශුද්ධිය දැනගැණීම පිණිස ඉවහල් වේ. වර්ණවෘත්ත උද්දිෂ්ටප්‍රත්‍යය මාත්‍රාවෘත්ත උද්දිෂ්ටප්‍රත්‍යයට වඩා වෙනස් වේ.

**වර්ණවෘත්තඋද්දිෂ්ටප්‍රත්‍යය**

වර්ණවෘත්තයක ගුරුලඝු පෙන්වා මෙබඳු වෘත්තය ප්‍රස්තාර යෙහි කී වැනි දැයි විචාළ විට ගුරු ලඝු වින්‍යාසය කර ප්‍රථම විභාගය මතුවෙහි එක ද, දෙවෙනි විභාගය මතුවෙහි දෙක ද ලියනු. එය දෙකෙන් වැඩි කළ විට ලැබෙන ඵලය වූ සතර තුන් වැනි විභාගය මත්තෙහි ද, ඒ සතර දෙකෙන් ගුණ කොට ලත් ඵලය වූ අට සතරවැනි විභාගය මත්තෙහි ද ලියාගත යුතු. මෙසේ වෘත්තයෙහි අකුරු අවසන් වන තෙක් දෙකෙන් ගුණ කොට ලියා ලඝු අක්ෂරයන් මතුවෙහි සිටි අඞ්ක සියල්ල එක් කොට ඊට තවත් එකක් ද එකතු කරණු. ලැබෙන ඓක්‍යය උද්දිෂ්ට වෘත්තයාගේ සඞ්ඛ්‍යාව යි. නිදර්ශන මෙසේ යි:—

"— — — ◡" මේ වෘත්තය වර්ණච්ඡන්දස්ප්‍රස්තාරයෙහි කී වැනි ද?

| | | | |
|---|---|---|---|
| 1 | 2 | 4 | 8 |
| — | — | — | ◡ |

ලඝු මතුවෙහි සිටි අඞ්ක $1+2+4 = 7$
අමුතුවෙන් 1

8

අටවැනි වෘත්තය යි.

"සමතුන් සමතුන් සරගා" මේ වෘත්තය නවාක්ෂරච්ඡන්දස්හි කීවැනි වෘත්තය ද?

ගුරු ලඝු වින්‍යාසය හා සඞ්ඛ්‍යා පිහිටුවීම:—

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 4 | 8 | 16 | 32 | 64 | 128 | 256 |
| — | — | ◡ | — | — | ◡ | — | — | ◡ |

ලඝු මතුවෙහි සිටි අඞ්ක:— $1+2+8+16+64+128 = 219$
1

220

220 වැනි වෘත්තය යි.

මෙය සත්‍ය දැයි තමාට විධියෙන් දත හැකි යි.

```
2 ) 220
    ---
2 ) 110  (—)  1        2 ) 4
    ---                    ---  (—) 7
     55  (—)  2        2 ) 2
      1                    ---
    ---                     1   (—) 8
2 )  56
    ---
2 )  28  (◡)  3                 (◡) 9
    ---
2 )  14  (—)  4        “ – – ◡ – – ◡ – – ◡ ”
    ---
      7  (—)  5
      1
    ---
2 )   8  (◡)  6
    ---
      4
    ---
```

“හස ගමනට දෑපි වනවිල් ගොස් වනී” මෙය චතුර්දිශාක්ෂරච්ඡන්දසෙහි කිවැනි වෘත්තය ද?

ගුරු ලඝු වින්‍යාසය හා අඞ්ක පිහිටුවීම:—

| 1 | 2 | 4 | 8 | 16 | 32 | 64 | 128 | 256 | 512 | 1024 | 2048 | 4096 | 8192 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| – | – | – | – | – | – | – | ◡ | – | – | ◡ | ◡ | – | – |

ලඝු මතුවෙහි සිටි අඞ්ක —

```
    1
    2
    4
    8
   16
   32
   64
  256
  512
 4096
 8192
    1
 ----
13184
 ----
```

13184 වැනි වෘත්තය යි.

**මාත්‍රාවෘත්තොද්දිෂ්ටප්‍රත්‍යය.**

උදෙසන ලද වෘත්තයාගේ ගුරුලුහු ඈඳ ප්‍රථමමාත්‍රාව මතුවෙහි එක ද ද්විතීයමාත්‍රාව මතුවෙහි දෙක ද තෘතීයමාත්‍රාව මතුවෙහි තුණ ද, චතුර්ථමාත්‍රාව මතුවෙහි පස දැයි යනාදි වශයෙන් (නෂ්ටප්‍රත්‍යයෙහි මෙන්) අඞ්ක ලියා ගත යුතුයි. ගුරු අකුරක මාත්‍රා දෙකක් ඇති බැවින් අඞ්ක මිශ්‍ර නොවන පිණිස

1 3 8
◡ ◡ ◡
2 5 13

යන වශයෙන් හීන සඞ්ඛ්‍යාව ගුරට උඩිනුත් අධිකසඞ්ඛ්‍යාව යටිනුත් ලියනු. මෙසේ කොට ගුරු විහත මතුවෙහි සිටි අඞ්කයන් එක් කොට සඞ්ඛ්‍යානයෙන් අඩු කළ විට වෘත්තයාගේ සඞ්ඛ්‍යාව ලැබේ. (සඞ්ඛ්‍යානය නම් ඡන්දස ප්‍රස්තාර කළ විට ලැබෙන වෘත්ත ගණනයි. එකමාත්‍රච්ඡන්දසෙහි සඞ්ඛ්‍යානය එකකි. ද්විමාත්‍රිකයෙහි දෙකකි. ත්‍රිමාත්‍රිකයෙහි තුණකි. චතුර්මාත්‍රිකයෙහි පසකි. පඤ්චමාත්‍රිකයෙහි අටකි. ෂණ්මාත්‍රිකයෙහි දහතුණකි. මෙසේ නෂ්ටයෙහි කී පරිද්දෙන් අඞ්ක එකතු කිරීමෙන් සඞ්ඛ්‍යානය දත හැකි ය.)

“— — ◡ — ◡” මේ වෘත්තය මාත්‍රාප්‍රස්තාරයෙහි කීවැනි වෘත්තය ද?

1 2 3 8 13
— — ◡ — ◡
5 21

ගුරු මතුවෙහි සිටි අඞ්ක:— 3
13
———
ඓක්‍යය 16
———

සඞ්ඛ්‍යානය 21
16
———
5
———

යට දැක්වූ වෘත්තය සප්තමාත්‍රච්ඡන්දසෙහි පස්වැනි වෘත්තය බව මෙයින් පෙණේ. නෂ්ටය බලනු.

“හස ගමනට දූපී වන විල් ගොස් වති” මෙය මාත්‍රාච්ඡන්දස් ප්‍රස්තාරයෙහි කී වැනි වෘත්තය ද?

ගුරු ලඝු වින්‍යාසය හා අඞ්ක යෙදීම:—

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 5 | 8 | 13 | 21 | 34 | 89 | 144 | 233 | 610 | 1597 | 2584 |
| – | – | – | – | – | – | – | ◡ | – | – | ◡ | ◡ | – | – |
| | | | | | | | 55 | | | 377 | 987 | | |

සඞ්ඛ්‍යාතය:— 2584

ගුරුමතුවෙහි සිටි අඞ්කයන්ගේ ඓක්‍යය:- (34 + 233 + 610=) 877

1707

1707 වැනි වෘත්තය යි.

නෂ්ටප්‍රත්‍යයයෙන් මෙය පරීක්‍ෂා කරණු.

සෙස්සෙහි ද මේ ක්‍රමයෙන් ම උද්දිෂ්ටාඞ්කය සොයනු.

## එකාමය්‍යාදි ලගක්‍රියාව.

ඡන්දසක ලැබෙන එකගුරු—විගුරුවෘත්තාදිය කොපමණ කොපමණ දැ යි ඒ ඡන්දස ප්‍රස්තාර නො කොට ම දැන ගැණීමට ඉවහල් වන ගණිත ක්‍රමය එකාමය්‍යාදි ලග ක්‍රියා නම් වේ. වර්ණ ච්ඡන්දස සම්බන්ධ එකාමය්‍යාදි ලගක්‍රියාවට ක්‍රම කිපයක් ම වෘත්ත රත්නාකර සරලාව්‍යාඛ්‍යාවෙහි අප විසින් දක්වන ලද නමුත් මෙහි එයින් එක් ක්‍රමයක් ම දක්වනු ලැබේ.

## වර්ණවෘත්ත ලග ක්‍රියාව.

ලගක්‍රියාව කළ යුතු ඡන්දසෙහි අක්‍ෂර සඞ්ඛ්‍යාව යම්තාක් ද එපමණට 1. 2. 3. 4 යනාදි පිළිවෙළට අඞ්ක අනුලොම යෙන් ලියා නැවත ඒ අඞ්ක මතු පිට ඒ අඞ්ක ම ප්‍රතිලොම යෙන් යෙදිය යුතු. චතුරක්‍ෂරච්ඡන්දසෙහි ලගක්‍රියාව නම්
$\frac{4. \quad 3. \quad 2. \quad 1.}{1. \quad 2. \quad 3. \quad 4.}$ මෙසේ ලියා ගත යුතු. මෙහි යට පෙළෙහි මුල තිබෙන එකෙන් ඒ මතුවෙහි තිබෙන සතර ගුණ කොට එකට යටින් ලියා ගත යුතුයි. නැවත ඒ සතර ඒ ඉදිරියෙහි තිබෙන තුණෙන් ගුණ කර තුණට යටින් තිබෙන දෙකෙන් බෙදූ ලැබෙන ඵලය වූ සය දෙකට යටින් ලියා ගත යුතු. ඒ සය තුණ ඉදිරියෙහි තිබෙන දෙකෙන් ගුණ කොට ඵලය දෙකට යටින් තිබෙන තුණෙන් බෙදූ ලැබෙන සතර තුණට යටින් ලියනු. ඒ සතර ම දෙක ඉදිරියෙහි තිබෙන එකෙන් ගුණ කර එකට යටින් තිබෙන සතරෙන් බෙදූ ලැබෙන ඵලය වූ එක සතරට යටින් ලියා ගත යුතු.

එවිට ගණිත මෙසේ යි:—

| | | | |
|---|---|---|---|
| 4. | 3. | 2. | 1 |
| 1. | 2. | 3. | 4 |
| 4. | 6. | 4. | 1 |

මෙහි යට ම පෙළෙහි ප්‍රථමාඞ්කයට මුලින් එකක් ලියූ විට ගණිත සම්පූර්ණ වේ. එවිට උත්තරය මෙසේ යි:— 1. 4. 6. 4. 1. මේ අඞ්කවලින් පෙන්වන්නේ චතුරක්‍ෂර ඡන්දස ප්‍රස්තාර කළ විට ලැබෙන සර්වගුරු, එකගුරු වෘත්තාදීන්ගේ සඞ්ඛ්‍යායි.

එනම්:—

| | | | |
|---|---|---|---|
| සර්වගුරු | වෘත්ත | 1 | යි. |
| එකගුරු | වෘත්ත | 4 | යි. |
| ද්විගුරු | ,, | 6 | යි. |
| ත්‍රිගුරු | ,, | 4 | යි. |
| සර්වලඝු | ,, | 1 | යි. |
| | | 16 | |

චතුරක්‍ෂරච්ඡන්දසෙහි එකගුරු වෘත්ත සතරක් නම් ත්‍රිලඝු වෘත්ත ද සතරක් වේ. අකුරු සතරෙන් එකක් ගුරක් වුවොත් ඉතිරි අකුරු තුණ ලඝු වනු එකාන්ත හෙයිනි. ද්විගුරුවෘත්ත සයක් නම් ද්විලඝුවෘත්ත ද සයක් වේ. ත්‍රිගුරුවෘත්ත සතරක් වතොත් එකලඝුවෘත්ත ද සතරකි. එසේ හෙයින් එකලඝුආදි වෘත්ත නො කිව ද වරදෙක් නො වේ.

මීට අධික අක්‍ෂර සඞ්ඛ්‍යාවක් ඇති ඡන්දසක වුවත් මේ ක්‍රම යෙන් ම ලගක්‍රියාව කළ හැකි ය. නවාක්‍ෂරච්ඡන්දසෙහි ලග ක්‍රියාව මෙසේ යි:—

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 9. | 8. | 7. | 6. | 5. | 4. | 3. | 2. | 1. |
| | 1. | 2. | 3. | 4. | 5. | 6. | 7. | 8. | 9. |
| 1. | 9. | 36. | 84. | 126; | 126. | 84. | 36. | 9. | 1. |

| | | |
|---|---|---|
| සර්වගුරු | වෘත්ත | 1 |
| ඒකගුරු | ,, | 9 |
| ද්විගුරු | ,, | 36 |
| ත්‍රිගුරු | ,, | 84 |
| චතුර්ගුරු | ,, | 126 |
| පඤ්චගුරු | ,, | 126 |
| ෂඩ්ගුරු | ,, | 84 |
| සප්තගුරු | ,, | 36 |
| අෂ්ටගුරු | ,, | 9 |
| සර්වලඝු | ,, | 1 |
| | සඞ්ඛ්‍යාභාගය | 512 |

දශාක්ෂරවර්ණඡන්දසෙහි ලගක්‍රියාව මෙසේ යි:—

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 10. | 9. | 8. | 7. | 6. | 5. | 4. | 3. | 2. | 1. |
| | 1. | 2. | 3. | 4. | 5. | 6. | 7. | 8. | 9. | 10. |
| 1. | 10. | 45. | 120. | 210. | 252. | 210. | 120. | 45. | 10. | 1. |

පෙර මෙන් සර්වගුරු වෘත්තාදිය කිය යුතු යි.

## මාත්‍රාවෘත්ත ලග ක්‍රියාව.

## මාත්‍රාමේරුව.

මාත්‍රාවර්ණඡන්දසුන්ගේ ලගක්‍රියා දැනගැණීමට මේරු ප්‍රස්තාරය කළ යුතු. මේරුසාධනයෙහි දී පළමු කොට එක් කොෂ්ඨයක් ලියා ඒ යට පෙළට කොටු දෙකබැගින් ඇති පඞ්ක්ති දෙකක්ද, ඉන් යට කොටු තුණ බැගින් ඇති පඞ්ක්ති දෙකක් ද, ඉනුත් යට කොටු සතර බැගින් ඇති පඞ්ක්ති දෙකක් දැයි යන වසයෙන් එක එක අධික කොට වුව මනා ගණනක් කොෂ්ඨ පඞ්ක්ති ලියා ගතයුතු. මෙසේ කොටු ඇඳ මුදුනෙහි වූ කොටුවෙහිත් පඞ්ක්තීන්හි අන්ත යෙහි පිහිටි කොටුවලත් ඒකාඞ්කය යෙදියයුතු. යුගම පඞ්ක්තීන් ගෙන් ප්‍රථම පඞ්ක්තියිවල ප්‍රථමකොටුවල ඒකාඞ්කය ම යොදනු. හිස් ව තිබෙන යුගමපඞ්ක්තීන්ගෙන් ද්විතීය පඞ්ක්තීන්හි ප්‍රථම කොෂ්ඨවල 2. 3. 4. 5. යනාදි පිළිවෙලින් අඞ්ක යොදා සම්පූර්ණ කළයුතු. මෙසේ කොට කොෂ්ඨයන්හි මතු දක්වන අයුරු

අඞ්ක යෙදිය යුතු. ද්විතීය පඞ්ක්තිවයෙහි පිරවිය යුතු කොටුවක් නැත. තෘතීය පඞ්ක්තිවයෙහි මධ්‍යකොෂ්ඨවය පිරවිය යුතු. එහිනුදු ප්‍රථමපඞ්ක්තියෙහි මධ්‍යකොෂ්ඨය පළමු කොට පිරවිය යුතු හෙයින් ඒ කොටුවට උඩින් වූ මූලකොටුවෙහි අඞ්කයත් අගින් වූ කොටුව මතුවෙහි පිහිටි කොටුවෙහි අඞ්කයක් (2 + 1=3) එක් කොට ශේෂය පිරවියයුතු කොටුවෙහි ලියනු. දැන් ඊට යටින් තිබෙන කොටුව ද පිරවියයුතු හෙයින් එහි තිබෙන තුණත් තුණ තිබෙන කොටුවට උඩපෙළෙහි අගින් තිබෙන කොටුවෙහි වූ එකත් එකතු කොට ශේෂය (4) තුණට යටින් පිරවියයුතු කොටුවෙහි ලිය යුතු.

**නිදර්ශනයක් :—**




මෙහි 5–6 අඞ්ක දරණ කොටු පිරවිය යුතු කල්හි 3–2 අඞ්ක දරණ කොටුවල තිබෙන සඞ්ඛ්‍යා එකතු කොට ශේෂය 5 අඞ්කය දරණ හිස්කොටුවෙහි ලියාගතයුතු. 6 අඞ්කය දරණ කොටුව ද පිරවිය යුතු හෙයින් ඊට උඩින් තිබෙන 5 අඞ්කය දරණ කොටුවෙහි වූ සඞ්ඛ්‍යාවත් එය ඉදිරියෙහි වූ 4 අඞ්කය දරණ කොටුවෙහි වූ සඞ්ඛ්‍යාවත් එකතු කොට ශේෂය හිස් ව තිබෙන 6 අඞ්කය දරණ කොටුවෙහි යොදනු. මේ ක්‍රමයෙන් ම අතික් කොෂ්ඨ ද සම්පූර්ණ කළයුතු. යට දක්වනු ලබන මාත්‍රාමෙරුව බලා ප්‍රගුණ කරගත යුතු.

| | | | | |
|---|---|---|---|---|
| 1 | | | | |
| 1 | 1 | | | |
| 2 | 1 | | | |
| 1 | 3 | 1 | | |
| 3 | 4 | 1 | | |
| 1 | 6 | 5 | 1 | |
| 4 | 10 | 6 | 1 | |
| 1 | 10 | 15 | 7 | 1 |
| 5 | 20 | 21 | 8 | 1 |

(වුවමනා ඡන්දය තෙක් මෙසේ ම සඞ්ඛ්‍යා යෙදිය යුතු.)

මෙහි මුදුනෙහි වූ කොටුවෙහි පෙණෙන්නේ එකමාත්‍රව්‍යඤ්ජනයෙහි එකලඝුවෘත්තයයි. ඊළඟ පෙළෙහි ද්විමාත්‍රව්‍යඤ්ජනයෙහි එකා

ගුරුවෘත්තය ද සර්වලඝුවෘත්තය ද පෙණෙයි. තුන්වනපෙළෙහි එකගුරුවෘත්ත දෙක ද සර්වලඝුවෘත්තය ද පෙණේ 1. 3. 5. 7. 9. යනාදි විෂම මාත්‍රාච්ඡන්දස්හි සර්වගුරුවෘත්තයක් නො ලැබේ. සතර වනපෙළෙහි චතුර්මාත්‍රාච්ඡන්දසෙහි සර්වගුරුවෘත්ත එකක් ද, එක ගුරු වෘත්ත තුණක් ද, සර්වලඝුවෘත්ත එකක් ද පෙණේ. සෙසු ඡන්දස්හි ද මේ ක්‍රම මැයි. සර්වලඝු එකලඝු විලඝු ආදිවශයෙන් ලඝුප්‍රධාන කොට කියනවිට පඞ්ක්තීන්හි අන්තයෙහි පටන් කියයුතු. මෙහි දක්වනලද්දේ නවමාත්‍රාච්ඡන්දසෙහි ලගක්‍රියාව තෙක් ය. ඊට අධික මාත්‍රා ඇති ඡන්දස්හි ද මේ ක්‍රමයෙන් ලගක්‍රියාව සොයා ගතයුතු.

### සඞ්ඛ්‍යානය.

“සඞ්ඛ්‍යානය” නම් ඡන්දසකට අයත් සියලු වෘත්ත, ඒ ඡන්දස ප්‍රස්තාර නො කොට ම දැන ගැණීමට උපකාර වන ක්‍රමයයි.

ලගක්‍රියාවෙහි පෙණෙන සඞ්ඛ්‍යා සියල්ල එක් කළ විට ඡන්දස ප්‍රස්තාර කළ කල්හි ලැබෙන වෘත්ත සියල්ල දතහැකි ය. මාත්‍රා ඡන්දස්හි නෂ්ට-උද්දිෂ්ටාඞ්කයන්ගෙන් සඞ්ඛ්‍යානය ලැබෙන පරිදි යට දක්වන ලදී.

| | | | | |
|---|---|---|---|---|
| වර්ණ | 1 ක් | ඇති | ඡන්දසෙහි සඞ්ඛ්‍යානය. | 2 |
| ,, | 2 | ,, | ,, | 4 |
| ,, | 3 | ,, | ,, | 8 |
| ,, | 4 | ,, | ,, | 16 |
| ,, | 5 | ,, | ,, | 32 |
| ,, | 6 | ,, | ,, | 64 |
| ,, | 7 | ,, | ,, | 128 |
| ,, | 8 | ,, | ,, | 256 |

යන වශයෙන් මුලින් වූ ඡන්දසෙහි සඞ්ඛ්‍යානය විගුණ කිරීමෙන් ඊළඟ ඡන්දසෙහි සඞ්ඛ්‍යානය දත හැකි වේ. මේ ක්‍රමය යෙදෙන්නේ වර්ණච්ඡන්දස්හි පමණකි. මාත්‍රාච්ඡන්දස්හි වනාහි මුලින් තිබෙන ඡන්දස් දෙකේ සඞ්ඛ්‍යාන එකතු කිරීමෙන් ඊ ළඟ ඡන්දසෙහි සඞ්ඛ්‍යානය දත හැකි ය.

**28. තිස් පටන් සිවුසාලිස් - වසන් මතින් සඳසුන්, ***
**පතර කොරෙමින් සඳ - හගනේ විරිත් සහසුන්.**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මාත්‍රා | 1 | ක් | ඇති ඡන්දසෙහි | සංඛ්‍යානය | 1 | යි. |
| ,, | 2 | ,, | ,, | ,, | 2 | යි. |
| ,, | 3 | ,, | ,, | ,, (1 + 2=) | 3 | යි. |
| ,, | 4 | ,, | ,, | , (2 + 3=) | 5 | යි. |
| ,, | 5 | ,, | ,, | ,, (3 + 5=) | 8 | යි. |
| ,, | 6 | ,, | ,, | ,, (5 + 8=) | 13 | යි. |
| ,, | 7 | ,, | ,, | ,, (8 + 13=) | 21 | යි. |
| ,, | 8 | ,, | ,, | ,, (13 + 21=) | 34 | යි. |

යනාදි වශයෙනි.

**අධ්වයොගය.**

'අධ්වයොගය' නම් ඡන්දසක් ප්‍රස්තාර කිරීමට වුව මනා භූමියෙහි ප්‍රමාණය නියවය කර ගැණීමට ඉවහල් වන ක්‍රමයයි. කඩදාසි, පෑන්, පැන්සල් ආදි ලිපිද්‍රව්‍ය සුලභ වූ මේ කාලයෙහි එය දැනීමෙන් වැඩි ප්‍රයොජනයක් නො ලැබේ. වුව මනා ම නම් **වෘත්තරත්නාකර සරලාව්‍යාඛ්‍යාවෙන්** උගත යුතුයි.

**ෂට්ප්‍රත්‍යය සමාප්තයි.**

——)o(——

**28. අර්:—** (මාත්‍රා සංඛ්‍යා වශයෙන්) තිහ පටන් සිවුසාළිස අවසන් කොට ඇති ඡන්දසුන් ප්‍රස්තාර කරමින් ඡන්දස් පිළිබඳ දහස් ගණන් වෘත්ත දත යුතු යි.

**විස්තර:—** මේ ගීයෙන් ගීතින්හි අඩි දෙකෙහි ලැබෙන මාත්‍රා සංඛ්‍යාව නියත කොට දක්වති. ඉතා අඩු ගණනක් මාත්‍රා ඇති ගී සඳසෙහි අඩි දෙකෙහි ලැබෙන්නේ මාත්‍රා තිහකි. ඉතා වැඩි ගණනක් ඇති සඳසෙහි ලැබෙන්නේ සිවුසාළිසකි (24 වැනි පිට බලනු) ඒ මාත්‍රා සංඛ්‍යා ඇති ගීතිච්ඡන්දසුන් යට කී සේ ප්‍රස්තාර කළ විට වෘත්ත කෙළ ගණන් ලැබේ.

යට "ගිය පෙර පසු දෙකඩ" යනාදීන් ගීසඳස් ප්‍රස්තාර කිරීමෙහි දී අඩි දෙක වෙන වෙන ගත යුතු යයි කී නමුත් මේ ගීයෙන් හැඟෙන්නේ ගීයෙහි උභයාඩියෙහි ඇති සියලු මාත්‍රා එක් කොට එක ඡන්දසක් වශයෙන් ගත යුතු බව යි. උභයාඩිය එක ම ඡන්දසෙහි එක ම පාදයක් වශයෙන් ගණිතොත් ප්‍රස්තාරය ද පාදවශයෙන් හෝ අඩිවශයෙන් හෝ නො කොට සම්පූර්ණ

* වසන් කොරෙන් සඳහට.

## සිවුපද ලකුණු.

**29. ගණ සකි වසම් කිසි - එම මත් සම කරත් හොත්,**
**සම එළි විරම්පද වුව - සිවුපද නමැයි දන්නේ.**

---

වශයෙන් ම කට යුතු ය. මෙහි මෙ තැන ද ව්‍යාකූල බව මෙයින් පැහැදිලි ව පෙණේ.

ගීතිලක්ෂණ සමාප්ත යි.

---

**29.** අර්ථ:—කිසියම් වෘත්තයක් ගණ වශයෙන් හෝ (වර්ණ) සඞ්ඛ්‍යාවෙන් හෝ විෂම වුව ද, ඒ වෘත්තය මාත්‍රා සම කොට කරතොත්, එසේ ම සමාන වූ එළි හා විරාම හා පද හා වුවොත් සිවුපද නමැයි දත යුතු.

**විස්තර**:— මෙ ගීයෙන් සිවුපද පිළිබඳ සාමාන්‍ය ලක්ෂණ දක්වන ලදී. එළි සම කොට සිවුපදයෙහි ම විරාමස්ථාන එක් සමාන කොට මාත්‍රාසඞ්ඛ්‍යාවෙන් සමාන පාද ඇති කොට බැඳීම සිවුපදයෙහි සාමාන්‍යලක්ෂණයි. ඒ සිව්පදයන්හි එක් පාද යෙක්හි ගණ, ගුරුලඝු, වර්ණ සඞ්ඛ්‍යා අනික් පාදයන්ට වඩා වෙනස් විය හැකි ය. එහෙත් පාද සතරෙහි ම එක් සමාන මාත්‍රා ගණන් ඇතිවිය යුතු ය.

“පවි රද ‘සඳ නා’ ලෝ මුල් දිගතු බ ර
ලෙවි තුරු ‘සුසැදූ’ යස මිණිමුතු මල්පත ර”

මේ සිව්පද අඩෙහි ප්‍රථම පාදයෙහි ගණ යෙදුනු සේ ද්විතීය පාදයෙහි නො යෙදුනේ ය. ප්‍රථම පාදයෙහි මූල බගණයෙන් පර ව යෙදුනේ සගණයයි. එහෙත් ද්විතීය පාදයෙහි ඒ ස්ථාන යෙහි යෙදුනේ තගණයයි. මෙසේ සෙසු ගණ ද විෂම වේ. ප්‍රථම පාදයෙහි (අවසාන රකාරස්ථ ‘අ’ යන්න ද ගුරක් සේ ගැණෙන හෙයින්) ගුරු අකුරු පසකි. දෙවෙනි පාදයෙහි ගුරු අකුරු දෙකකි. එහෙයින් දෙපදෙහි අක්ෂර සඞ්ඛ්‍යාව ද විෂම වේ. මෙසේ ගණ වර්ණ විෂම වුවත් දෙපදෙහි ම සමාන මාත්‍රා සඞ්ඛ්‍යාවක් ඇති හෙයින් මේ මාත්‍රාසමවෘත්තයෙකි. යති හා එළි සම හෙයින් සිවුපදයකට අයත් දෙපදයෙකි. වර්ණ සම වෘත්ත ගණ වර්ණ මාත්‍රා සම කොට බැදිය යුතු ය. ‘ගණ සම කොටින් බඳනෝ’ යි මතු කියනු ලබන්නේ ඒ වෘත්ත සඳහා යි.

30 ගුරෙක් දෙමත් පටන් - තුදුස් ගුරු විසිඅට මත්,
කොළ දනු සඳස් පිළිවෙළ-මෙසෙසින් නම් සිවුපෙදේ.

31. සඳ සිරි මැදුම් නම් - පිහිටි සුපිහිටි උතු නම්,
සෙල් ගජ රැඳි රවුළු නම්-තෙනෙත් හිරු මී මදු නම්.

---

**30.** අර්ථ:— එක් ගුරක් හෝ මාත්‍රා දෙකක් පටන් ගුරු දස සතරක් හෝ මාත්‍රා විසි අටක් කෙළවර කොට ඇති සිව් පදයන් පිළිබඳ ඡන්දසුන්ගේ නම් පිළිවෙළින් මේලෙසින් දත යුතු ය.

**විස්තර**:—සිව්පද සඳස්හි ඉතා අඩු වර්ණ හෝ මාත්‍රා ඇති ඡන්දසට එක් (ගුරු) අකුරක් හෝ මාත්‍රා දෙකක් ඇති බවත් ඉතා දික් සිව්පද සඳසට (ගුරු) අකුරු තුදුසක් හෝ මාත්‍රා විසිඅටක් ඇති බවත් මෙයින් දක්වන ලදී.

**31.** අර්ථ:— සඳ ය, සිරි ය, මැදුම් ය, පිහිටි ය, සුපිහිටි ය, උතු ය, සෙල් ය, ගජ ය, රැඳිය, රවුළු ය, තෙනෙත් ය, හිරු ය, මිහි ය, මදු ය යනු තුදුස් සඳසුන්ගේ නාමයෝ යි.

**විස්තර**:—මේ එක් එක් නාමයකින් ඡන්දස් තුණක් බැගින් ගත් බව සිතීමට කරුණු තිබේ.

ඒ මෙසේ යි.—

| අක්ෂර සංඛ්‍යා | | | | | නාමය | | වෘත්ත සංඛ්‍යා |
|---|---|---|---|---|---|---|---|
| 1 | අක්ෂර | 1 | ක් | ඇත්තේ | සඳ | ඡන්දසයි. | 2 |
| 2. | ,, | 2 | ක් | ,, | සිරි | ,, | 4 |
| 3. | ,, | 3 | ක් | ,, | මැදුම් | ,, | 8 |
| 4. | ,, | 4 | ක් | ,, | පිහිටි | ,, | 16 |
| 5. | ,, | 5 | ක් | ,, | සුපිහිටි | ,, | 32 |
| 6. | ,, | 6 | ක් | ,, | උතු | ,, | 64 |
| 7. | ,, | 7 | ක් | ,, | සෙල් | ,, | 128 |

යනාදි වශයෙන් වර්ණච්ඡන්දස ඉගැන්වූහ. අනන්තර ගීයෙන් කියනු ලබන 2. 4. 8 යනාදි වෘත්තසංඛ්‍යා ලැබෙන්නේ වර්ණ ච්ඡන්දස ප්‍රස්තාර කළ කල්හි ම ය.

32. දෙ සතර අට සොළොස්-බතිස්සිව්සැට බවනෙන්,
දිගුණු දිගුණු විරිත් මේ-ගණ සම කොටින් බඳනේ.

33. දෙමත් පටන් පිළි-අටවිසි මත් වසන් කොට,
නන් විරිතින් බඳුයේ-සිව්පද දෙපද ඈ වේ.

---

එසේ ම:—

| | | | | | | | වෘත්ත සංඛ්‍යා. |
|---|---|---|---|---|---|---|---|
| 1 | මාත්‍රා | 1 | ක් | ඇත්තේ | සඳ | ඡන්දසයි. | 1 |
| | ,, | 2 | ක් | ,, | සඳ | ,, | 2 |
| 2 | ,, | 3 | ක් | ,, | සිරි | ,, | 3 |
| | ,, | 4 | ක් | ,, | සිරි | ,, | 5 |
| 3 | ,, | 5 | ක් | ,, | මැදුම් | ,, | 8 |
| | ,, | 6 | ක් | ,, | මැදුම් | ,, | 13 |
| 4 | ,, | 7 | ක් | ,, | පිහිටි | ,, | 21 |
| | ,, | 8 | ක් | ,, | පිහිටි | ,, | 34 |
| 5 | ,, | 9 | ක් | ,, | සුපිහිටි | ,, | 55 |
| | ,, | 10 | ක් | ,, | සුපිහිටි | ,, | 89 |

යනාදි වශයෙන් මාත්‍රාඡන්දස් දෙකක් දෙකක් එක් එක් නමින් ගන්නා ලදී. ඒ බව උතු, ගජආදි ඡන්දස්හි දක්වනලද වෘත්ත යන්ගේ මාත්‍රා සංඛ්‍යා ගැණ බැලූ කල පැහැදිලි වේ.

32. අර්ථ:— වෘත්ත දෙකෙක, සතරෙක, අටෙක, සොළොසෙක, දෙතිසෙක, සිව්සැටෙක යන භාවයෙන් ද්විගුණ ද්විගුණ වූ මේ වෘත්ත ගණ සම කොට බැඳිය යුතු ය.

**විස්තර**:— වර්ණ ප්‍රධාන ඒ ඒ ඡන්දස් ප්‍රස්තාර කළ විට ලැබෙන වෘත්ත සංඛ්‍යා මෙයින් දක්වන ලදී. මාත්‍රා නො ව ගණ යන් සම කොට බඳිනු ලබන්නේ ද වර්ණවෘත්ත යි. සතර පද යෙහි ගණ සම වූ විට ගුරු ලඝු වර්ණ ද සමාන වේ. වර්ණ වෘත්ත විභාගය කළ නමුත් වෘත්තලක්ෂණ දැක්වීමෙහි දී මාත්‍රා වෘත්තලක්ෂණ ම බෙහෙවින් දක්වන ලදී. **සඳ** ඡන්දසෙහි **සිරි** විරිත ද, **සිරි** ඡන්දසෙහි **බිඳු** විරිත ද යන දෙක වර්ණ වෘත්තයයි විකල්පයෙන් කිය හැකි වේ.

33. අර්ථ:— නැවත මාත්‍රා දෙක පටන් මාත්‍රා විසිඅට අවසන් කොට ඇති නොයෙක් වෘත්තයන්ගෙන් බඳනාලද්දේ සිව්පද දෙපද යනාදිය වේ.

**34. කිසිවෙක් සමගණ වේ-මත් සම වේ කිසිවෙක්,**
**පසු පෙර පද දුබල වේ-කිසි අතුරැ පද බිලි වේ.**

**35. බිලි වතුදු ලකුණු-සතර පෙදෙන් කිසිවක්,**
**කියම් ගුරුලුහු ඈ නියමින්-සවණෝ 'නේ කිවින් සැන්.**

**1. සඳ.**

**36. සතරපෙදෙකි සතර-ගුරක් ම ලා බඳ හොත්,**
**'සිරි' විරිත් නම් වේ-නිදසුන් එයට මේ වේ.**

---

**විස්තර:—** මෙයින් දක්වනලද්දේ මාත්‍රාවෘත්ත යි. ඡන්දස් පටන් ගැණෙන්නේ මාත්‍රා එකෙහි පටන් වුවත් එය මෙහි නො දක්වන ලද්දේ ඒ මාත්‍රා එකක් ඇති ඡන්දසෙහි එක ම වෘත්ත යක් හෙයින් හා එ ද ඒකාක්ෂරච්ඡන්දසෙහි සර්ලඝුවෘත්තය වශ යෙන් ලැබෙන හෙයිනුත් ය.

**34. අර්ථ:—** (ඒ වෘත්තයන් අතුරෙන්) සමහර වෘත්ත සමාන වූ ගණ ඇති වේ. (සතර පාදයෙහි ම ගණ එක සමාන ය යනු භාවයි). සමහර වෘත්ත මාත්‍රාවශයෙන් සමාන වේ. සමහර වෘත්තයන්හි පූර්වපශ්චිම පාද (මාත්‍රා-වර්ණ ඌන වීමෙන්) අන්තඃ පාදයන්ට වඩා දුබල වේ. අන්තඃපාද හෙවත් දෙවෙනි තුන් වැනි පාද (මාත්‍රාවර්ණ අධික වීමෙන්) පූර්වපශ්චිම පාදයන්ට වඩා බලවත් ද වේ.

**විස්තර:—** පසු පෙර පද දුබල හෝ පබල වන්නේ විෂම වෘත්තයන්හි ය. ඒ වෘත්තයන්හි පාද සතර ගණවශයෙන් හෝ මාත්‍රා වශයෙන් හෝ සමාන නො වේ. පූර්වාර්ධය හා පශ්චිමාර්ධය සම වන්නේ අර්ධසම වෘත්තයන්හිය. සෙස්සෝ සමවෘත්තයෝ යි.

**35. අර්ථ:—** සතර පාදයෙන් කිසියම් පදයක් මාත්‍රා අධික වීමෙන් බලවත් වුවත් ගුරු ලඝු ආදි නියමයෙන් ලක්ෂණ කියමි. එය කවිසමූහයාගේ කන්හි බහනු මැනව.=(ඇසිය යුතු).

**විස්තර:—** 'ගුරු ලුහු ඈ' යන තන්හි 'ඈ' සදින් මාත්‍රා, යති, එළි යන මේ ගැණේ.

සිවුපද ලකුණු.

**36. අර්ථ:—** පහසු යි. නිදර්ශන:—

" කා. මී. තා. ශී. "

**විස්තර:—** මෙහි 'කා' යනු එක් පාදයෙකි. 'තා' යනු ද එකකි. මෙහි එළිසමයෙක් නො පෙණේ. ඒකාක්ෂරයෙන් ම

## 2. ඔරි.

**37. ලුහු ගුරු දෙකින් බඳ-'බිඳු' නම් විරිත් දන්නේ,**
**ඔවමත් කොමින් බඳ හොත්-'මියුලු' නම් වේ හෙ මෙසේ.**

## 3. මැදුම්.

**38. සගණින් ඔවපද-වුව හොත් 'තලා' නම් වේ,**
**සමතිනි බඳ එම-'අතිළුනු' * නමැයි දන්නේ.**

---

ඡන්දස් පටන්ගන්නා හෙයින් එකාක්ෂර වෘත්තයක් දක්වන ලද නමුත් එබඳු වෘත්තයෙන් බැඳි පද්‍ය කාව්‍යයන්හි නො පෙණේ.

පැරණිසන්නයෙහි දක්වන ලද සඞ්ඛ්‍යානය සාවද්‍ය ය. ඒ ඒ ඡන්දස් ප්‍රස්තාර කළ විට ලැබෙන වෘත්ත සඞ්ඛ්‍යාව සොයා ගැණීමට උපදෙශ යට දක්වා ඇත. විෂමවෘත්ත පිළිබඳ සඞ්ඛ්‍යානය වෘත්තරත්නාකර සරලා ව්‍යාඛ්‍යාවෙන් උගත යුතු.

**37.** අර්ථ:— පහසුයි. 'ලුහු ගුරු දෙකින් බඳ' යි කියන ලද්දේ එක් පාදයක ලක්ෂණයි.

සමවෘත්තයන්හි පාද සතර සමාන හෙයින් එක් පාදයක පමණක් ලක්ෂණ කියනු ලැබේ. ඒ පාදය චතුරාවෘත්ත කළ විට සිව්පදය ලැබේ. සෙස්සෙහි ද මෙසේ යි.

බිඳු විරිතට නිදසුන්:—

දූ නේ — අ නේ
දි නේ — දි නේ.

මියුලු විරිතට නිදසුන්:—

මෙ සතර — නම සර
මෙ සසර — දුරු කර.

විස්තර:— මෙයින් බිඳු විරිත මාත්‍රා තුණක් නොහොත් වර්ණ දෙකක් ඇති සිරි සඳසට ද, මියුලුවිරිත මාත්‍රා සතරක් ඇති සිරි සඳසට ද අයත් ය.

**38.** අර්ථ:— සගණයෙන් ම පාද සතර වුවොත් තලා (=ඝලක) නම් වෘත්තය වේ. මාත්‍රා සයකින් බඳනාලද ඒ වෘත්තය අතිළුන නම් වේ.

තලා විරිතට නිදසුන්— හොවු ලි — සර ලි
එ ම ලි — මැසි ලි

---

* එම උනු අති උනු.

**39. සගණ දෙකින් බඳ-සිව්පද 'හසගැමි' නම්,**
**අටමතිනි බඳ හොත්-'පියුමකර' නම් හෙ මෙසේ.**

---

අතිළකු විරිතට නිදසුන්:—

**සපුදුනු කෝ — කෝ පුව කෝ**
**නල දවෑ කෝ — දිවි නොරැ කෝ**

**විස්තර**:— මේ විරිත් දෙක අතුරෙන් 'තලං' විරිතෙහි එක් පාදයක වන්නේ අකුරු තුණකි. ඒ ද සගණය හෙයින් මාත්‍රා සතරකි. මෙය මාත්‍රාවෘත්තයක නිදසුනක් වතොත් මේ ඡන්දසට නො ව මීට මුලින් වූ සිරි ඡන්දසට අයත් විය යුතු ය. එහෙයින් මෙය මැදුම් නම් වර්ණච්ඡන්දසට අයත් උදාහරණයෙකි. **අතිළකු** විරිත මාත්‍රා සයක් ඇති මැදුම් සඳසට අයත් විරිතකි. මාත්‍රා පසක් ඇති මැදුම් සඳසට අයත් වෘත්තයක් මෙහි නො දක් වන ලදී.

" අසන් නෝ — දහම් නෝ
ලබන් නෝ — සැපත් නෝ"

යනු ත්‍රිවර්ණ වූ හෝ පඤ්චමාත්‍ර වූ මැදුම් සඳසට අයත් වෘත්ත යෙකි. සෙසු මෙබඳු තන්හි උදාහරණ තමන් විසින් යොදා ගත යුතු සි.

39. **අර්ථ**:— සිව්පදය ම සගණ දෙකින් බඳනාලද්දේ **හංසගාමි** නම් වෘත්තය වේ. (ගුරු ලුහු නියමය නැති ව) මාත්‍රා අටකින් බැන්දෙත් ඒ විරිත **පද්මාකාර** නම් වේ.

හසගැමි විරිතට නිදසුන්:—

**මලගා සම ගා — සුලගා වෙ ල ගා**
**මලගා සර ගා — මලගා එ ල ගා.**

පියුමකර විරිතට නිදසුන්,—

**විදමිනි සිකි පි ල් — නවා නෙතුරැ මු ල්***
**නරංග සැදි ව ල් — වනන්ට වෙ නො ක ල්**

මේ වෘත්ත දෙක ම මාත්‍රා අටක් ඇති ඡන්දසට අයත් ය. වර්ණ වෘත්ත වශයෙන් ගණිතොත් **හසගැමි** විරිත සයවැනි වර්ණච්ඡන්දසට අයත් සමවෘත්තයකි. **පියුමකර** විරිතට දැක්වූ නිදසුන නම් සයවැනි වර්ණච්ඡන්දසට අයත් සමවෘත්තයෙකි.

---

* නැසී ම සතු මුල්.

## 5. සුපිහිටි.

40. දන දෙගණ ගුරු මත්-ඇමපද විරම් වේ නම්, *
විරිත් ශෙව්යත්සර-දනු නිදසුන් මෙසේ වේ.

41. නනද මෙ තුන් ගෙණෙන්-බඳ තිරියත්සර නම්,
දසමත්නි බඳ හොත්-සාඳ නම් විරිත් මෙ වේ.

---

**40.** අර්ථ:— දගණ, නගණ යන දෙගණයෙන් පරවූ ගුරකින් හා මාත්‍රා (ලඝු=)වකින් පර ව සියලු ම පාදයන්හි විරාමය වේ නම් ශෙව්යත්සර විරිතැයි දත යුතු යි.

නිදසුන් මෙසේ යි:—

"සඳ ය නුබ ස ද ය—ම ද ය සර ම ද ස
සඳ ය සඳ ම ද ය—ස ද ය වන ස ද ය"

**විස්තර:**—මේ වනාහි මාත්‍රා දහයක් ඇති ඡන්දසෙහි වෘත්තයෙකි. වර්ණවෘත්තයක් වශයෙන් අටවැනි ඡන්දසෙහි වෘත්තයෙකි. සතරපදය සම්ප්‍රකාරයෙන් ම සමාන ය. සමහරු මෙහි මාත්‍රා නවයකින් පර ව යතිය වේතැයි කියති. පාදාන්තයට ඉතා ආසන්නයෙහෙයින් ඒ යතිස්ථානයක් නො වේ.

**41.** අර්ථ:— නගණ නගණ දගණ යන මේ තුන් ගණයෙන් බඳනාලද්දේ තිරියත්සර නම් විරිත වේ. (ගුරු ලඝු නියමයක් නැති ව) මාත්‍රා දශයකින් බඳ හොත් ඒ මේ වෘත්තය සාඳ (ඛඤ්ජා) නම් වේ.

තිරියත්සර විරිතට නිදසුන්:—

"බමර මොනර කු ලි ය
සුවඳ සුලග බ ලි ය
එලඳ බොලඳ ස ලි ය
වසඳ මෙසඳ කු ලි ය"

සාඳ විරිතට නිදසුන්:—

"සිසිසර දිග පැහි රි
රාමන අන බැහැ රි
මැසි දුන් දනා හි රි
වනනැස් දමින් පි රි"

**විස්තර:**— මේ දෙක්හි යතිය පාදාන්තයෙහි ය. තිරියත්සර විරිත නවවැනි වර්ණච්ඡන්දසෙහි වෘත්තයක් ලෙස ද සැලකිය හැකි ය.

---

* අටපද විරමු වී නම්; නවමනිසැමපද විරම්.

## 6. උතු.

42. නගණ දෙකින් බගණ-ගුරින් මෙසේ බඳ හොත්,
අරි විරිත් නම් වේ-බිඟුවෙණ සගණ තුණකින්.

43. සනද මෙතුන් ගෙණෙන්-පස්මතෙකින් සැහපුම්,
බුජඟයා නම් වේ-බර මතිනි වෙහෙළුලැගී.

---

42. අර්ථ:—නගණ දෙකකින් හා බගණයකින් ද ගුරකින් ද යි මෙසේ බැන්දෙත් අරි (=ආර්‍යා) වෘත්ත නම් වේ. සගණ තුණකින් බඳනාලද්දේ බිඟුවෙණ(=භෘඞ්ගවීණා)නම් වෘත්තය වේ.

අරි විරිතට නිදසුන්:—

මෙහෙසුරු වැර*දී නැමිසා-සුරගුරු පැණ දී නෙමියා
දිවසුරු තෙද දී බිමියා-බඹ නව දිය දී නිමියා†.

බිඟුවෙණ විරිතට නිදසුන්:—

"සමතුන් සමතන් සර හා-බමරුන් ගිගුරුම් සර හා
සරහා සර පන් සර හා-වියොවුන් බිය වන් සර හා"

විස්තර:— විරිත් දෙකෙහි ම යතිය පාදාන්තයෙහි ය. අරි විරිත දශාක්ෂරච්ඡන්දසට අයත් වර්ණ වෘත්තයක් සේ ද, බිඟුවෙණ විරිත නවාක්ෂරච්ඡන්දසට අයත් වෘත්තයක් සේ ද ගත හැකි යි. එසේ ඇති කල්හි ද දෙකෙහි ම මාත්‍රා සඞ්ඛ්‍යාව දෙළොස හෙයින් එකම මාත්‍රච්ඡන්දසට ඇතුළත් කරණ ලදී.

43. අර්ථ:— සගණ නගණ දගණ යන මේ තුන් ගණයෙන් යුක්ත වූ ද මාත්‍රා පසකින් හෙවත් නගණයෙහි මූල ලඝුවෙන් පර ව වූ යතියෙන් යුක්ත වූ ද වෘත්තය බුජඟයා (=භුජඞ්ගප්‍රයාත) නම් වේ. වාදස (=12) මාත්‍රාවකින් බඳනාලද්දේ වෙහෙළුලැගි නම් වේ.

බුජඟයා විරිතට නිදසුන්:—

"මි යු ලි නි, වෙන ස ලි නි-සුපුලී නී, වනමලි නී,
කොවුලිනි, මන කු ලි නි-පියැලිනි, එහි මලි නි.

වෙහෙළුලැගි විරිතට නිදසුන්:—

"නොප කෙරෙ මා නැත ද ඔබා-සොයා දිවිම් මෙමම මොබා
ගිසෝතිනුත් මා නො ල බා-එවාසියන්නෙම් ම ඔ බා"

විස්තර.— කොමා ලකුණෙන් දක්වන ලද්දේ යතිස්ථානයි. බුජඟයා විරිතෙහි මාත්‍රා එකොළොසකි. එහි අකුරු නවයක්

---

* දිය. † බිම්යා.

44. සමතින් විරම් කොමල-පෙදෙන් බඳ වසත් නම්,
දසමත් ගුරින් බඳුයේ-සොන් මත් වැලය හෙ මෙසේ.

---

ඇති වර්ණච්ඡන්දසට ද අයත් විය හැකි ය. සංස්කෘතච්ඡන්දසෙහි භුජඞ්ගප්‍රයාත වෘත්තය යගණ සතරකින් යුක්ත වේ. වෙහෙළු ලැගි විරිතෙහි ගුරු ලඝු නියමයක් නැත. සියලු පාදයන්හි මාත්‍රා දොළස බැගින් වේ. එහි යතිය පාදාන්තයෙහි ය.

44. **අර්ථ**:— මාත්‍රා සයකින් විරාමය වේ ද, කොමලපදයන් ගෙන් බඳනාලද ඒ වෘත්තය **වසත්** (=වසන්ත) නම් වේ. මාත්‍රා දශයකින් පර ව ගුරකින් යුක්ත කොට බඳනාලද්දේ **සොන් මත් වැල** නම් වේ.

**වසත්** විරිතට නිදසුන්:—

**"රැඳි අඳනින්, දිගුනුව නිය *-සිතෙනි සසල, තඹලව නිය**
**රන්පෙණෙලෙන්, සලසවනිස -සොම්සිසිවන්, සොම්වුව නිස"**

කාව්‍යශේඛරයෙහි හතරවැනි සගීයෙහි තවත් නිදසුන් පෙණේ.

**සොන්මත්වැල** විරිතට නිදසුන්:—

**"මිණිමොර මී පිරුණු [1] පනා-අනෙක අනෙක හිගුරු සැනා**
**බිබී බිබී සුරාම නා-සිසි තුවින් පුරාමැ නා.[2]"**

**විස්තර**:— වසත් විරිතට මාත්‍රා දොළසකි. ඒ බව වාදශ මාත්‍රිකච්ඡන්දසට ඇතුළත් කිරීමෙන් ම හැගේ. එහි මාත්‍රා සයකින් පර ව පාදමධ්‍යයතිය වේ. පාදයෝ කොමල වෙති. අන්තයෙහි ගුරක් නො යෙදේ. එසේ නුවූවොත් **සොන්මත් වැල** විරිත වේ. **සොන්මත් වැලෙහි** නියමින් ම එකොළොස් වැනි දොළොස් වැනි මාත්‍රා දෙක එක් කොට ගුරක් කළ යුතු ය. ඊට මුලින් යෙදෙන මාත්‍රා දහය කැමැති පරිද්දකින් ගුරු ලඝු මිශ්‍ර කොට යෙදිය හැකි ය. එසේහෙයින් සොන්මත්වැලෙහි පාදවශයෙන් ලැබෙන්නේ වාදශමාත්‍රිකච්ඡන්දසෙහි අන්ත්‍යගුරු වෘත්තයකි. සොන්මත්වැලට දුන් නිදසුනෙහි විතීය තෘතීය පාදාදියෙහි තිබෙන යමකය ගැණ ද සිතිය යුතු ය. ලක්ෂණ කථනයෙහි දී එබන්දක් නො කියන ලද නමුදු, ඡන්දසට එය අයත් නො වන නමුතුදු, මෙබඳු අතික් වෘත්තයන්ගෙන් මෙය වෙනස් කිරීමට එය ද එක් හෙතුවක් වෙතැයි සිතිය හැකි ය. සොන්මත් වැලෙහි යතිස්ථාන නො කී නමුත් මාත්‍රා සයකින් සයකින් ඒ වේ යයි සිතිය හැකි ය.

---

* නි. 1. මිණිබුරු මීපිපි. (මිණිමොරරුවරරහ-ධම්ප්‍රදීපිකා)
2 කොවින් සුරාමැනා.

**45. සමමතෙයම වසම්-ලකුණු දුට * සුරමත්වැල,**
**දසමත්ගුරින් බඳුයේ × -උවදෑ නමැයි දන්නේ.**

**46. කෙළන ගුරු තියකින්-නැතන් තැන ගුරු නියමෙක්,**
**මින් ගති නමැයි දන්නේ-නිදසුන් එයට මේ වේ.**

---

**45. අර්ථ:—** (යම්විරිතක) ඒ යොන්මත්වැල විරිතට සමාන මාත්‍රා හා විෂම වූ ලක්‍ෂණ දක්කොත් එය සුරමත්වැල ය යි දත යුතු. මාත්‍රා දශයකින් හා ගුරකින් බඳනාලද්දේ උපජාති නමැයි දතයුතු.

සුරමත්වැලට නිදසුන්:—

“එකත ද මා රමන් න මා
එකත කවුරු තුනන් න මා
සතුටු කොපින් මෙහෙල් න මා
එවස් මකිල් නිමල් න මා”

**උවදූ විරිතට නිදසුන්:—**

**“මේ කුම් නම් වේ උපැ තී–සඳ කලු පලු මේ රුවැ නී**
**දනෝ මහා නිරු සෙ තී–සඳ හා හිගුලෙන් වන නී”**

**විස්තර:—** යොන්මත්වැල, සුරමත්වැල යන දෙකෙහි වෙනස කවරේ ද? යොන්මත්වැලෙහි මාත්‍රා සයකින් යතිය වන බව නිදසුනෙන් පෙණේ. සුරමත්වැලෙහි එවැන්නක් නැත. විරිත් දෙක වෙනස් වන්නේ මෙයිනි.

උවදූ යොන්මත්වැල විරිත් දෙකෙහි වෙනස කුමක් ද? යොන්මත්වැල වනුයේ විතීය තෘතීය පාදදියෙහි යමකය ඇතිකල්හි ය. උපජාතියෙහි එවැන්නක් නැත. විරිත් දෙකෙහි වෙනස වන්නේ මෙපමණකිනි. නොහොත් යමකය ගැණ නො සලකාතොත් යොන්මත්වැල, උවදූ යනු එක ම වෘත්තයට ව්‍යවහාර කරණු ලබන නම් දෙකකි.

සංස්කෘතවඡන්දසෙහි උපජාති නාමයෙන් ගන්නා ලද්දේ පාදසතරෙහි එක ම ලක්‍ෂණ නැති අඩි සම වූ හෝ විෂම වූ වෘත්ත විශෙෂයකි.

**46. අර්ථ:—** යම් විරිතක අවසානයෙහි ගුරුත්‍රයක් වේ ද, එයින් අන් තන්හි ගුරුනියමයෙක් නැද් ද, ඒ විරිත මින්

---

* බරමත් එය වසම් ලකුණු බඳ. × මෙ ද ගුරු තෙරතින් මුසු.

## 7. සෙල්.

**47. සිව්මත් ගුරින් විරම්-පුන සිව්මත් දෙගුරින්,**
**විරම් කොට්න් බඳ හොත්-නළිගාහ නම් හෙ මෙසේ.**

---

ගති නමැයි දතයුතුයි. ඊට නිදසුන් මෙසේයි:—

"දුර මැගි මේ කුල් ලා හා-පැහැසර සියුමැල් ලා හා
කොළනා ගවපොල්ලා හා-දුමුහු එ මිපල් ලා හා"

(කාව්‍යශෙඛර. 4 සගී, 14 කාව ද බලනු)

විස්තර:— මේ විරිත කොටස් දෙකකට බෙදේ. එයින් අග කොටස වූ ගුරු අකුරු තුණ කිසිවිටෙක වෙනස් නො වේ. ඊට මුලින් යෙදෙන අතික් මාත්‍රා සය ෂණ්මාත්‍රවිජඤ්ඤ මෙන් තෙළෙස් අයුරකින් යෙදේ. ඒ මෙසේ යි.

| මාත්‍රා සය. | ගුරු තුණ. | |
|---|---|---|
| ◡ ◡ ◡ | ◡ ◡ ◡ | 1 |
| — — ◡ ◡ | ◡ ◡ ◡ | 2 |
| — ◡ — ◡ | ◡ ◡ ◡ | 3 |
| ◡ — — ◡ | ◡ ◡ ◡ | 4 |
| — — — — ◡ | ◡ ◡ ◡ | 5 |
| — ◡ ◡ — | ◡ ◡ ◡ | 6 |
| ◡ — ◡ — | ◡ ◡ ◡ | 7 |
| — — — ◡ — | ◡ ◡ ◡ | 8 |
| ◡ ◡ — — | ◡ ◡ ◡ | 9 |
| — — ◡ — — | ◡ ◡ ◡ | 10 |
| — ◡ — — — | ◡ ◡ ◡ | 11 |
| ◡ — — — — | ◡ ◡ ◡ | 12 |
| — — — — — — | ◡ ◡ ◡ | 13 |

මේ තෙළෙස් ආකාරයට වඩා වෙනස් අයුරකින් මේ වෘත්ත යෙහි කිසි ම පාදයක් යෙදිය නො හැකි ය.

47. අර්ථ:—(යම් විරිතක්) මාත්‍රා සතරකින් පර ව යෙදුනු ගුරකින් මත්තෙහි විරාමය ද, නැවත මාත්‍රා සතරකින් පර ව යෙදුනු ගුරු දෙකකින් මත්තෙහි විරාමය ද කොට බැන්දෙත් එය නළිගාහ නම් වේ. නිදසුන් මෙසේ යි:—

"සුරමැති යි, මුසලඩියා හා-මෙ දසඹුලි, තිසුලවියා හා
උම්දු සි යි, විදුරවියා හා-නට දිය දේ, නුවනවියා හා"

48. නගණ සතර කෙළන-ගුරක් ම ලා බඳ හොත්,
යති සත්මතින් වූයේ-මිණිපොකුරු නම් එහ මෙසේ.

49. බගණ යගණ සිටිය-පස්මතෙකින් මත්තේ,
සවන ගුරින් යති වත්-කනිල් නමැයි දන්නේ.

---

**විස්තර:**— මේ වෘත්තය කොටස් සතරකට බෙදිය හැක්ක. එසින් මුල් කොටස මාත්‍රා සතරකි. එය පස් අයුරකින් යෙදිය හැකි ය. දෙවෙනි කොටස නම් ගුරු අකුර ය. එය වෙනස් කළ නො හැක්ක. තුන්වැනි කොටසෙහි ද මාත්‍රා හතරක් හෙයින් එහි ද භෙද පසකි. සිව්වැනි කොටසෙහි ගුරු දෙක ද වෙනස් කළ නො හැක්ක. පළමුවැනි තෙවෙනි කොටස්වල ඇති භෙද සඛ්‍යා එකිනෙක ගුණ කළ විට භෙද පස්විස්සක් ලැබේ ඒ වනාහි මේ මාත්‍රාවෘත්තයෙහි පාදයක් සිටියහැකි පස්විසි ආකාරය යි.

**එක් එක් පාදය** මෙසේ පස්විසි අයුරකින් යෙදිය හැකි හෙයින් පාද සතර (25 × 25 × 25 × 25=)390625 අයුරකින් යෙදිය හැකි යි.

**48. අර්ථ:**—(යම් විරිතක්) නගණ සතරකින් මත්තෙහි ගුරක් ම ලා බැන්දෙත් මාත්‍රාසතකින් පර ව යතිය වූ ඒ විරිත **මිණිපොකුරු** නම්.

නිදසුන් මෙසේ යි:—

"පැහැ පැතිර නැඟි, මෙසඳ ගුව නා
සහ ඛසුරු* බර, වහන පව නා†
වැජඹි මදළුදු, යවණ ෂතාව නා
තවද සඳ මැයි, ම දෙස ගහ නා"

**විස්තර:**— 'පැහැපැ- තිරනැ- ඟි මෙස- දගුව' යනු නගණ සතර යි. 'නා' යනු ගුරයි. අතික් පාදයන්හි ද මෙසේ යි.

**49. අර්ථ:**— පස්මතෙකින් මත්තෙහි බගණය හා යගණය සිටියොත් එසේ ම සයවැනි ගුරින් පර ව විරාමය වුවොත් **කනිල්** නම් වෘත්තය යි දතයුතු.

නිදසුන් මෙසේ යි:—

"සලා සිකි පිල්, මලග ළැ ග් ගේ
සඳ ද අත් ගල්, තෙලෙහි ළැ ග් ගේ
මහද තුළ මන්, යොන ද ළැ ග් ගේ
කිමෙක උන් මා, දෙස නො ළැ ග් ගේ"

**විස්තර:**— මෙහි 'සලාසිකි' යනු පළමුවන මාත්‍රා පසයි. "පිල්මල" යනු එසින් පර බගණයයි. "ගළැග්ගේ" යනු යගණ යයි. සෙසු පාදයන්හි ද මෙසේ යි. මුල මාත්‍රා පසක් ගත්

---

* ඉසුරු. † වසතමසනා.

**50. අටින් සයින් විරම්-තුදුස් මතින් බඳුයේ,**
**මිණිමල් නමැයි දන්නේ-නිදසුන් එයට මේ වේ.**

**8. ගජ.**

**51. විරම් දෙසෙන් පණර-මතින් මෙසේ බඳ හොත්,**
**සඳෙල් ගොළි නම් වේ-නිදසුන් එයට මේ වේ.**

---

හෙයින් ඊළඟට යෙදෙන බගණයෙහි මුල තිබෙන ගුරු සයවැනි ගුරු යි. අක්ෂර ගණනාවෙන් ගණිතොත් සමහරවිට මෙය සතර වැනි ද විය හැකි ය. —

මේ වෘත්තය කොටස් දෙකකට බෙදියහැකියි. පළමුවන කොටස නම් මාත්‍රා පඤ්චකය යි. දෙවෙනි කොටස නම් '⏑ –- — — ⏑ ⏑' යන බගණ යගණ දෙක යි. එයින් පළමුවැනි කොටස පඤ්චමාත්‍රිකාච්ඡන්දසෙහි වෘත්ත අට මෙන් අට අයුරකින් යෙදිය හැකි ය. දෙවෙනි කොටස වෙනස් නො වේ. එහෙයින් මේ වෘත්තයෙහි එක් පාදයක් අටඅයුරකින් සිවිය හැකි බව දත යුතු. එක් පාදයක හෙද අටක් හෙයින් සිව්පදය (8 × 8 × 8 × 8)=4096 අයුරකින් යෙදිය හැකියි.

**50** අර්ථ:— මාත්‍රා අටකින් ද නැවත සයකින් ද විරාමය ඇති, මාත්‍රා තුදුසකින් බඳනාලද වෘත්තය මිණිමල් නමැයි දතයුතු. ඊට නිදසුන් මෙසේ යි:—

"හළ ද බුලත ව　න, රන ලවන　න
මිණිමුතු 'පුල ප　න, පැහැ ගන නෙ　න
සිසිකැලුම්　ප　න, සිසි වන ව　න
එනිරිඳු මන නෙ　න, ගන පබ ව　න"

විස්තර:— මෙහි මුල මාත්‍රා අටින් පර ව වන්නේ පාදමධ්‍ය යතිය යි. ඊළඟ මාත්‍රා සයින් පර ව වන්නේ පාදාන්ත යතිය යි. එය නො කිව ද වරදක් නැත. මෙහි දක්වනලද වෘත්ත චතුර්දශ මාත්‍රච්ඡන්දසට අයත් ය. මුල මාත්‍රා අට හා අග මාත්‍රා සය වෙන් වශයෙන් ම ගතයුතු. මේ පිරිතෙහි අට වැනි මාත්‍රාව හා නව වැනි මාත්‍රාවත් එකතු ව කිසිවිටෙක ගුරක් නො වේ. යතිය නැබීමට නො හැකි වන හෙයිනි. එවිට මුල මාත්‍රා අටෙහි හෙද තිස්හතරක් ද, අග මාත්‍රා සයෙහි හෙද තෙළෙසක් ද ඒ දෙක එකිනෙක ගුණිමෙන් හෙද (34 × 13=442) හාරසිය දෙසාළිසක් ද ලැබේ. මෙය හතරවාරයක් එකිනෙක ගුණකළ විට සිව්පදයෙහි හෙද සඞ්ඛ්‍යා ලැබේ.

**51.** අර්ථ:— මාත්‍රා දශයකින් විරාමය වේ ද, මෙසේ

52. ලුහු සසින් දගණ-නගණ ගුරින් බඳ හොත්,
අටවැන්න යති වි නම්-දියකේලි නම් වන්නේ.

53. දෙසෙන් පුන තුණින්-ලුහු ඉන් විරම් වි නම්,
නැතන් ලුහු ගුරු නියමෙක්-දෙබ නම් විරිත් හෙ මෙසේ.

---

මාත්‍රා පසළොසකින් බැන්දෙත් සදෙල්කෙළි නම් විරිත වේ. ඊට නිදසුන් මෙසේ යි —

"පියඳු ලිය සහ අකුරු, පතට පත
පියඳු ලිය සහ අකුරු, පතට පත
ලිය වැලඳ පිය තුරුණ, පතට පත
ලිය වැලඳ පිය තුරුණ, පතට පත"

විස්තර:— මෙහි 10, 11 වැනි මාත්‍රා එකතු ව ගුරක් නො වේ. එහෙයින් යතියෙන් මුල මාත්‍රා දහය එක් කොටසක් සේ ද, අග මාත්‍රා පහ එක් කොටසක් සේ ද ගෙණ භෙද සඛ්‍යා සෙවිය යුතු. මේ විරිත පඤ්චදශමාත්‍රාවෘත්තයට අයත් ය.

**52.** අර්ථ:— ලඝු සයකින් පර ව දගණ නගණ ගුරු යන මෙයින් යුක්ත කොට බඳ හොත්, අටවැනි අක්ෂරයෙන් පර ව යතිය වුවොත්, ඒ දියකේලි (ජයකේතු) නම් විරිත වේ.
නිදසුන් මෙසේ යි:—

"කැනටග දිව වලා, කුමුකුව ලා
මලිගිය පුල මලා, වල කුව ලා
විලිඹුව කැන වලා, වලඹ දෙ ලා
ඉති වන හිමි බලා, එහි විපු ලා"

විස්තර:— 'කැනටගදිව' යනු ප්‍රථම ලඝු සයයි. 'වලාකු' යනු දගණය යි. 'මුකුව' යනු නගණය යි. 'ලා' යනු ගුරයි. සෙසු පාදයන්හි ද මෙසේ යි. පාද සතර ම එක් වැනි හෙයින් මෙහි භෙදයෙක් නො ලැබේ. මෙහි ද මාත්‍රා පසළොසකි.

**53.** අර්ථ:— මාත්‍රා දශයකින් ද නැවත තුණකින් ද ලඝුවක් හා ඒ ලඝුවෙන් පර ව විරාමය ද වේ ද, අනික් ගුරුලුහු නියමයෙක් නැද් ද, ඒ විරිත දෙබ (=ඛම්පා) නම් වේ.

නිදසුන් මෙසේ යි,—

"සුවඳ මුවරඳිනවුලෙහි, නි ද ලෙහි
සිනිඳු මිණි යාළුමුදුලෙහි, හිම ලෙහි
විඹිඹන පැනිති උරලෙහි, සිසි ලෙහි
සනසව හිමිහු අසලෙහි, හිස ලෙහි"

**54.** **සක්මනෙකින් මතු-ගුරුළුහු දෙකින් යති වත්,**
**පුන තුන්මතින් ගුරුළුහු-සක්වා නම් විරිත් වේ.**

**55.** **බගණ තුණින් දෙ ගුරින්-බඳුයේ කරගවැල නම්,**
**සතර සගණින් බඳ-තෝමක නමැයි දන්නේ.**

---

**විස්තර:**— මෙහි මූල මාත්‍රා දශය අසූනව අයුරකින් යෙදේ. එකොළොස්වැනි මාත්‍රාව ලඝුවක් ම විය යුතු ය. ඊළඟ මාත්‍රා තුණ තුන් අයුරකින් යෙදිය හැකි ය. පසළොස් වැනි මාත්‍රාව ද නිත්‍යයෙන් ම ලඝුවක් විය යුතු ය. එසේ හෙයින් මෙහි එක් පාදයක් (89 × 3)=26 + 7 අයුරකින් යෙදිය හැකියි. අතික් හෙද විනත්‍යයි.

**54.** **අර්ථ:**— මාත්‍රා සතරකින් මත්තෙහි (යෙදුනු) ගුරු ලඝු දෙකකින් (පර ව) පාදමධ්‍යයතිය වතොත්, නැවත මාත්‍රා තුණකින් පර ව (යෙදුනු) ගුරුළුහු දෙකින් (පර ව) පාදන්ත යතිය වතොත් (ඒ විරිත) **සක්වා** (=චක්‍රවාක) නම් වේ. ඊට නිදසුන් මෙසේ යි:—

**නන් කුසුමන් ව ලා ය, දල කා ලා ය**
**මක මුවරඳ ලො ලා ය, ගි ලො ලා ය**
**වනන් මුලිය ව ලා ය, සර ල ලා ය**
**තවද මෙහි ම හි ලා ය, නෙක කා ලා ය**

**විස්තර:**— මෙහි ද කොටස් සතරකි. එයින් දෙවෙනි සතර වැනි කොටස්හි වන්නේ ගුරු ලඝු දෙක බැගිනි. ඒ නියත ය. පළමුවැනි කොටස මාත්‍රා සතකි. එහි හෙද එක් විස්සකි. තුන්වැනි කොටස මාත්‍රා තුණකි. එහි හෙද තුණකි. එහෙයින් පාදයක හෙද (21 × 3)=63 ක් වේ.

සූත්‍රයෙහි නො කී නමුත්, මේ විරිතෙහි යති ස්ථාන දෙකෙහි ම යකාරයෙන් එළිසම කිරීම කවි සම්ප්‍රදාය යි. ඒ දෙපලෙහි යකාරයෙන් එළි සම නො කළ සක්වා විරිතෙන් බැඳි පද්‍යයක් සිංහල කාව්‍යක නො දක්නා ලදී.

**55.** **අර්ථ:**— බගණ තුණකින් හා ගුරු දෙකකින් බඳනා ලද්දේ **කරගවැල** නම් විරිත වේ. **සගණ** සතරකින් බඳනා ලද්දේ **තෝමක** නම් විරිත වේ.

**56.** සතර සතර මතින්-යති සතරක් දුට හොත්,
සොළොස් මතින් රැඳියේ-පෙද නම් විරිත් හෙ මෙසේ.

**57.** සගණ සතර මතික්-බිති කොට විරම් දුට හොත්,
පිළි දු නගණ යගණින්-බඳ දෙවිගි ගාහ නම්.

---

**තරඟවැල** විරිතට නිදසුන්:—

දිව් සතරත් මස ඉස් සුක   දු න් නේ.
සෙත්මග මොක්සුව පත් සාර   දු න් නේ
මින්දද මන්දද දජ් සහ   බු න් නේ
දූන් එන සත්සර සෙත් සහ   දෙ න් නේ

තෝටක විරිතට නිදසුන්:—

සඳසා අමයා සමයා   ව න නා
අනෙයා විනොයා දනනා   ව න නා
අසුරා අමරා උරනා   ව න නා
ණිමවා මුනිනා නිමලා   ව න නා

**විස්තර:**— සංස්කෘතච්ඡන්දසෙහි දෝධක නාමයෙන් පෙණෙන්නේ මේ **තරඟවැල** විරිත යි. එහි යතිය පාදන්තයෙහි ය. තෝටකය සංස්කෘතච්ඡන්දසෙහිත් එනමින් ම ආයේ ය. පාදන්තයෙහි යතිය වේ. එදෙක සංස්කෘතයෙහි වර්ණච්ඡන්දස් දෙකකට අයත් නමුදු දෙකෙහි ම මාත්‍රා සඞ්ඛ්‍යාව සමාන හෙයින් මෙහි එක ම ඡන්දසෙහි ඇතුළත් කරණ ලදි. හෙදයක් නොමැත.

**56** අර්ථ:— (යම් විරිතක) මාත්‍රා සතරින් සතරින් පර ව යති සතරක් දක්කොත්, සොළොස් මාත්‍රාවකින් යුක්ත වූ එය **පෙද** (=පදක) නම් වෘත්තය වේ.

නිදසුන් මෙසේ යි:—

"ඉඳුදුනු, විදුලිය, මේගැබ,   රැ දි යේ
සිකි පිල්, වටමින්, ගිරිහිස   රැ දි යේ
සහමල්, කොලඹිලු, නැළමද,   රැ දි යේ
කිම මද, මියුලැස, මෙනෙ දූන්,   රැ දි යේ?"

**විස්තර:**— මෙහි එක් පාදයක හෙද 625 කි. සිව් පදයෙහි හෙද යට කී නයින් වින්‍යස්‍ය යි. පාදයෙක්හි හෙද 625 ක් වන්නේ කවර හෙයින් ද?

**57.** අර්ථ:— සගණයක් හා නැවත මාත්‍රා සතරක් ද, ඉක්බිති කොට හෙවත් සතර මතකින් පර ව විරාමය දක්

58. තන භන ලුහුගුරින්-අටින් අටින් යති වත්,
මියුරු හැම පෙදෙන් යුත්-ලිය කේලි නම් හෙ මෙසේ.

9. රැඳි.

59. නගණ දෙකින් මතු-ලුහුගුරු දෙකින් * යති වත්,
කෙළගා සර† ගණ දෙගා වත්-මුවර දද නම් හෙ මෙසේ.

---

කොත්, නැවත ද නගණ යගණයන්ගෙන් බැන්දෙත් ඒ වෘත්තය දෙව්ගීගාහ නම් වේ.

නිදසුන් මෙසේ යි:—

"සැමසු සදහම්, තිගුණ  සා රා හා
විනෙයා කුමුදන්, සිසිර  සා රා හා
දලමුල් සිරිපද, කමල  සා රා හා
සිණිපා සාරමා, නිවණ  සා රා හා"

විස්තර:—මේ වෘත්තයෙහි භෙදයක් ලැබෙන්නේ දෙවෙනි මාත්‍රා සතරෙහි ය. එය පස්අයුරකින් යෙදිය හැකි හෙයින් සිව් පදයෙහි ම භෙද (5 × 5 × 5 × 5=) 625 ක් ලැබේ.

58. අර්ථ:— තගණ, නගණ, බගණ, තගණ ලඝුගුරු යන මෙයින් යුක්ත වූ මාත්‍රා අටින් අටින් පර ව වූ යති ඇති මධුර වූ සියලු පදයෙන් යුක්ත වූ වෘත්තය **ලියකේලි** (=ලතාකෙතු) නම් වේ.

නිදසුන් මෙසේ යි:—

"මුවරදිනුදු  ලා, මල වල වර  ලා
සාණකෙහි සසලා, සහ බිගු උපු  ලා
සහදල සාම  ලා,‡ නව නඹලද  ලා
මඟුලුයනප  ලා, වැදි සිරි සතු  ලා"

**විස්තර**:— සියලු තැන සියලු ලක්‍ෂණ නියත හෙයින් මෙහි භෙදයක් නො ලැබේ. සකුසඳසෙහි **ප්‍රහරණකලිකා** නාමයෙන් පෙණෙන්නේ මේ වෘත්තය යි.

—॥—

59. අර්ථ:— නගණ දෙකකින් මත්තෙහි වූ ලඝු ගුරු දෙකින් යතිය වුවොත්, අවසන්හි සගණ රගණ දෙක වුවොත් ඒ චරිත මුවරදද (=මකරධවජ) නම් වේ.

---

* දෙකින් ලුහු ගුරෙකින් මෙසේ. † සබ.
‡ සහදනසාපලා.

60. අට මතෙකින් දෙගුරු-යති සගණින් ගුරු වුව,
බහසුරු විදඹ නම් වේ-නිදසුන් එයට මේ වේ.
61. අටමතෙකින් ගුරෙක-යති වත් යලි දු සිව්මත්,
දෙගුරක් කෙළන දුටහොත්-කිඳුරුකෙළි නම් හෙ මෙසේ.

ඒ මෙසේ යි:—

"හස ගමනට දැපි, වන විල් ගොස් වනී
රන ලවනට දැපි, බිඹුවැල් වල් වනී
ඇස තුවනට දැපි, නිලුපුල් විල් වනී
එනලලතට * දැපි, සඳලේ දැල් වනී"

විස්තර:— මේ වෘත්තයෙහි මාත්‍රා දහඅට එක්ලෙසකින් ම යෙදෙන හෙයින් භේදයක් නො ලැබේ.

60. අර්ථ:—මාත්‍රා අටකින් පර ව ගුරු දෙකක් ද, එයින් පර ව යති හා(එයින් මත්තෙහි වූ)සගණයෙන් පර ව ගුරු අකුරක් ද, වුවොත් බහසුරුවිදඹ (=භාසවර විජෘම්භිත) නම් වෘත්තය වේ.

ඊට නිදසුන් මෙසේ යි:—

"නො වූ ද පියෙනි ය න්නා, රිසි දුන් නා
පල කොට මෙපවත 'ස න්නා, නො මගන් නා
විලි වැනි තොපට පිය න්නා, මන වන් නා
මේ කිම් නුඹ මකිය න්නා, නහමන් නා"

විස්තර:— මේ වෘත්තයෙහි කොටස් දෙකකි. මූල මාත්‍රා අට සූතිස් ලෙසකින් යෙදේ. ඒ අනු ව සිව්පදයෙහි භේද සඞ්ඛ්‍යා දත යුතු යි.

61, අර්ථ:— මාත්‍රා අටකින් පර ව ගුරක් වේ ද, (එයින් පර ව) යති වුවොත්, නැවත ද මාත්‍රා සතරක් ද, එයින් කෙළවර ගුරු දෙකක් ද දුට හොත් කිඳුරු කෙළි නම් වෘත්තය වේ.

ඊට නිදසුන් මෙසේ යි:—

"තඹුරු දු හෙල නෙලු ඹා, නිල් කම ලේ යා†
මිණිමුතු කෙසුරුග බා, උදුල වි ලේ යා
ගලහෙන කැලුම් දෙඹා, නිල් සිලි ලේ යා
ඒ දුටු බිඟු විල ඹා, මුන වර ලේ යා"

විස්තර:— මෙහි භේද ඇතිවන්නේ මූල මාත්‍රා අටෙහි හා යතියෙන් පර ව වූ මාත්‍රා සතරෙහිත් ය. මූල මාත්‍රා අට සූතිස් අයුරකින් ද, දෙවෙනි මාත්‍රා සතර පස්අයුරකින් ද යෙදිය හැකි ය. එවිට එක් පාදයක්(34 × 5=) 170 අයුරකින් යෙදිය හැකි වේ.

* එතදලයට. † කපලේයා.

62. දෙසෙන් අටින් යති-අටලොස්මතින් බඳ හොත්,
වේ ය සමුදුරුඝොස් නම්-නිදසුන් දනු හෙ මෙසේ.

## 10. රවුළු.

63. නෙවෙන් දෙසෙන් විරම්-කොට දසනව මත්නෙන්,
පිසෙදූ නරගරග වේ-නිදසුන් මෙසේ දන්නේ.

64. නගණ සගණ විරම්-පිළි නර දෙගුරින් බඳ:
මිණිරිළු නමැයි දන්නේ-නිදසුන් එයට මේ වේ.

---

62. අර්ථ:— මාත්‍රා අටලොසකින් බැන්දෙත් සමුද්‍රඝොෂ නම් වෘත්තය වේ. මාත්‍රා දශයකින් හා අටකින් ද යතිය වේ.

ඊට නිදසුන් දනු. සේ මෙසේ යි:—

"බණතු දූ නො කෙපලනූ, මුළුරු එක සහ න
බඳ රිසි කොක් දල ඉම්, මොවුන් රජ දහ න
කුමට නො ඔතී මොහු, රුමුළු වට පහ න
බණවා දමා මොවුන්, සභාමෙන පහ න"

**විස්තර**:— මේ වෘත්තය ශ්‍රුතා ප්‍රසිඬ ය. මේ විරිතෙහි යතිය මෙහි කළ නියමයට විරුද්ධ ව ද ඇතැම්හු කළහ. යතියෙන් පූර්වාපර භාගයන් වෙන් වශයෙන් ගෙණ භෙද සඞ්ඛ්‍යා සෙවිය යුතු යි.

—||—

63. අර්ථ:— මාත්‍රා නවයෙන් හා දශයෙන් ද, විරාමය කොට මාත්‍රා එකුන් විස්සකින් යොදනලද්දේ නරගරග නම් විරිත වේ.

ඊට නිදසුන් මෙසේ යි:—

"පවර නිරිඳු තුමා, බඳ සිප ගත්තී ය
නරගරග මෙදෙනුඳු, රණ මන ඇත්ති ය
කුකුසා මිස විලස, පැහැ ඔහු දත්ති ය
මෙසේ නිකුත් මතෙව්, සුරු පිළිගත්ති ය*"

**විස්තර**:— නිදර්ශනයෙහි අවසානවර්ණය ගුරක් ලෙස සිතිය යුතු. භෙදසඞ්ඛ්‍යා ගිණීමෙහි දී වෘත්තය කොටස් දෙකකට කඩා ගත යුතු.

64. අර්ථ:— නගණ සගණයන්ගෙන් පර ව විරාමය වේ ද, නැවත නගණ රගණ දෙගුරින් බඳනා ලද ද ඒ විරිත මිණිරිළු නමැයි දතයුතු.

---

* මතෙම්යුරු පිළියුත්තී ය.

**65. විෂමචෙනකින් බඳ-ලුහුගුරු නියම් නැති කොට,**
**වියන් නම් විරිත් වේ-නිදසුන් මෙසේ දන්නේ.**

**66. කෙළන යගණ වත්-නැනන්තැන ගුරු නියමෙක්,**
**නලහව් විරිත් නම් වේ-නවමනිනි යති වත් හොත්.**

---

ඊට නිදසුන් මෙසේ යි:—

**"වැබැඳ සාස යා, ගෙණ හුදල්ල සාමින් නා**
**අතුරු සැස යා, දුව වැඩූ උයන් වින් නා**
**කිස නිවිස යා, මෙවග මේ කෙළි මින් නා**
**එකිස මිස යා, මෙපොළොහු බැවින් මින් නා"**

**විස්තර**:-නරහරඟ, මිණිරිළු යන විරිත් දෙක ම මාත්‍රා එකුන් විස්සක් ඇති ඡන්දසට අයත් ය. භෙදසඞ්ඛ්‍යා සවයං විනාත්‍ය යි.

**65**. **අර්ථ**:— ලඝුගුරු නියමයක් නො කොට විෂමනෙකින් බඳනාලද්දේ **වියන්** (=විතාන) නම් විරිත් වේ.

ඊට නිදසුන් මෙසේ යි:—

**"මෙරිසා මෙමල් ගත වැනි පත් අප කෙළෙනා පෙ ද**
**මෙමල්හි ගත්ති නො මෙ බල අභිසිද්දතු බි ඳ**
**මෙමල් සඳැල්ලෙන් නවරන් බිඳි සිත් තුරුහි ද**
**පවර ලඟිරු රැසින් නිකුත් හෝ නි සොඳ ල ද"**

**විස්තර**:— මාත්‍රා විස්සක් ඇති ඡන්දසෙහි සියලු ම වෘත්ත මේ වෘත්තයෙහි පාද වශයෙන් යෙදිය හැකි ය. යතිස්ථානයක් නියම නො කළ හෙයින් පාදාන්තයෙහි යතිය විය යුතු යි.

**66. අර්ථ**:— අවසන්හි යගණය වේ ද, අන් තැන ගුරු නියමයෙක් නැද් ද, එසේ ම නවමනින් යති වතොත්, ඒ විරිත **නලහව්** නම් වේ.

නිදසුන් මෙසේ යි:—

**"පුලුපුවක් පිරියස, ඇර පැලඳ කිසි සේ නී**
**බහ පැලඳ වත්සෙමි, දූගි පිලි දුල කෙ සේ නී**
**පණිවා රුවන් වැලි, සහනෙලු නොපර සේ නී**
**සිපිහර හා සමග, නිම්නස් අඹ ව සේ නී"**

**විස්තර**:— මේ වෘත්තයෙහි මාත්‍රා විස්සකි. එයින් මාත්‍රා පහක් අවසානයෙහි වූ යගණයට අයත් වේ. එහෙයින් ඒ මාත්‍රා පසෙහි වෙනසක් නො වේ. අනික් මාත්‍රා පසළොස යතියෙන් පූර්වාපර භාග වශයෙන් දෙකොටසකට බෙදේ. පෙර කී අයුරින් භෙද සඞ්ඛ්‍යා විනාත්‍ය යි.

## 11. කෙනෙන්.

67. නගණ යගණින් යති-පුන යගණින් යති වත්,
සොළසොයි නගණ යගණින්-තුරගරග නම් වනුයේ.

68. දසමත් සමත් සමත්-එළිවිරමුදු දුටහොත්,
දෙවිසි මතින් බඳුයේ-කුසුම් සිරිගර නම් වේ.

69. සන දන බය මේ-ගණින් සයින් සය යති,
කාමලා නම් විරිත් වේ-නිදසුන් මෙසේ දන්නේ.

---

67. අර්ථ:-නගණ යගණයන්ගෙන් යතිය වුවොත්, නැවත ද යගණයෙන් පර ව යති වුවොත්, අවසන්හි නගණ යගණ යෙදු තොත් තුරගරග නම් විරිත වේ.

ඊට නිදසුන් මෙසේයි:—

"අහස * ගම න් හා, දහන් හා, ගුරුළු යහන් හා
මුහුදු විම න් හා, ගහන් හා, උයිඳු යහන් හා
සොම්සලව න් හා, සවන් හා, කමල නුවන් හා
ගවසලු සා න් හා, තොරවන්හා, සිසිසනුවන්හා"

විස්තර:—මේ උදාහරණයෙහි සියලු පාදයන්හි 'න-ය-ය-න, ය'ගණයෝ පිළිවෙළින් පෙණෙත්.

68. අර්ථ:-මාත්‍රා දශයකින් ද සයකින් ද, නැවත සයකින් ද එළි හා විරාමයත් දුටොත්, මාත්‍රා දෙවිස්සකින් බැඳි ඒ විරිත කුසුම් සිරිගර නම් වේ. ඊට නිදසුන් මෙසේයි:—

"සහ සිරි තඹුරු සැ ලි,† පිරුණු විලි, උපුල් ම ලි
රමණී ගතුල් හැ ලි, ගොයලවැලි, යොහොඹුමැ ලි
ගිගිනිල් සුපුල් ම ලි, උදුල ග ලි කිණිරි ව ලි
දහරන් දරණ වැ ලි, මෙවනිසා ලි, සොලෙ කුහු ලි"

විස්තර:—මෙහි "සහසිරි තඹුරු සැලි" යනු මාත්‍රා දශයෙකි. එහි යතියයි. නැවතද "පිරුණු විලි" යනු මාත්‍රා සයකි. එහි ද යතියයි. යති ස්ථානයන්හි එළිසමය ද වේ.

69. අර්ථ:—යම් විරිතක් සගණ-නගණ-දගණ-නගණ-බගණ-සගණ යන මේ ගණ සයින් යුක්ත ද, (යමෙක්හි) මාත්‍රා සයින් සයින් යතිය වේ ද, ඒ කාමලා නම් වෘත්තය වේ.

නිදසුන් මෙසේයි:—

"වරලින් ගු ලු,[1] කුසුමෙන් බර, ගලසන් ගිකි, යමනි[2]
නුවනින් ර සා, ලවනින් සල, මද සේපුළු වුව නී[3]
සොකුමෙන් දිගි, තනරන්සිකි, ගෙළෙදුන්නිය, රදිනී[4]
ලියගෙන්[5] එන, එළඳුන් දුට, මන සා කිසි, නොතිනී"

---

1. වළු. 2. කිසි සමනී. 3. තුතුනී. 4. රැඳුනී. 5. ලියගින්.
* අසෙත. † සහසිරිබඹුරු ගැලි.

**70. ගුරුකිම් නැත'ත් තැන-යගණක් කෙළන යොදමින් [1]**
**දෙවිසි මතින් [2] බඳුයේ-සෝදූ මිණි නම් වේ.**

**71. නැත [3] නියම් ගුරුලුහු-දෙවිසි මතින් බඳ හොත්,**
**දිගෝවිලි යයි දන්නේ-එයට නිදසුන් මේ වේ.**

---

**විස්තර:**—මෙය සම වෘත්තයක් හෙයින් හෙදයක් නො ලැබේ. වර්ණවෘත්තයක් වශයෙන් සලකතොත් වර්ණ අටළොසක් ඇති ඡන්ද සට ඇතුළත් වේ. වර්ණ අටළොසක් ඇති ඡන්දසට එලුස්දසෙහි නමක් නැත.

**70. අර්ථ:**—(යම් විරිතෙක්හි) අන්‍යස්ථානයන්හි ගුරු අක්ෂ රයන්ගේ සීමාවක් (නියමයක්) නැද්ද, අවසානයෙහි යගණයක් යොදමින් මාත්‍රා විසිදෙකකින් බඳනාලද (ඒ විරිත) සෝදූමිණි නම්වේ. උදාහරණ:—

**එලේනා එකැස් බාදෝ අතේ හිනහ ගත්තා**
**රඳු වේනි තනන දූරුම් වෙයින් මුල සිත්නා**
**කර සි එරෙල්ලෙන් දුක්මුහුණින් කඳුලු ම ගත්තා**
**පෙරට උවමිය හට මෙසේ කිති උවදුරු ගත්තා**

**විස්තර**—මේ වෘත්තය කොටස් දෙකකට බෙදිය හැකි ය. එයින් පළමුවැනි කොටස නම් මූලට යෙදෙන මාත්‍රා සතළොසයි. එය දෙදහස් පන්සිය අසූහතර අයුරකින් යෙදිය හැකියි. දෙවෙනි කොටස නම් අවසානයෙහි යෙදෙන යගණයයි. එහි හෙදයක් නො ලැබේ. මූළු සිව්පදයෙහි හෙද ස්වයංවිනත්‍යයි.

**71. අර්ථ:**—(යම් විරිතෙක්හි) ගුරු ලඝු නියමයක් නැත් ද, මාත්‍රා විසිදෙකකින් බැන්දෙත් 'දිගෝවිලි' යයි දත යුතු. ඊට නිදර්ශන මෙසේයි:—

**"හෙලන සිසි රජ රැස් සිසිකන ගලින් සිය හැලි හි න**
**බමරවැල ලෙලදුන් කුමුදු ද මදින් මද විහිදි න**
**පූරසෝනන් වුවන් නුවන්හිද සොම්නසින් සැදි න**
**වියෝ දන හුදු අසද බඳ මන පිය [1] මතු පිරිහි න"**

**විස්තර:**—වෘත්තයෙහි හෙද සඞ්ඛ්‍යා විනත්‍යනය කට යුතුයි. යතිස්ථාන අනියත ය.

—ඞිංදි—

---

1. දූටහොත්. 2. මතිනුදු. 3. නොව. 4. වී මතු.

## 13. ශි.

**73.** අටින් සයින් නෙමවන්-තුන්තැන විරම් දුට හොත්,
දිගගුරු නමැයි දන්නේ--නිදසුන් එයට මේ වේ.

**74.** ජගණ ගුරින් ජගණ-ගුරින් ජගණ ගුරුනෙන්,
සත් මතෙකින් එළිසම-විසිපස්නි පමදා නම්.

---

**73.** අර්ථ:—(මාත්‍රා) අටකින් ද සයකින් ද නවයකින් ද යති තුන් තැනක විරාමය දුටුවොත් 'දිගගුරු' නම් වෘත්තයයි දතයුතු.

ඊට නිදසුන් මෙසේ යි:—

**දියඇ ස[1] අදිමි   න, ගල්[2] නැගෙමින, දෙව්දුවක වෙමි නා**
**ගිරිගි ස නැගෙමින, පිල් වටවි   න, සිකිනට පියමි   නා**
**නුරැයිස ලගිමි   න, බිල් වදිමි   න, කඩුපුලෙක වෙමිනා**
**සරණ ස ගිවමි   න, කල් නබමි   න, ගන එන රිසිමෙ නා**

විස්තර:—'දියඇස අදිමින' යනු මාත්‍රා අටකි. එහි එක් යතියකි. 'ගල් නැගෙමින' යනු මාත්‍රා සයකි. එහි තවත් යතියකි. 'දෙව්දුවක වෙමිනා' යනු මාත්‍රා නවයකි. එහි අනික් යතියයි. මුළු පාදයෙහි තිබෙන්නේ මාත්‍රා විසි තුණකි. යති නියමය මිස ගුරුලඝු නියමයක් මේ විරිතෙහි නැත. භෙද සඞ්ඛ්‍යා විනාත්‍ය යි.

මාත්‍රා විසිහතරක් ඇති හිරු සඳසට අයත් එක් වෘත්තයක් වත් මෙහි නො දක්වන ලදී. මාත්‍රා විසිතුණක් ඇති හිරු සඳසෙහි සමවෘත්ත 46368 ක් ද, මාත්‍රා විසිහතරක් ඇති ඡන්දසෙහි සමවෘත්ත 75025 ක් ද වේ. එහෙයින් පාද සතරෙහි සම නො වන වෘත්ත ලක්ෂගණනක් වේ.

**74.** අර්ථ:— ජගණයකින් හා ගුරකින් ද, නැවත ජගණයකින් හා ගුරකින් ද, නැවතත් ජගණයකින් හා ගුරකින් ද, (ඉන් පසු) මාත්‍රා සතකින් එළිසමය ද වේ නම්, මෙසේ මාත්‍රා පස්විස්සකින් බඳනාලද්දේ ප්‍රමදා නම් වෘත්තය වේ.

නිදසුන් මෙසේ යි:—

**සහන් අ   රා  වියන් අරා  එවෙන් අ   රා  මුහුදුමැදු   රා**
**උරන් අ   රා  එපස් ස රා  කොසක් හ රා  කොලෙස පවරා**
**දහම් ස   රා  වියන්හ රා  සනක් සා   රා  විමන් තඹ   රා**
**ඉමදෙව්ව රා  නටා පු රා  සිරින් ව   රා  දියනෙත් පු රා**

1. දියනෙත. 2. ගස,

**75.** අටරමතින් දෙගුරු-යති දෙගුරින් පිරියත,
කුසුම්සඳ විරිත් මේ-නිදසුන් මෙලෙස දන්නේ.

**14. මදු.**

**76.** නගණ පසක් රගණ-දෙකක් ගුරෙක් පිරිසත,
එළිහි ලා දෙවිරම්-බඳ ගඟහැලි විරිත් වේ.[1]

---

**විස්තර:**—මේ විරිත ද කොටස් දෙකකට බෙදේ. එයින් මුල් කොටස ගුරුලඝු නියමය තිබෙන හෙයින් භේදයකට නො පැමිණේ. දෙවෙනි කොටස වූ අවසන්හි යෙදෙන මාත්‍රා හත විසිඑක් අයුරකින් යෙදිය හැකි බැවින් එක් පාදයක භෙද එක්විස්සකි. සිවුපදයෙහි භෙද එයින් සිතා ගත හැකි වේ.

උදාහරණයෙහි එළි සම කළ තැන් සතරක් පෙණෙතත් මේ වෘත්තයෙහි එක් එළිසමයක් ම ප්‍රමාණ වේ.

**75. අර්ථ:**— අටලොස් මාත්‍රාවකින් පර ව ගුරු දෙකක් වේ ද, (එයින් පර ව) යතියකුත් වේ ද, පර්‍යන්තයෙහි (අව සන්හි) ගුරු දෙකකින් ද යුක්ත වූ මේ වෘත්තය කුසුම්සඳ නම්. නිදර්ශන මෙලෙස දත යුතු යි:—

**පැහැපත නිල් වරල් සුනිල් ඝනවල් පැහැපත්නා, සින්නා**
**නඩලවනෙනි සුරබ මදමද සිනෙනි සල ගත්නා, ලත්නා**
**ගඳ ගජනත් වමොර සුරත්තල හෝපලු පත්නා, රත්නා**
**සවණ බරණින්දුල ජ් කොමල ලියගී ලත්නා, සිත්නා**

**විස්තර:**— මේ විරිත ද කොටස් දෙකකට බෙදේ. එයින් මුල් වූ මාත්‍රා දහඅට අෂ්ටාදශමාත්‍රාවෘත්තයෙහි ඇති භෙද සඞ්ඛ්‍යා වෙන් යුක්ත වේ. ඉතිරි මාත්‍රා අට නිත්‍යයෙන් ම ගුරු සතරක් වන බැවින් එහි භෙදයක් නො ලැබේ. මාත්‍රා දෙවිස්සකින් පාදමධ්‍යයතිය වේ.

——ද්විදෙ——

**76. අර්ථ:**— නගණ පසක් හා රගණ දෙකකුත් වේ ද, අවසන්හි ගුරකුත් වේ ද, එළියෙහි හෙවත් අවසන්හි විරාම දෙකක් ද යොදා බඳනාලද ඒ වෘත්තය ගඟහැලි නම් වේ.

නිදසුන් මෙසේ යි:—

**සපු සලල වකුල මුරුත පියගදිනා සුපුල් ලා විසල් ලා**
**කොඳ කිනිහිරි පුවඟු කොලඹ දෙඹ නලා තුමුල්ලා විසල් ලා**
**පිපි නඹරිඳුවර කුමුදු මිදෙලි සරා සිහිල් ලා පිහිල් ලා**
**මෙකලි මෙවල කෙළි මහිමියනි අදමල් කොහෙල්ලා විසල් ලා**

---

1. ගඟහැලි නම් විරිත් වේ.

77. අමවිසි මතන් ලා-බඳ පුණුඅතිපුණු නම,
දක්නු තුදුස් සඳගෙයි-විරිත් නිදසුන් සැකෙවින්.

තුදුස් සඳැස නිමි.

—||—

78. සම විරිත් සමතක්-වැසෑමතිකුදු මුසු වූ,
තිවිසද ලකුණු විගිනැක්-විරිත් නන් සුවහස් වේ. *

---

විස්තර:— මේ වෘත්තයෙහි නිත්‍ය ගුරුලඝු ස්ථාන ඇති හෙයින් භේදයක් නො ලැබේ.

77. අර්ථ:— මාත්‍රා විසිඅටක් යොදා බඳනාලද්දේ පුණු අති පුණු විරිත් නම් වේ.

ඡන්දස් දහහතරෙහි වෘත්ත හා නිදර්ශන ද සංක්ෂෙපයෙන් (මෙලෙස) දත යුතු යි.

පුණු අතිපුණු විරිතට නිදසුන් මෙසේ යි:—

**තිඹුළු මි ඇස ගගා පිලසිනෙකක් අඳන් වැටම නොවැරැ ද්දි**
**එවරැගු ම ස වි විස්ඩස් එනකක් සරන්නට පය ගෙණ ඇ ද්දි**
**එකෙක් හින පිළි පෙරළා අදිනුව දවස එහි ම පා ල ද්දි**
**එ ම වලහන්නට ගියෙ වන දෙවියන් සමලත් සමලක් ය ද්දි**

**විස්තර:**— මේ වෘත්තයෙහි භෙද සඞ්ඛ්‍යා විනත්‍ය යි. එක් පොතෙක්හි මේ ශීය වෙනස් ලෙස ගී දෙකක් ලෙස යොදා වෘත්තයෙහි මාත්‍රා සතකින් සතකින් යති වේ ය යි කියන ලදි. උදාහරණ කළ පද්‍යය ද හැම පොත්හි ම ව්‍යාකූල ය. එහෙත් එහි තුන්වන පදයෙහි "එකෙක් හින පිළි" යන්නෙ ගත් ම මාත්‍රා සතකින් යති නො වන බව පැහැදිලි වේ. මෙහි 'පිළි' සද වස්ත්‍රවාචි ය. වස්ත්‍රවාචි 'පිළි' සදක් නො පෙණේ. එහෙයින් මාත්‍රා සතකින් සතකින් යති වෙයි යන නිගමනය පිළිගත නො හැකි ය.

මෙහි උද්දිෂ්ට 'සඳ' ආදි තුදුස් ඡන්දසුන්ගේ වෘත්තවිභාග මෙතෙකින් සමාප්ත යි.

—||—

ප්‍රධාන ඡන්දස් තුදුසට ඇතුළත් වෘත්ත සනිදර්ශන කොට දක්වා දැන් ඒ ඡන්දසුන්ට අයත් වෘත්තයන්ගේ අනෙකප්‍රකාරත්වය හා එයින් අන්‍ය වූ විවිධ වෘත්තයන්ගේ විද්‍යමානත්වය ද පවසන්නාහු "සම විරිත්" යනාදි පද්‍යමය දක්වත්.

78. අර්ථ:— (පාද සතරෙහි) සමාන (ගුරුලඝුස්ථාන ඇති) වෘත්ත ද, (ගුරුලඝු ස්ථානවශයෙන් නො ව) මාත්‍රාවශයෙන් සම වූ

---

* දනු නන් විරිත් සුවහස්.

79. අටපද දෙළොස්පද-සොළොස් පද සම 'සම විරිත්'*
පෙරපසු විලඹු ඇනත්-පදබැඳුමේ වෙසෙස් ගෙ.

---

වෘත්ත ද, විෂමමාත්‍රාවන්ගෙන් මිශ්‍ර වූ වෘත්ත දැ යි සිව්පද ලකුණු පරීක්‍ෂා කරත් හොත් නොයෙක් සියදහස් ගණන් වෘත්තයෝ වෙත්.

**විස්තර:—** **සමවිරිත්** නම් සතර පෙදෙහි ම සමාන වූ ගුරු ලඝු ඇති වෘත්තයෝ යි. යට දැක්වූ ඡන්දස්සඞ්ඛ්‍යානයන්ගෙන් ඒ ඒ ඡන්දස්වලට අයත් සමවෘත්තයන්ගේ සඞ්ඛ්‍යා නොපමණ දැ යි දත හැකි ය. **සමමත් විරිත්** නම් සතරපෙදෙහි ම මාත්‍රා සඞ්ඛ්‍යාව සමාන වූ වෘත්තයෝ යි. ඒ වෘත්තයන්හි මාත්‍රා සඞ්ඛ්‍යාව සමාන වත තමුත් ගුරුලඝු විෂම වේ. 'වෙහෙළුලැග' විරිත (60 පිට) මාත්‍රා සමවෘත්තයකි. එහෙත් එහි සතරපෙදෙහි ගුරුලඝු සමාන නො වේ. එබඳු වෘත්තයෝ ඒ ඒ ඡන්දස්හි බොහෝ වෙත්. **වසම් මතින් මුසු විරිත්** නම් සිව්පදයෙහි සමාන මාත්‍රා සඞ්ඛ්‍යාවක් නැති වෘත්තයෝ යි. ගී විරිත් විෂම මාත්‍රවෘත්තයෝ යි. සිව්පද විරිත් ද විෂමමාත්‍ර ව සිටිය හැකි ය. මෙසේ බලත කල සිව්පද විරිත් අසඞ්ඛ්‍යගණනක් වේ. විරිත් ඒ සා මහත් ගණනක් තිබෙත තමුත් ශ්‍රැතිසුඛදායක වූ විරිත් ම තෝරා ගෙණ කවීහු කවි බඳිති. මේ පොතෙහි නො දක්වන ලද වෘත්ත මහත් රාශියක් ම මෙයින් මෑත දී කළ කවි පොත්වල දක් නට ලැබේ. ඒ විරිත් සියල්ල දැක්වීමෙන් ග්‍රන්‍ථය මහත් කරන් නට බලාපොරොත්තු නො වෙමු.

සිව්පද වෙසෙස් දක්වා එයින් අන්‍ය වූ අටපද ආදිය ද, ඇතිබව දක්වන්නාහු "අටපද දෙළොස්පද" යනාදිය කියත්.

79. **අර්‍ථ:—** අෂ්ටපද ය, වාදශපද ය, ෂොඩශපද ය, සම වෘත්ත ය, අසමවෘත්ත ය, පූර්‍වවිලම්බිත ය, අපරවිලම්බිත ය යන ආදි වූ නොයෙක් විශෙෂයෝ පද්‍යබන්‍ධනයෙහි වෙත්.

**විස්තර:—** අෂ්ටපාදදීන්ගේ ලක්‍ෂණ මත්තෙහි දී ප්‍රකාශ වේ. එහෙයින් මෙහි දී විස්තර කිරීම සථානොචිත නො වේ.

යට දැක්වූ තුදුස් සඳසුන්ගෙන් අන්‍ය වූ, සිව්පද වෙසෙසක් වූ දණ්ඩක වෘත්තයන් දක්වන්නාහු "තිස්මතිනි බඳ විරම්" යනාදිය කියත්.

---

* අටපද දෙළොස්පද සොළොස් වසම සම විරිත්.

80. කිස්මතිණි බඳ විරම්-තුණෙක් කෙළත සම එළි,
දඬු නම් අණවිදඬු නම්-නිදසුන් එසට මේ වෙ.

සිවුපද ලකුණු නිමි.

---

80. අර්ථ:— මාත්‍රා තිහකින් බඳනා ලද ද, විරාම තුණක් ඇත්තේ ද, අවසන්හි සමාන වූ එළි ඇත්තේ ද, එබඳු වූ මේ වෘත්තය අණවිදඬු නම් වේ.

එසට නිදර්ශන මෙයයි. එනම්:—

සිසිළුව සිරිවෙස් රසඳුල, සුහුල මන පැලඳ[1]
සැඳු සොමි පබඳ ලා
පැහැසළුදුල රන්පට පටු, තලල් තෙලෙහි බැඳ,
සොඳ දුහුල්[2] අඳ ලා
තලහුසිනවුනා දියබිඳු, එනවැලෙව් වැලඳ,
රන්ඝොඩොල කණ ලා[3]
ගනතරඟ මුත්හර පුළුලු, උරබිනෙහි පැලඳ,
වලඟ මෙවුල දු ලා[4]

**විස්තර**:— සංස්කෘතච්ඡන්දසෙහි දණ්ඩක නාමයෙන් වෘත්ත විශෙෂයක් දක්වන ලද හෙයින් මෙහි ද 'දඬු' (=දණ්ඩක) නමින් වෘත්තයක් දක්වන ලද බව හැගේ. සංස්කෘතච්ඡන්දසෙහි දණ්ඩක වෘත්තයන්ගේ ආරම්භය වර්ණ සත්විස්සකින් වේ. එතැන් පටන් එක් එක් ගණය වැඩි වීමෙන් ඒ ඒ දණ්ඩකයෝ නිපදෙත්. එහි අර්ණව දණ්ඩකයට නගණ දෙකක් හා රගණ නවයක් ද වේ. වර්ණවශයෙන් තිස්තුණෙකි. මාත්‍රා වශයෙන් බලතොත් මාත්‍රා එක්පණසකි. ඒ පිළිබඳ විශෙෂ විස්තර වෘත්තරත්නාකර සරලා ව්‍යාඛ්‍යාවෙහි 98 වැනි පිටෙහි පටන් පෙණේ.

මෙහි වනාහි දණ්ඩකවෘත්ත ඊට හාත්පසින් ම වෙනස් බව පෙණේ. සංස්කෘතයෙහි දණ්ඩකවෘත්තයන්ගේ නියත ගුරුලඝු ස්ථාන ඇති නමුත් මෙහි එබන්දක් නැත. මෙහි දණ්ඩකවෘත්ත යන්ගේ ආරම්භය මාත්‍රා තිහෙන් වෙතැ යි සමහරු කියත්. මාත්‍රා තිස්හතරකිනැයි සමහරුන්ගේ මතය යි. එළුසඳස් ලකු

---

1. සිසිසළුවට පිරිවෙස් රසඳුලා සුහුළා නොපැලඳලා.
2. පැහැසළුදුල් රන්පටිනි නිරඳු නළලත නොපැලඳලා දුහුල්.
3. තලහුසින් අවුනා (දිය) දියබිඳු ලෙන වැල පැලඳලා
මනබඳ තුඹ කඳලා
4. නො පැලඳලා ඇයවලඟ සිනිඳුලා.

ණෙන් ඒ පිළිබඳ පැහැදිලි විනිශ්චයක් ලැබිය හැකි නො වේ. මුද්‍රිත එළුසඳස්ලකුණෙහි "සුතිසිති බඳ විරම්" යනුවෙන් දණ්ඩක වෘත්ත සූත්‍රය ආරම්භ කරණලදී. එහෙත් උදාහරණ කළ පද්‍ය යෙහි පාද සතරෙහි මාත්‍රා තිස්හතර බැගින් නැත. එහෙයින් එහි ලක්‍ෂ්‍ය ලක්‍ෂණයන්ගේ විරෝධය පැහැදිලි ය.

'සඳැස්ලකුණ' වර්ණ්‍යාවෙහි දණ්ඩකවෘත්තාරම්භයෙහි:—

'සමතිස් මත් පටන්-මත් ලා සිව්පද බඳ,
දනු සඳෙස දඬු නම්-තිදසුන් ඉන් එකෙක් වේ.

සිව්තිසිති බඳ විරම්-දෙකෙන් කෙළෙතැ සම හෙලි
දනු මේ අනච්ඳඬු නම්-විරිත් තිදසුන් මේ වේ".

යන මේ ගී දෙක දක්නා ලැබේ. මෙයින් මුල් ගීය පැරණි ගීයක සුත්බුන් අවුලාගෙණ මැන දී සාදනලද්දක් බව ඒ පොතෙහි ම කියන ලදී. එහෙත් ඒ සුත්බුන් මාත්‍රා තිහෙන් දණ්ඩකවෘත්තයන්ගේ ආරම්භය වන බව පැහැදිලි වීමට බොහෝ උපකාර වේ. දෙවෙනි ගීයෙහි මාත්‍රා සූතිසක් ලා බැඳි වෘත්තය අණච්දඬු ය යි කියා දක්වන ලද ලක්‍ෂ්‍යයෙහි මාත්‍රා තිස්හතර පෙණෙන්නේ ප්‍රථම පාදයෙහි පමණකි. අනික් එක ම පාදයක වත් මාත්‍රා තිස් දෙකකට වඩා නො මැත්තේ ය. එහෙයින් ලක්‍ෂ්‍යපද්‍යය සංසකරණය කොට ගෙණ ඒ අනු ව ලක්‍ෂණ ප්‍රකාශක පද්‍යය සංසකරණය කළ යුතු බව පෙණේ.

සංසකෘතච්ඡන්දසෙහි අක්‍ෂර විසිහයක් ඇති ඡන්දස අවසන් කොට අක්‍ෂර සත්විස්සෙහි පටන් දණ්ඩක වෘත්ත දක්වන ලද හෙයින් මෙහි ද මාත්‍රා අටවිස්ස අවසන් කොට මාත්‍රා තිහේ පටන් දණ්ඩක වෘත්ත දක්වීම යොග්‍ය වේ. එහෙයින් මේ සංසකරණ යෙහි දණ්ඩකවෘත්තයන්ගේ ආරම්භය මාත්‍රා තිහේ පටන් වේ ය යන මතය පිළිගෙණ ඒ අනු ව ලක්‍ෂ්‍යලක්‍ෂණයන් සකස් කරණ ලදී.

සංසකෘතයෙහි ප්‍රථම දණ්ඩකවෘත්තයෙහි වර්ණ සත්විස්සකි. එතැන්පටන් එක් ගණය (අකුරු තුණ) බැගින් වැඩි වෙමින් ගොස් අකුරු නවසිය අනූනවයේ දී නවතී. එහෙයින් එහි අන්තිම දණ්ඩකවෘත්ත පාදයෙක්හි වර්ණ නවසිය අනූනවයකි. ගණවශයෙන් නම් තුන්සිය තිස්තුණකි. එළුසඳසෙහි දණ්ඩක වෘත්තයන්ගේ වර්ධනය මාත්‍රා කීයකින් වේ ද යනු හා අවසානය මාත්‍රා කීයකින් වේ ද යනුත් පැහැදිලි නැත.

**81. දුබා සල එක්බා-සිව්පදිනි දෙපා නම් වේ, ***
**සඳස්සන් සවිසිතුදු-පෙර සේ දනිව් කිවියෙනි.**

---

මෙහි දක්නට ලැබෙන්නේ එක ම දණ්ඩක වෘත්තයකි. මේ අභිනව සංස්කරණයෙහි පරිදි එහි මාත්‍රා තිහකි. විරාම තුණකි. විරාම ස්ථාන නියම නො කළ හෙයින් පද්‍යරචනා කරන්නාගේ කැමැත්ත පරිදි ශ්‍රැතිසුඛය ඇති වන සේ යති තැබීමට බාධාවක් නැත. මෙහි සංස්කරණය කොට යෙදූ පද්‍යයෙහි මාත්‍රා දොළසකින් හා නැවත මාත්‍රා නවයකිනුත් පාදමධ්‍යයති ද, ඉක්බිති මාත්‍රා නවයකින් පාදාන්තයතිය ද පෙණේ. මෙසේ යතිස්ථාන වෙන් කොට ගෙණ වෘත්තයෙහි භෙද සඛ්‍යා සෙවිය යුතු සි.

**සිව්පදලක්ෂණ මෙතෙකින් සමාප්ත සි.**

—||—

සිව්පදලකුණුවලට අනතුරු ව දෙපාලකුණු දක්වන්නාහු "දුබා සල එක්බා" යනාදිය කියත්.

**81. අන්‍ව:**— සිව්පදයෙන් විභාග කළා වූ (දෙකට බෙදූ) **එක් භාගයෙක් 'දෙපා'** නම් වේ, ඒ ඡන්දසට පැමිණි සියලු වෘත්ත ද පෙර පරිද්දෙන්, කවීනි, දනිව්.

**විස්තර:**— සිව්පදයක අඩියක් 'දෙපා' නම් වේ. යට දක්වූ සියලු සිව්පද විරිත් වලින් ම මේ දෙපා කව් සැදිය හැකි ය.

ඒ දෙපා කව්වලට නිදසුන්:—

1. හැඟිය සඹයි ගිගමින් නිඹි මග බලමින් සෙමෙ නි
   සඬර නාවට ශොඳමින් මන් සිරි විඳිමින් පැලඹෙ නි.
2. සිතුවන් හුඹන් ලිහි ගිහි සේ ගෙණ පෙර ම
   මෙමෙහො වන්නවුන් දූන් ගෙණ වන්නේ දහ ම.

මේ දෙකින් මුල දෙපාකව **තෙනෙත්** සඳසට අයත් විරිතකි. දෙවැන්න **සමුද්‍රඝොෂ** වෘත්ත යි.

"සඳැස්ලකුණවණ්නා"වෙහි—

"නැතත් ගණ නියමෙක්-පෙර සේ මතින් බඳ හොත්,
සමඑලිනි යුත් වූ-දෙව්පාද නම් දන්නේ"

යන ගීයක් ද දක්වමින් යට කී ලක්ෂණ ඇති දෙපාකව් "දෙවපාද" නමැයි කියන ලදී. එබඳු ගීයක් අනික් කිසි පොතක නො පෙණේ.

---

* සිව්පදිනි දන්නේනම්, සිව්පෙදෙනි දනු දෙපා නම්.

82. නගණ සගණ දෙගුරු-නගණ සගණ ගුරුනෙන්,
නගණ බගණ පිලි ගුරු-සගණ බගණ ගුරුනෙන්.
දෙපද වෙන් එළි යුත් *-දෙව්පාණී නම් මෙ වේ.†

තවත් විශෙෂ විපාදවෘත්ත දක්වන්නාහු "නගණ සගණ" යනාදිය කියත්.

82. අර්ථ:—නගණ සගණ යන්ගෙන් හා ගුරු දෙකකින් ද, නගණ, සගණ ගුරු යන මෙයින් ද, නගණ, බගණ, ගුරු, සගණ, බගණ, ගුරු යන මෙයින් ද, දෙපදයෙහි වෙනස් වූ එළියෙන් ද යුත් වූ මේ (වෘත්තය) දෙව්පාණී නම් වේ.

නිදර්ශන:—

ඉස ඉස‡ සඳ ලි යා සම සුදු වැලි යා
ඉසිවරා මොබ වා කොළෙ මේ ඇ එවටා.

විස්තර:— නගණ, සගණ, දෙගුරු, නගණ, සගණ, ගුරු යන මෙයින් යුක්ත වන්නේ ප්‍රථමපාදය යි. ඒ ලක්ෂණ "ඉස ඉස සදු ලියා සම සුදු වැලි යා" යන්නෙහි පෙණේ. එය පාද දෙකක් ය යි සමහරු සිතති. කියති. සූත්‍රයෙහි "පෙර දෙපද එළි වෙන්" යන පාඨාන්තරය ද ඊට හෙතුවකි. නිදර්ශනයෙහි 'සදුලියා' 'වැලියා' යන යමකය ද එය තහවුරු කෙරේ. කොතරම් හෙතු තිබුනත් එය පාද දෙකක් සේ ගණිතොත් ඒ නිදර්ශනය හා සූත්‍රයත් මේ දෙපා කාව් කොටසට කිසිසේත් නො ගැළපේ. එයින් සිව්පදයක ලක්ෂ්‍ය හා ලක්ෂණත් ප්‍රකාශ වන බැවිනි. එහෙයින් නිදර්ශන පද්‍යය සිව්පදයක් සේ ගැණීම උචිත නො වේ. මූල කොටස එක් සිව්පදයකට අයිති දෙපද යකැයි ද, දෙවෙනි කොටස අනික් සිව්පදයකට අයිති දෙපදයකැයි ද ඇතැම්හු කියති. එසේ වුවත් දෙපා කාවක් නො ව සිව්පා කාවකි. නගණ, බගණ, ගුරු, සගණ, බගණ, ගුරු "ඉසිවරා මොබවා කොළෙ මේ ඇ එවටා" යන්නෙහි ඇතුළත් වේ. එය ද දෙපදයක් නො ව එක් පදයකි.

සංස්කෘතවෘත්තදසෙහි දෙපාවිරිත් පිළිබඳ විස්තරය වෘත්ත රත්නාකරසරලාව්‍යාඛ්‍යාවෙහි 63 වැනි පිටෙහි පටන් පෙණේ.

---

* පෙර දෙ පද එළි වෙන්.

† "පෙර දෙපද වෙන් වූ-එලි වූ පෙර දෙපද කෙළ,
දෙව්පාණී නම් වේ-තිදසුන් එයට දන්නේ".
සඳැස්ලකුණ වණීනාව.

‡ අසි අසි.

83. පෙරපද දිගු කොමින්-අවසන් පදය උනු කොට,[1]
සම එළි දෙ පද බඳ මේ-මුනිනඳන පෙර විලඹු නම්.

84. පෙරපද උනු කොමින්-එළි සම කොමින් බඳ හොත්,
පර පද වන විලඹු මේ-මුනිනඳන පරවිලඹු නම්.

85. කෙළවර කුරු දිගු වෙතොත් බූ[2]-සඳසේ එළි සම වූ මේ,
පිහිත් දනු පිහිසොඹු නම්-නිදසුන් මෙයට මත්තේ.

දෙසාලකුණු නිමි.

---

83. අර්ථ:—පූර්වපදය දීර්ඝ කොට අවසානපදය ඌන කොට (හෙවත් පූර්වපාදයට වඩා ලුහුඬු කොට) එළි සම කොට බඳනා ලද මේ දෙපදය 'මුනිනඳන පෙරවිලඹු' නම් වේ.

නිදර්ශන:—

ගෙලගවකල[3] පුනිල්ලිනි මලවල ලෙල වරල්ලි නි
දිසි කෙනෙව් අවුල් ලිනි යසිල්ලි නි.

විස්තර.— මේ වෘත්තයෙහි මාත්‍රා ගුරුලඝු නියමයක් නැති හෙයින් මාත්‍රා අධික වෘත්තයකින් මුල් පදය ද මාත්‍රා අඩු වෘත්තයකින් දෙවෙනි පදය ද රචනා කළ විට මේ දෙපා සාල ලැබේ. භේද සංඛ්‍යා අප්‍රමාණ ය.

84. අර්ථ:— පූර්වපදය ඌන කොට එළි සම කොට බැන් දෙත් පරපදය විලම්බිත වන්නාවූ (මාත්‍රා අධික හෙයින් අවසානය ඉක්මන් නොවන්නා වූ) මේ වෘත්තය 'මුනිනඳන පරවිලඹු' නම් වේ.

නිදර්ශන:--

පුළුසුළුවිල් ගිලිල්ල මි ලො ල්ල
විසො හියො හිනසොතුන් හියල්ල හදතුරු සෝදුනාට මු ල්ල.

විස්තර:— මුනිනඳන පූර්වවිලම්බිතය විපර්‍යාස කළ විට මුනිනඳන පරවිලම්බිතය සෑදෙයි.

85 අර්ථ:— ඡන්දසෙහි අවසානාක්ෂරය දීර්ඝ වූ එළි සම වූ මේ වෘත්ත 'පිහිසොඹු' නමැයි දත යුතු. මීට නිදර්ශන මත් තෙහි ප්‍රකාශ වේ.

---

1 පරපද උනු කොටින්-පෙරැම් දෙපද දිගු කොට,
අවරපද දෙ දිගුකොට-පරපද දෙ උනු කොටින්.

2. උනු. 3 ගල ගලවන.

86. ගී සිව්පද ලකුණු-දෙකින් වැඩේ අත් සඳ,
සිතිලිගී ඛඩවක් සැහැලි-ලියහැලි නම් බැහැලි නම්.
87. සඳහැලි ඇහැලි නම්-රසහැලි විරිලි රාහැලි,
මිහිඳු සුරිඳු සරගහැලි-ඈ සඳ වෙසෙස් සම වේ.
88. අඹහැලි සුනිස් ඈ-ලකුණු මියුරු සඳ වේ,
නිදසුන් එසට ලකුණු ද-පවසමි මෙසින් මත්තේ. *

---

**විස්තර**:— ඡන්දස්ප්‍රස්තාරයෙහි දී ලැබෙන අනන්‍ය ලඝු වෘත්ත යකින් හෝ දෙකකින් එළි සම කොට බඳනා ලද දෙපදය **'පිහිසොඹු'** නම් වේ.

නිදර්ශන:—

**කිතුල් පත විහිදින මොර සැලි** — න
**දුඳුළුමග වැර 1 හින හිත් පිපිහි** — න

**විපාද ලක්ෂණ මෙතෙකින් සමාප්ත සි.**

——ඊංදි——

දැන් අනන්‍යච්ඡන්දසෙහි ලක්ෂණ දක්වන්නාහු 'ගී සිව්පද' යනාදිය කියත්.

**86. අර්ථ**:— අනන්‍යච්ඡන්දස ගීසිව්පද යන ලක්ෂණ දෙකින් වර්ධිතය වේ. (ඒ කවරේ ද? යත්:—) සිතිලිගී ය, ඛඩවක් ය, සැහැලි ය, ලියහැලි නම් ය, බැහැලි නම් ය.

**87. අර්ථ**:— සඳහැලි ය, ඇහැලි ය, රසහැලිය, විරිලි ය, රාහැලිය, මිහිඳු ය, සුරිඳු ය, සරගහැලිය (යන) ආදී ඡන්ද විශේෂ සම නම් වේ.

**88. අර්ථ**:— අඹහැලි, සුනිස් යනාදි වූ ලක්ෂණ ඇත්තේ මධුරච්ඡන්දස් නම් වේ. ඒ වෘත්තසමූහයට නිදර්ශන හා ලක්ෂණ ද මින් මතු ප්‍රකාශ කරමි

**විස්තර**:— සිතිලිගී ආදිය සමවෘත්ත යයි ද අඹහැලි ආදිය මධුරච්ඡන්දස් ය යි ද කියන ලද්දේ කවර හෙයින් දැ යි නො හැඟේ. එය පරීක්ෂා කළ යුතු යි.

අනන්‍යච්ඡන්දසට අයත් වෘත්ත උදෙසා ඒ එක් එක් වෘත්තයක ලක්ෂණ හා නිදර්ශන ද දක්වන්නාහු "සිතිලිගිය" යනාදිය කියත්.

---

1 ලූලම්භනවර.

* හැම පොත්හි ම මේ ගී තුන මූල සංඥා කාණ්ඩයෙහි යොදන ලද නමුත් ඒ තැන මීට නො ගැළපෙන හෙයින් මෙහි ගෙණ යෙදීමු.

89. ගීය මුල් අඩ[1] හා-සිව්පද ලකුණු දෙ පෙදෙන්,
සිතිලිගිය වෙයි දත් නෙන්-නිදසුන් නම් එහි බොහෝ[2]

90. එක් දෙතුන් ඉනිදු-දනු නමුදු නිදසුන්,
එකෙක් පසුමොළි නම්-දෙව්නළු සබරනළු අන්.

---

89. අර්ථ:— ගීයෙහි මුල් අඩිය හා සිව්පද විරිතක දෙපදය කින් ද 'සිතිලිගී' නම් පද්‍ය විශේෂය වේ ය යි දත යුතු යි. ඒ වෘත්තවිශේෂයෙහි නිදර්ශන වනාහි ඉතා බොහෝ යි.

විස්තර:— "ගීයමුල්අඩ" යන තැන්හි 'ගී' සදින් සියලු ම ගීවිරිත් ගැණේ. එහෙයින් තමන් කැමැති ගීයක මුල් අඩ හා එළි සම සාව් දෙපදයක් ද යෙදූ විට සිතිලිගී නම් වෘත්තය වන බව මෙයින් ප්‍රකාශිත යි. සිව්පදවිරිත් අසඞ්ඛ්‍ය ගණනක් තිබෙන හෙයින් සිතිලිගී ද අසඞ්ඛ්‍යගණනක් විය හැකි ය. නිදර්ශන බොහෝ යයි කියන ලද්දේ එහෙයිනි.

90. අර්ථ:— එයින් ද එකක් දෙකක් තුණක් පිළිබඳ නාම ද, නිදසුන් ද දත යුතු ය. එක් සිතිලිගියෙක් පසුමොළි නම් වේ. එකක් දෙව්නළු නම්. අනිකක් සබරනළු නම්.

1. 'පසුමොළි' සිතිලිගියට නිදසුන් මෙසේ යි:—

මොඩයක් සඳ පොපොයාන්-පිදිමෙන සරව නපුරෙහි[3] (ගීඅඩ)

කොළනට අප මා }
කොඩුන මා }දෙපාසාව

2. 'දෙව්නළු' සිතිලිගියට නිදසුන්:—

සමන් මුනිඳුතුමෝ-සරණසර පත් වඳිනුව,

නොදනා හට දිගා සක්දෙව් ඈ කල ණ
වැඩිඅා දිවි ද දෙනි නො වරා ලෙහි කුළු ණ[4]

3. 'සබරනළු' සිතිලිගියට නිදසුන්:—

දෙව් මිණිමුතු සපු-ගෙල වනළ ලෙල මල් දම,

අනෙහි පුළිල සල් අත් න
කිනෙහි ලකළ කේ පත් න.

---

1. පද. 2. නම් එහි මෙසේ. 3. පිළිඅත පුර තපුරෙති.

4. නුවනමත ඇස වුව-සරණ සරසත් අඳනය
නොඅදනා වදන සක් මමු පිලි වග න
මිමී එදිවියෙහි නො මිලා ලෙහි කුළු න.

91. ගිය මුල් අඩ * මුල-දෙපා පර විලඹුව වත,
විලඹු සිහිලිගි නම්-නිදසුන් එයට මෙ වේ.
සිහිලිගි සඳ සි.

---

**විස්තර:**— මේ සිහිලිගී තුණෙහි විශෙෂ ලක්‍ෂණ නො දක්වීම ග්‍රන්‍ථ කර්තෘගේ ප්‍රමාදයෙකි. විශෙෂලක්‍ෂණ නො දැක්වීම නිසා එක් සිහිලිගී වෙසෙසකින් අනික් සිහිලිගී වෙසෙස් වෙන් කර ගැණීම දුෂ්කර ය. එසේ වුවත් දක්වන ලද නිදසුන් අනු ව විශෙෂ ලක්‍ෂණ විනිශ්චය කර ගත යුතු වේ.

1. ගී අඩකින් හා මූනිනාදනපෙරවිලඹුවිරිතින් බැඳි දෙපාකවකින් ද යුක්ත වන්නේ පසුකෙළි සිහිලිගී යි.

(මෙහි නිදසුනෙහි පෙණෙන ගීඅඩ වනාහි පියුම්ගී, බමරගී, යොන්ගී යන මේ වෘත්තයක පූර්වාර්ධය යි.)

2. ගී අඩකින් හා සමුදුරුගොස් විරිතින් බැඳි දෙපා කවකින් ද යුක්ත වන්නේ දෙව්නළුසිහිලිගී යි. (නිදසුනෙහි පෙණෙන ගීඅඩ වනාහි ගී, දුවහගී යන විරිතක පූර්වාර්ධය යි.)

3. ගී අඩකින් හා උතුජ්ඣඳසට අයත් වෘත්තයකින් බැඳි දෙපා කවකින් ද යුක්ත වන්නේ සබරනළු සිහිලිගී යි. (නිදසුනෙහි පෙණෙන ගී අඩ පියුම්ගී, බමරගී, යොන්ගී යන මේ වෘත්තයක පූර්වාර්ධය යි. දෙපා කව මාත්‍රා එකොළොසක් ඇති උතුසඳසෙහි 68 වැනි වෘත්තයෙන් බඳින ලද්දකි. එක් සංස්කරණයක පරිදි 'අත්තා' 'පත්තා' යි අග වර්ණයන් ගුරක් කොට ගතහොත් මාත්‍රා දොළොසක් ඇති උතු සඳසෙහි 13 වැනි විරිතෙන් බඳනා ලද්දකැයි කිය හැකි වේ.)

ඒ සිහිලිගී තුණෙහි විශෙෂලක්‍ෂණ මෙපමණෙකි. මීට වඩා විශෙෂයක් කිමෙහි අපි නො පොහොසතුම්හ.

**91. අර්ථ:**— ගීයෙහි පූර්වාර්ධයට මූලින් අපරවිලඹු දෙපා කව වතොත් 'විලඹු සිහිලිගී' නම් වේ.

එයට නිදසුන් මෙය යි:

මෙරජවල හුනු කඹලවනන කැල් මා } දෙපාපර
මෙමනකල තුඟබර මඳලඝනැල්ම නිල් කැල් මා } විලඹු.

දුමුඹින් දග දනග-අගේ සඳින් මහ සැල්ම (ගී අඩ.)

---

* පද.

92. එක් කල හොත් සිතිලි-ගී යුවලෑ සැදෙන්නේ [1]
ඛාඩවක් නම් ලකුණු ඡ්-සපද විලසින් [2] දන්නේ.

93. මෙහි නව දෙලොස් පසලොස් [3] -උණුසම වසම්
පුණු ඈ,
විරිත් වෙසෙසුන් බඳනේ-විරිත් නන් සුවහස වේ.

ඛාඩවක්සඳ යි.

---

විස්තර:—විලම්බු සිතිලිගීය අනික් සිතිලිගීවලට වඩා බොහෝ වෙනස් වේ. අනික් සිතිලිගීවල මූලට ගී අඩ යෙදෙන නමුත් මෙහි මූලට යෙදෙන්නේ අපරවිලම්බු දෙපා සාව ය. ගී අඩ යෙදෙන්නේ අවසන්හි ය.

සිතිලිගීජඤස සමාප්ත යි.

---

92. අර්ථ:—සිතිලිගීයුගල ආදිය එක් කළොත් 'ඛාඩවක්' වෘත්තලක්ෂණය සිද්ධ වන්නේ ය. ඒ ඛාඩවක් ලකුණු ෂට්පද සෙයින් දත යුතු.

93. අර්ථ:—මේ ඛාඩවක්හි නවපද ය, ද්වාදශපද ය, පඤ්ච දශපද ය, උෂ්ණ ය, සම ය, විෂම ය, පූර්ණ ය යන ආදි වෘත්ත විශෙෂ බන්ධනය කළ යුතු. වෘත්තයෝ නොයෙක් සියදහස් ගණන් වෙත්.

විස්තර:—'ගීයුවලෑ' යන තන්හි ඈ සදින් ත්‍රිකචතුෂ්ක ආදිය ගත යුතු යි. එහෙයින් සිතිලිගී යුවලක් එක් කළ විට සපද ඛාඩවක් විරිත ද, සිතිලිගී තුණක් එකතු කළ විට නවපද ඛාඩවක් විරිත ද, සිතිලිගී සතරක් එකතු කළ විට දෙලොස්පද ඛාඩවක් විරිත ද, සිතිලිගී පසක් එකතු කළ විට පසලොස්පද ඛාඩවක් විරිත ද සිද්ධ වේ. සිතිලිගීයෙහි ඇතුළත් වන ගීඅඩ එක ම පාදයක් සේ ගෙණ ඛාඩවක් විරිතක් පද සයක් ලෙස සලකනු ලැබේ. දසපද උපජාති සැහැල්ලට පෙන්වූ නිදසුනෙන් එය තව දුරටත් ඔප්පු වේ.

ලුහුඬු සිතිලිගීයක් හා දික් වූ සිතිලිගී ද එකතු කළ විට (නොහොත් ගීඅඩියට වඩා අඩු මාත්‍රා ඇති දෙපාසාව් සහිත සිතිලිගී දෙකක් එකතු කළ විට) උෂ්ණඛාඩවක් විරිත් ද, එක ම ලක්ෂණ ඇති සිතිලිගී එකතු කිරීමෙන් සම ඛාඩවක් විරිත් ද, විෂමලක්ෂණ ඇති සිතිලිගී එකතු කිරීමෙන් වසම් ඛාඩවක්

---

1. යුවලක් ද දන්නේ. 2. ෂිව්පදසෙයින්. 3. මෙහට දෙළසටලොස්.

94\. කඩවක්හි පිරියත-සිව් පෙදෙහි ගම් විරිතක්,
බඳ හොත් දන්නේ එ ම-උවඳු නම් සැහැලි යැ සි.

---

විරිත් ද, ඌනකඩවක්විරිත මෙන් නො ව සැමතන්හි එක ම ප්‍රමාණ ඇති සිතිලිගි එකතු කිරීමෙන් පුණ්ණකඩවක් විරිත් ද සිද්ධ වේ. උනුකඩවක් විරිත විෂම ද, පුණ්ණ කඩවක් විරිත සම ද වන්නේ ය. 'පුණ්ණ ඇ' යන තන්හි ඇ සඳින් අටලොස් පද එක්විසිපද ආදිය ගණු ලැබේ. සිතිලිගි විරිත් අසංඛ්‍ය හෙයින් ද, නොයෙක් ලක්ෂණ ඇති සිතිලිගි එකතු කිරීමෙන් කඩවක් විරිත් සාදනුලබන හෙයින් ද කඩවක් විරිත්වල සංඛ්‍යාව ද නියම කිරීම පහසු නො වේ. "විරිත් තන් සුවහස් වේ" ය යි කියනලද්දේ එහෙයිනි.

මේ කඩවක් විරිත්වලින් බැඳි පද්‍යයෝ දැනට තිබෙන කාව්‍ය ග්‍රන්ථයන්හි නො පෙණෙත්. එහෙයින් වුවමනා නම් ඒ විරිත් වලට නිදසුන් තමන් විසින් ම සාදා ගත යුතු.

සපද කඩවක් විරිතට නිදසුන්:—

නැගී එසොර එයට-වළකට කවුළුවලිහෙනි,
කුළුණු තුමි වෙසෙස් වෙස පැසේ විල සා
වමියන් අඩනෙත් මිණිකග ගෙණ සහ සා } සිතිලිගි 1.

තමහට බැලුම්හි-නනබැම සැව්හි ගොදමින්,
එනිරිඳු මනයොනගු විඳ ගත පිටු නො ගත
ඔහු ගත හුරිරු නැවරුම් ලප විලස ග ත* } සිතිලිගි 2.

කඩවක් ඡන්දස සමාප්ත යි.

---

95\. අර්ථ:— කඩවක් විරිත් අවසන්හි සිව්පද ඡන්දසක යම්කිසි වෘත්තයක් බැන්දෙත් එම වෘත්තය උපජාති නම් සැහැලි වෙසෙස යයි දත යුතු යි.

---

* නැගී එසොර එයට-වළකටවුළු වලාහෙනි,
කුළුඹුම් වෙසෙයා සේවිලස යා
වුම්දන වවණ්ඩා නෙනෙ මිණිකග ගෙණ සහසයා.

තමහට බැලුමැසුන්-සූනත බැම්සව් හැඳමෙනි,
එනිරිඳු මන යොනහු ගත පිටු නො ග ත
ඔහු සහ සොර කුරිරු කවරන් විදුම ලප ග ත-බොහෝ.

95. දස බර තුදුර සොළොස්-අටළොස් උනු ද සම පුණු,
ගාහ නමින් පළ වූ-විරිත් නන් සුවහස් වේ.

---

95. අර්ථ:— දශපද ය, ද්වාදශපදය, චතුර්දශපද ය, ෂොඩශ පද ය, අෂ්ටාදශපද ය, ඌන සැහැලි ය, සම සැහැලි ය, පූර්ණ සැහැලි ය, ගාහ යන නමින් ප්‍රකට වූ සැහැලි දූයි සැහැලි වෘත්තයෝ නොයෙක් සියදහස් ගණන් වෙත්.

විස්තර:— කඩවක් විරිතක අවසන්හි යම් කිසි වෘත්තයකින් බැඳි සිව්පදයක් යෙදූ විට උපජාති සැහැල්ල සැදේ. සපද නව පද, දෙළොස්පද ආදි කඩවක් විරිත් ඇති බව යට දක්වන ලදී.

සපද කඩවක් විරිත් අවසන්හි සිව්පදයක් යෙදූ විට දස පද උවඳු සැහැල්ල ලැබේ.

නවපද කඩවක් අවසන්හි හෙවත් සිතිලි ගී තුණකින් මත්තෙහි සිව්පදයක් යෙදූ විට 'ලියහැලි' නම් විරිත වේ යයි ද සිතිලිගී සතරකින් මත්තෙහි සිව්පදයක් යෙදූ විට බැහැලි නම් විරිත වේ ය යි ද මතු කියනු ලැබේ.

එහෙයින් මේ සැහැලි සඳසෙහි පද වැඩි වන්නේ සිතිලිගී වැඩි වීමෙන් නො ව දෙපා සිව්පා විරිත් වැඩි වීමෙන් ය යි හැඟේ. දසපදසැහැල්ල අගට දෙපා කවක් එකතු කිරීමෙන් දෙළොස් පද සැහැල්ල ද, සිව්පදකවක් එකතු කිරීමෙන් තුදුස්පද සැහැල්ල ද සිද්ධ වන බව සිතිය හැකි ය. දෙළොස්පද ආදි සැහැලි කොතෙක් සැදේ දූ යි විනිශ්චය කිරීමට මීට වඩා අතික් ක්‍රමයක් නැත්තේ ය. දෙළොස්පද සැහැලි ආදියට නිදසුන් වශයෙන් මෙහි දක්වන ලද එක ම සැහැල්ලක වත් දසපදයකට වඩා නැත. දෙළොස්පද සැහැලි ආදිය කාව්‍ය ග්‍රන්ථයන්හි ද දුර්ලභ ය. ඒ සැහැලිවල ඇතුළත් වන සිතිලිගී ආදිය සම්බන්ධ ප්‍රමාණ නියමයක් නො කට හැක්කේ එහෙයිනි.

සිංහල සන්දේශ කාව්‍යයන්හි **දසපද උවඳු සැහැලි** නම් සුලභ ය. මෙහි ඊට දක්වනලද නිදසුන මෙසේ යි:—

**1. සතර බඹු මුහුණු-කොමෙ එක බැලුම් නැතියේ,**
**මහබඹ මුඛට කුමට සොළෙ කුකුස් පු ර**
**උරා උරලග නො වහව මොහු පස් ස ර**
**බලදෙව් උළෙල මුන්-නොගන් මුවන් දෙවිය හා,**
**බහු උරතල සිරිවමියන් වෙසෙති යෙ ති**
**පෙම්සද් වසණ ගම මත[1] නම් කෙසේ පද ති**

---

1. මෙසේ දෙස්නවමත.

දළ දප් සඳ කුමර පියවන් ඉනා ස — ග
නොරැඳ වෙසත් දෙව්දුහු ඉසිසැව්ව හැ — ග
රදු සුරිඳු දු හෙම හඳ බෙයඩ ලු බුජ — ග
මමනමුකහට දෙහෙව් මුවර දෙදෙ නර — ග

මේ උපජාති සැහැල්ල යි,

(වැඩි අර්ථයක් නැති දික් වූ නිබන්ධයන්ට ද උපහාස වශයෙන් "හැලි" ය යි ව්‍යවහාරයක් තිබේ. ඒ ව්‍යවහාරය ඇති වූයේ මේ සැහැලි නිසා ම යයි සිතිය හැකි ය. මේ සැහැල්ලෙහි රම්‍ය වූ අර්ථයක් තිබෙතත් කාලාන්තර සඤ්ජාත දෝෂ හෙතු කොට ගෙණ එ ම අර්ථය පැහැදිලි ලෙස තේරුම් ගැණීම දුෂ්කර ය. එලු සඳස් ලකුණ මුද්‍රණය කරන්නට පෙර මේ සැහැලිවල අර්ථය මෙතරම්වත් තේරුම් ගැණීම පහසු නුවූ බව කිය යුතු නො වේ. එකල්හි මේ සැහැලි පෙණෙන්ට ඇත්තේ අර්ථයක් අපෙක්‍ෂා නො කොට වෘත්තලක්‍ෂණ පමණක් ඇති වන සේ යොදනලද වචන සමූහයක් ලෙස ය. එහෙයින් 'සැහැලි' යනු නිරර්ථක වචන රාශියකැ යි සමහරු සිතූහ. එසේ සිතූ බොහෝ දෙන නිරර්ථක සේ තමන්ට පෙණෙන සියලු වචන පඞ්ක්තිවලට ම සැහැලි (=හැලි) යයි ව්‍යවහාර කරන්ට පටන් ගත්හ. ඒ ව්‍යවහාරය අද දක්වා උගතුන් අතර ද පවතී.)

දෙලොස්පද උපජාතිසැහැල්ලෙම දක්වන ලද නිදසුන මෙසේයි:—

2. සිරිත් විරිත් ලකුළු-කා පෙරහර සව්බඳ,

ලකුළුයන් සැදි මහවනනට මහ ව — න
ලෙලෙගෙල දෙදෙනන දී ඇර පැහැ ප — න

සිසිරැස් කැලුම් සුදු-වියනක් ලෙසින් පිළිගෙණ,

ලකළවල්බර තුරු පෙන කැල්ම ව — න
වදමරුමුවරඳිනවුල් හමන වැලිතලා සහ — න

නිරිඳු දූ ඕදෙව් සැදි ගජ පිට ගු — න් නෙ ය
දුමු දන තුවන් මන නොස පුරව — න් නෙ ය
වසන සන සැණ කෙලි කෙළනට උ — න් නෙ ය
සවර කිවියරොහු සිව්රඟ වණ — න් නෙ ය.

මේ උපජාති දෙළොස්පද සැහැල්ල යි.

දෙලොස්පද සැහැල්ලට නිදසුන් වශයෙන් දක්වනලද මේ සැහැල්ලෙහි දෙලොස්පදයක් නො පෙණේ. මෙය දෙලොස්පද සැහැල්ලක් නම් මීට මුලින් දක්වන ලද්දේ ද දසපද සැහැල් ලක් නො ව දෙලොස්පද සැහැල්ලකි. මුලින් දක්වනලද්ද දසපද සැහැල්ලක් නම් මෙය දෙලොස්පද සැහැල්ලක් වීමට තවත් කව් දෙපදයක් එකතු විය යුතු යි. එක් සංස්කරණයක අමුතු කව්දෙපදයක් තනා මීට එකතු කරණ ලදී. මෙහි ද කිප පලක් ම දෝෂ දූෂිත ය.

තුදුස්පද උපජාතිසැහැල්ලට දක්වනලද

නිදසුන මෙසේ යි:—

3. ගිම්දූදුරෙ ගුගුරණ-සිහ වග සඳුල් වරනග,<br>
කොළෙනා කිරිහයන් හයරුපු වෙහෙල් කැ     නා<br>
ගවර සස සලල මුවදුන් විලිමුව     නා<br>
මියුරුසර කලරැව්-කිඳුරු පරපුටු සැවුලන,<br>
දෙව්දූ සෙන් බලා සක්වා තිසර පෙ     ළ<br>
කෙළන මියුරු දූරු මිහිඳුරු පෙළින් ලෙ     ළ<br>
කනන හිසා වඳු රණ මල් වගු     රණ<br>
මිණිමුතු මතු සඟු රණ බිඟු ගුගු     රණ<br>
දුති මුනි පාකඩ රණ මැද නිතො     රණ<br>
වැඳ සනසා නස රණ තෙලෙ අන     රණ

මේ උපජාති තුදුස්පද සැහැල්ල යි.

(මෙහි ද පදදසයක් මිස පද තුදුසක් නො පෙණේ.)

---

සොළොස්පද උපජාති සැහැල්ලට දක්වනලද

නිදසුන මෙසේ යි:—

4. සැහැසෙමින රුදුවන්-කුපිරු රකුස්බල ගෙණ,<br>
ගිනි වන් යහුල් ගැලිය දල දූ     ළිය<br>
කර මින් නලල් තෙලිස රළ රැ     ළිය<br>
දෙ අතින් ඇද කොපොල්-බොල් සම බබුරුවලකට,<br>
ඇවිළිසෙ දල දැලිය රත හ     ළයා<br>
පැලඹෙමිගෙනරණ මහත් කරිමුඵ පු     ළයා

උපුම ගිරිකුළු නගන්නී ඇර ගඝ න් නී
ගිනි ගත් සකුළු දමන්නී සෙද පෙණෙ න් නී
තද ව මුව බෙර ගසන්නී උස ඝෙබණෙ න් නී
බලා ඔවුන් නොසැලෙන්නී තා වඩ න් නී.

මේ උපජාති සොලොස්පද සැහැල්ල යි.
(මෙහි ද පද සොළසක් නැත්තේ ය.)

---

උපජාති අටලොස්පද සැහැල්ලට දක්වනලද නිදසුන මෙසේ යි:—

5. පළඹු පැලෙව් පල ව–සල සුදුපොකුරකුරෙව්,
තෙවු නා තා නිකු තා
කෙලෙනා ලෝ නිසි තා
උළිඳු මඩුලු සිරින්–පිළිබලසෙන් සඳනෙයි,
සිරි සා තා ලෙසි නුමු තා
පැහැ පතා සැදම ව තා.
නො පැ රිව් හා සඳ අස් වි ද
සතර තරු බිරි ඳ උදුල බ ඳ
පරයා කිරිමුහු ද පැහැ සි ඳ
වදිම් වදිම් ස ඳ සොමි පබ ඳ

මේ උපජාති අටලොස්පද සැහැල්ල යි.
(මෙහි ද අටලොස්පදයක් නැත.)

මෙහි නිදසුන් වශයෙන් දැක්වූ සියල්ල ම දසපද සැහැලි යි. දසපද සැහැල්ල නොයෙක් ලෙසින් සිටිය හැකි බව දක්වනු පිණිස ග්‍රන්ථකර්තෘ විසින් ම මේ සැහැලි යොදනලදී. "දසබර තුදුර" යනාදි ගීයෙන් දක්වන ලද දෙළොස්පද සැහැලි ආදියට ග්‍රන්ථ කර්තෘ විසින් උදාහරණ නො දක්වන ලදී. දසපද සැහැල්ල සාදනා අයුරු උගත්විට ඒ අනුසාරයෙන් දෙළොස්පද සැහැලි ආදිය ද සාදා ගත හැකි හෙයිනි. මේ බව නොසැලකූ මැන සිටියෙකු විසින් මේ සැහැලි දසපද දෙළොස්පද ආදි සැහැලි වලට නිදසුනැයි සිතා සැහැලිවල පාදසඞ්ඛ්‍යාව නෝ රචනා විලාසය ගැණ නො සිතා එක් එක් සැහැල්ල අවසන්හි "මේ උපජාති සැහැල්ල යි. මේ උපජාති දෙළොස්පද සැහැල්ල යි" යනාදි වාක්‍ය යොදන ලදැ යි සිතිය හැකි ය.

දෙළොස්පද සැහැලි ආදියට යට කී උපදෙස අනු ව නිදර්ශන තමන් විසින් ම සාදා ගත යුතු යි. සැහැල්ලෙහි පාද

**96. දෙඅඩ සපුණු කොටින්-බඳ'න් පද අට උනු කොට,**
**උනුහැලි නමැයි දන්නෙ-සෙසු සඳැසෙහි දු මෙ නියේ.**

---

කොපමණ තිබුනත් එයින් වර්ණනා කරණු ලබන කරුණ එකක් ම විය යුතු යි. මෙහි දක්වන ලද එක් එක් සැහැල් ලෙන් වර්ණිත වූයේ එක් එක් කරුණකි. සැහැල්ලෙහි ඇතුළත් දශපාදයෙන් ම ඒ වර්ණනාව අවසන් කොට තිබෙන බවත්, තවත් අධිකපාද අපෙක්‍ෂා නො කරණ බවත් පෙණේ.

---

96. අර්ථ:— ගී අඩි දෙක සම්පූර්ණ කොට ඉතිරි (සිව්පද ලකුණු ඇති) පද අට ඌන කොට ද බඳනාලද්ද **'උනුහැලි'** නමැයි දන්නේ ය. සෙසු (දෙලොස්පද සැහැලි ආදී) ඡන්දස්හි දු මේ ක්‍රමය යි.

**විස්තර:**— මෙහි 'දෙඅඩ' යනුවෙන් දසපද සැහැල්ලෙහි ඇතුළත් ගී අඩි දෙක ගැණේ. (සැහැල්ලෙහි දී ගී අඩිය එක් පාදයක් ලෙස සලකනු ලැබේ.) ඒ ගී අඩි සිව්පද පාදයන්ට වඩා දික් කොට ද සිව්පද පාද ඊට වඩා ලුහුඬු කොට ද බඳනා ලද්දේ උනුහැලි නම් වේ.

ඌනසැහැල්ල පටන්ගන්නේ දසපදයෙනි. දෙලොස්පද, තුදුස්පද ආදී ලක්‍ෂණ ඇති උනුහැලි ද තිබෙන බවත්, එහි ද ගී අඩි දෙක සිව්පද ලකුණු වලට වඩා දීර්ඝ කොට යෙදිය යුතු බවත් "සෙසු සඳැසෙහි දු මෙ නියේ" යනුවෙන් හඟවත්.

**දසපද උනුහැල්ලට දක්වන ලද**

නිදසුන මෙසේ යි:—

**කොසේ මිහිරි වඩමිනි-ඊලෙ ලෙස පායමිනී,**
**සඳ නැඟි වන පෙ  න**
**සිරි වමි පිළි මු  න** 1
**එසිරිනද වසනා-සරා මදයෙන් මනා,**
**ඇත් ඇණිය ගිනි ඔමි  නි**
**කුළු පරපුටු මදු බිලෙ  න්**
**සලි මුවරඳ ගෙණ සුමු  ඩු**
**ලෙහි වනසෝ නො කොට අ  ඩු**
**හැමි මුවරද රම සුමු  ඩු**
**යහ වෙ හා බවුන් වැ  ඩු**

---

1. සිරිවමි ඉකල්ලෙහි පිළිමූන.

**97.** **නැත ද 'රුත් දිගු වුව*-අකුරන් දෙතුන් තන්හි,**
**සිව්පද හා වුව බිලි†-මෙ විරිත් ගාහ නම් වේ.**

*A* **මෙම තියෙන් තන්කෙළ සුවහස් සැහැලි විරිත් දත යුතු.**

**98.** **සිතිලි ගී තුණකින්-පිරියත්හි සිව්පදයෙන්,**
**යම් කිසි විරිත් බඳුයේ-ලියහැලි නමැයි දන්නේ.**

**මෙහි දු නන් සූවහස් විරිති.**

---

දෙළොස් පද උනුහැලි ආදියට හා සමපුණ්ණසැහැලිවලට ද නිදසුන් මෙහි කී ක්‍රම අනු ව තමන් විසින් ම යොදා ගත යුතු යි.

---

**97.** අර්‍ථ:— අර්‍ථයක් (=ප්‍රයොජනයක්) නැතත් දෙතුන් පලක අක්‍ෂර දීඝී වූවොත් සිව්පදයත් බලවත් (දීඝී) වූවොත් මේ (සැහැලි) විරිත 'ගාහ' නම් වේ.

**විස්තර:**— 'ගාහ' යනු ද සැහැලි වෙසෙසකට නමි. එහි විශෙෂ ලක්‍ෂණ නම් දෙතුන්පලක අක්‍ෂරයන් දීඝී කොට යෙදි මත් අවසාන සිව්පදය අනික් පාදයන්ට වඩා දීඝී කිරීමත් යන මේ යි. මෙහි ද දෙළොස්පද ආදි සැහැලි ද ඇති විය හැකි යි.

ඊට නිදසුන් මෙසේ යි:—

**වටාන ලොව වටාන-සෙද නිලුපුල සියනා,**

**පතල ගම්වතා ලමත බිඟුන් කැ නී**
**අඳුර ග නා මදුර කොට රූ දෙවැ නී**

**හසා සමනා නම්-කණාත මුව සඳ මඬලෙහි,**

**සරවා නම දවා නුබ සසල හස් කැ ල**
**සැදිසා නෙත් ඇදිය පුල් ගෙදිගු වි ල**
**මවන මදවතුරැ බඳ ගොර, පොර ඇත් මුළු දුරා ක රා**
**හැසෙන දල තරණ ගිනි ගිනි, පතල පතර තඹුර වු රා**
**බලමුළු දප්සර විහිඳු රුදු, උරවිසි ගිණී ගිය රා**
**කිඝරුදු එනුවර ම විසිතුරා, අසා නො මුස් විසි රා.**

**ගාහ සැහැල්ල යි.**

*A.* මේ ක්‍රමයෙන් නොයෙක් කෙළ සියදහස් ගණන් සැහැලි විරිත් දත යුතු යි.

---

**98.** අර්‍ථ:— සිතිලි ගී තුණකින් අවසන්හි සිව්පද ඡන්දසින් යම් කිසි වෘත්තයක් බඳනා ලද්දේ 'ලියහැලි' නම් වෘත්තය වේ ය යි දත යුතු යි.

---

* කොට. † යති හා පද බිලිවුව.

**99. සතර සිතිලිගියෙන්-අන්ගි ලා සිවිපද,**
**බඳ හොත් බැහැලි නම් වේ-මෙහි දූ නන්විරිත් වෙ.**

---

මේ ලියහැලි ඡන්‍දස්හි ද නොයෙක් සියදහස් ගණන් වෘත්ත යෝ වෙත්. (නානාවිධ සිතිලිගී හා අනෙකප්‍රකාර සිවිපද වෘත්තත් මෙහි යෙදිය හැකි හෙයිනි.)

ඒ ලියහැල්ලට දැක්වූ නිදසුන මෙසේ යි:—

සලා අසි අසෙසා-මියිලොල්ලෙක් වෙණෙහි ගිය,
ඕඳ ඕගිලැල් විල් ස ම රැ
පුල් නාඹරිළු ෂැර බැහැ රැ
} සිතිලිගී 1.

කිබී නොලදිනස්වස්-පිළිපන් පුවන ගළනට,
වැස මිණි දැදිමි සිලි ල් ලෙහි
නී කොළඹිළු පිය ල් ලෙහි
} සිතිලිගී 2.

බමක් නො සන්නෙම්-නො ගැණ එදූ රිසිවැඩ,
වැද මද මත ගජ ගෙ ලෙහි
බැස කොපොලත මද දෙ ලෙහි
} සිතිලිගී 3.

බමන්න ඝන්තල පැහැස ර
පල ලද ර්ලේ එම බ ර
සෙරෙනා සෙපියන් නො සම ර
එ ලොලුන් ගන්නේ කිසි බ ර.

මේ නිදශීතයෙහි ද සාවද්‍යස්ථාන තිබේ. ඒවා වෙනස් කරන්ට උත්සාහ නො කෙළෙමු. ලියහැලි ලකුණු දක්වා ගැණී මට ඒ දොෂයන්ගෙන් බාධාවක් නො වේ.

---

99. අර්ථ:— සිතිලිගී සතරකින් අන්තයෙහි සිව්පදයක් බැන්දෙත් 'බැහැලි' නම් වෘත්තය වේ. මෙහි දූ නොයෙක් වෘත්තයෝ වෙත්.

නිදසුන් මෙසේ යි:—

නගන්නට මල්රොන්-නරනිඳු වහා අත ඔත,
මුළු නී මලු නී
කිලිනි බලි නී
} සිතිලිගී 1.

මා හා කුමට අවි-යෙන් නො මද උයන්හි,
කුමට බඹර (ගණ) රම ණි
ගිගුම් සරෙනි සිතු හර ණි
} සිතිලිගී 2.

සහොටා කුම් හේ-අහෝ තුරු වේහි,
ෂෝලගෙහි ලෙහෙනුනි වෙහෙළු නි
මිසුලෙනි නෙත්යුත් සැලුමෙ නි
} සිතිලිගී 3.

**100. සිතිලිඟි පසෙකින්-දෙපද සිව්පද දෙක වුව** 1
**පෙර සේ නන්විරිත් වූ-සඳහැලිය මේ නිදසුන්.** 2

---

කිස නැත්තියට මා-විසින් කොහෙ අවුල් පැන්, } සිතිලිඟි 1.
පලාකුල තුනු තබා පවුලු ලම්බා
ජ් එම්බා කොලගෙකි ලම්බා

පලු කුසුමුල වසතිඳුහු අත නී
බැර නොව ගැතින බමරුන් බුමුන නී
මලකරලෙ දුහර පිපි අපිරිමන නී
මෙ රුක මෙ නොදහව් මොර පියපත නී

බැහැලි සඳ සි.

---

**100. අර්ථ:—** සිතිලිඟි පසකින් දෙපද සිව්පද යන දෙක වුවොත් පෙර පරිද්දෙන් ම නොයෙක් විරිත් ඇත්තා වූ සඳහැලි නම් වෘත්තය වේ.

නිදර්ශන මේ සි:—

නිම්දු වැනි මහබසු-පඞ් දෙද හල රහවිස } 1.
නන් බසතුරු අතෝ න හා
හව්රසයුත ගතෝ න හා

ඉතිපැහැබර දූන-තිළි මිලි කසු තෙලෙගත } 2.
නන් ලියසුරු කොවින් ග හා
සිව්පත් සිතෙනිම් මන හා

සොදනා තිපිසන-නම සරණ හා තැන් දූන } 3.
වසන් නිවෙන රත න ල ලා
ලලා මඳින් වඳ උ ල ලා

පුළුලාව පානව-සැරියුත් මියුරු සව්සුම් } 4.
නල හෙත මිලියන නත හම් නි නී
පිළි හොවිලි විලසින් හෙලම් නි නී

ගිය ගමනොමින් විල-සින් ම පැන පැන පැදි } 5.
ගුණු නුවනෙහි නිල් කැලු මි
රත ලවනෙහි රති කැළු මි

රහො නො ඉරහ පිණි ස } දෙපාතව
බැඳි නලකැන් රසහ ස

---

1. සිතිලිඟියෙන් පසෙක් දෙපද සදින් උතුම්වුව.
2. සඳහැලියෙයට නිදසුන්.

**101.** සිතිලිගී සසකින්-සළි[1] සිව්පද තුණකින්,
සමඑළි* දෙපද එකකින්-බඳ හොත්[2] ඉති බතිස්නෙන්.

**102.** නන්විරිතින් සැදි-සපුණු කොටින් බඳ ඒ,[3]
ඇහැලි නම් වි දන්නේ-නිදසුන් ද දනු[4] මෙලෙසින්.

---

| | | |
|---|---|---|
| කම පුර ඉසුරු කා බැ | ස | සිව්පා කව. |
| කිම සැලසෙනු කිවින් බ | ස | |
| මහබා ඉසුරු නොපෙ බ | ස | |
| පවකින කාජ් සිය දහ | ස | |

සඳහැලි සි.

---

**101.** අර්ථ:— සිතිලි ගී සගකින් ද, නැමත සිව්පද තුණ කින් හා සම එළි ඇති දෙපද කවකින් ද යි මෙසේ (පද) දෙතිසකින් බැන්දෙත්—

**102.** අර්ථ:— නොයෙක් වෘත්තයන්ගෙන් සජ්ජිත වූ සම්පූර්ණ කොට බඳනාලද ඒ වෘත්තය '**ඇහැලි**' නමැ යි කියා දතයුතු. නිදර්ශන ද මෙලෙසින් දතයුතු.

**1** දිසවැඩ සෙසින් වැඩ-හිමවු ඉසි සනිපාවට

| | |
|---|---|
| යන දෙඹිඳු ඇහැ | ල්ලිය |
| බිඳු නිය ව නම | ල්ලිය |

**2** සව්බරණ දුලනු ව-රැසිරග දෙ දුහුනු දන

| | |
|---|---|
| දකිඹිනුදු ඇහැ | ල්ලිය |
| නොදිසිනි බැණ හැ | ල්ලිය |

**3** තිදස ගොස් නොසරස්-සුර අසරන් දූහැ මෙනෙකි

| | |
|---|---|
| බිකු නැගි සො හිදූ | ල්ලිය |
| රූසිරි සියුමැ | ල්ලිය |

**4** පොලොඹා දෙවසරන්-හා සිදු ලිය කිඳුරන

| | |
|---|---|
| දූන එහසුන් ඇ | ල්ලිය |
| සිද ලදගන ක | ල්ලිය |

**5** පහන් පිලි නම-පහස විනා දස මුහුණු

| | |
|---|---|
| නැලග විසිදු හැ | ල්ලිය |
| මලිනවුල එ ම | ල්ලිය |

---

1 එළි. 2 පදයුත්, 3 බඳුයේ, 4 නිදසුන්ද වේ, * එම එළි.

6 ඉසි තෝ සෝසෙක-තවුසා පෙරට ව මඟා
ඉසි තිස් ගසා එතෙන දිව සියො නාසක කි ල්ලිය
සුපිඳු පල එලඳු විසින් පලු ලොහොමාන ක ල්ලිය
7 පහසින් උමතුබැවින් වැද තව පැල්හි හැ ල්ලිය
නොයෙක වර තවුසා පෙරට ව වහා එහ ල්ලිය
බලා එ තැන්හි ම සරණ මුවා මුව පෙ ල්ලිය
මෙවලු මෙන්හිම නොසරෙහි අනඟ මද ක ල්ලිය
8 (බලා එතැන්හිම සරණ මුවා මුව පෙ ල්ලිය *
මෙවලු මෙන් හිම නොසරෙහි අනඟමද ක ල්ලිය)
කිමෙක සසි සිත කුකුසු ලෙහි දිලෙහි ක ල්ලිය
දෙවිඳුනුබැව් සෙද දත සැලලෙහි තනි හැ ල්ලිය
9 පලු ලොහොමා කුමට අවුදු මෙ පාන ස ල්ලිය
නොසිඳුලනෙ නොසි එවන මහට මේ ව ල්ලිය
නගසවසිනි නො ම සැර තෙනෙසි ඒ ව ල්ලිය
ඉමු සමට පිහි දෙකොණෙහි කොළෙ ගල් හැ ල්ලිය
10 හඩා නොවුන් වනින් අසල් හිම මට හ ල්ලිය
සමස්නි නොබන යලින් කෙවි කෙවි ල්ලිය

ඈහැලි සඳ සි.

විස්තර.— සූත්‍රයෙහි කී පරිදි මෙහි පද තිස් දෙකක් සම්පූර්ණ බව පෙණේ. තිදශීතය කොපමණ දෙෂ දූෂිත ද යත් අටවැනි පද්‍යයෙහි මුල් අඩ නැති වීමෙන් එය පිරිමසනු සඳහා හත්වැනි පද්‍යයෙහි අන්තිමාර්ධය ම ගෙණ යොදා තිබීමෙන් ම පැහැදිලි වේ. මෙහි නොයෙක් ලක්ෂණ ඇති සිතිලි ගී හා නොයෙක් වෘත්ත වලින් බැඳි සිව්පද හා දෙපද ද යෙදිය හැකි හෙයින් භෙද සඞ්ඛ්‍යා අප්‍රමාණ ය. 'සපුණු කොටින් බඳ' ය යි කියන ලද්දේ කවර හෙයින් දැ යි නො තේරේ. කෙසේ සම්පූර්ණත්වය වේ ද? යනුත් තිදශීතයෙහි පෙණෙන පරිදි සිතිලිගීවල යෙදුනු දෙපා කව් ලුහුඬු ද සිව්පද කව් දික් ද කොට බැඳීමෙන් සම්පූර්ණත්වය වේ ද? යනුත් පරීක්ෂා කළ යුතු.

* මෙහි මුලින් පැවති කවි අඩ නැති වීමෙන් එය පිරිමසනු සඳහා මුල් කවෙහි අන්තිම අර්ධය ම ගෙණ යොදනලද බව හැගේ.

103. රසහැලි විරිල්ලෙහි-රාහැලි මිහිඳු සුරිදෙහි,
වැඩි කොටින් සිතිලිගී-පිළිවෙළින් බැඳුමෙහි ලා.[1]

104. සිව්පද දෙපද හෝ-මන පමණ කොට පිරියනැ,
බඳු කැමැති විරිතින්-විරිත් එහි දු නොමින් වේ,

---

**103.** අර්ථ:— රසහැල්ලෙහි ද, විරිල්ලෙහි ද, රාහැල්ලෙහි ද, මිහිඳු නම් වෘත්තයෙහි ද, සුරිදු නම් වෘත්තයෙහි ද ක්‍රම යෙන් සිතිලිගී වැඩි කොට බැඳිමෙහි දී—

**104.** අර්ථ:— (සිතිලිගී) අවසානයෙහි තමන්ට අභිමත වෘත්තයකින් (බැඳි) සිව්පද හෝ දෙපද කැමැති පමණ කොට බන්ධනය කරණු. එහි දු වෘත්තයෝ අප්‍රමාණ වෙත්.

**විස්තර:**— රසහැලි ආදි වෘත්ත ලක්ෂණ මෙයින් ප්‍රකාශිත යි. මේ විරිත් පසෙහි දී සිතිලිගී පිළිවෙළින් වැඩි කළ යුතු යයි කියන ලදී. මීට මුලින් දැක්වූ ඇහැලි විරිතෙහි සිතිලිගී සයක් යොදන ලදී. එහෙයින් සිතිලිගී වැඩි කළ යුත්තේ එතැන් සිට ය. ඒ විරිත්වල සිතිලිගී වැඩි වන්නේ මෙසේ යි.

1. රසහැලි විරිතෙහි සිතිලිගී සතකි.
2. විරිලි විරිතෙහි සිතිලිගී අටකි.
3. රාහැලි විරිතෙහි සිතිලිගී නවයකි.
4. මිහිඳු විරිතෙහි සිතිලිගී දහයකි.
5. සුරිදු විරිතෙහි සිතිලිගී එකොළොසකි.

මේ එකක් එකක් අවසන්හි 'සිව්පද හෝ දෙපද මන පමණ' කරන්ට ය යි කියන ලදී. මේ ද මේ පොතෙහි අඳුරු තැනකි. කැමැති පමණ සිව්පද හෝ දෙපද යොදන්ට කී හෙයින් සිතිලිගී සතක අවසන්හි සිව්පදයක් යෙදුවත් සිව්පද සියයක් යෙදුවත් එක ම රසහැල්ලක් වේ. මෙසේ හෙයින් රසහැලි ආදිය අවසන්හි සිව්පද කොපමණ යෙදිය යුතු දැ යි විනිශ්චය කිරීමට මේ පොතෙන් හෝ අනික් පොතකින් කිසි ම උප කාරයක් නො ලැබේ. එහෙත් කිසි ම සැහැල්ලක සිව්පද දහය කට වඩා නො යෙදිය යුතු ය යන මතිමාත්‍රයක් ඇතැම්හු දක්වති. ඒ මතය හේතුරහිත හෙයින් අස්ථිර වුවත්, ග්‍රන්ථාගත නො වන හෙයින් අනාථ වුවත්, සැඩ දියපහරින් ගසා ගෙණ යනු ලබන්නහු කාටු අත්තෙහි වත් එල්ලෙන්නාක් මෙන්, පිළිගත යුතු ය. එය පිළිගත හොත් රසහැල්ලෙහි සිව්පද දහය තෙක් තමන්ට කැමැති ගණනක් යෙදිය හැකි ය. දෙපද

1. බදු නො හෙලා.

**105. මෙ පස් සඳ නිදසුන්-දනු ලක්හුළ මහත්මන,**
**බියෙන් නො ම බඳින්නෙමු-යි දසුන් මෙහි පළමු එව.**

**මේ පස් සඳ යි.**

---

යොදතොත් දෙපදකව් විස්ස තෙක් යෙදිය හැකි ය. සෙසු විරිලි ආදියෙහි ද මේ ක්‍රමය දත යුතු යි. මේ රසහැලි ආදියෙහි වෙනස එන්නේ සිතිලිගී වැඩි වීමෙන් පමණකි.

'සඳැස් ලකුණ' වර්ණනාවෙහි 'සිව්පද දෙපද හෝ' යන්න "සිව්පද දෙපද හා" යි යොදා "(රසහැලි ආදි වෘත්තයන් සෑදීමට තබාගත් සිතිලිගී වෘත්තයාගේ) අවසානභාගයෙහි (මන පමණ=) තමහට අභිප්‍රෙත වූ සිව්පද තවක් හා දෙපද තවක් ද යොජනය කර රුචිවූ වෘත්තයකින් බන්ධනය කරණු" යි අර්ථ ද කියා "සිතිලිගී සයක්හුගේ අන්තයෙහි සිව්පද කවක් සහිත දෙපද කවක් යෙදූ විට රසහැලිනම් වෘත්තය (වේ)" යනාදින් විස්තර ද කරණ ලදී. ඒ අර්ථව්‍යාඛ්‍යානය සත්‍යාර්ථ වුවොත් විස්තරය ද පිළිගත යුතු ම ය. අර්ථව්‍යාඛ්‍යානයෙහි සත්‍යාර්ථාසත්‍යාර්ථබව විවෙචනය කිරීම සුධීවරයන්ට ම භාර කරමු. 'මන පමණ' යන්නට 'තමහට අභිප්‍රෙත වූ' යන අර්ථයක් කිය හැකි ය යි අපට නම් නො වැටහේ.

**105.** **අර්ථ:—** ලඞ්කාභ්‍යන්තරයෙහි මහත් බුද්ධි ඇත්තෙනි, (තොප ම) මේ ඡන්දස් පසට නිදශීන දත යුතු යි. පෙර දක්වූ වෘත්තයන්ට මෙන් මේ ඡන්දස්හි නිදශීන (ග්‍රන්ථබාහුල්‍ය) භීති යෙන් නො ම බඳින්නෙමු.

**විස්තර:—** යට කී විරිත් පසට නිදශීන් එලුසඳැස් ලකුණ කළ කාලයෙහි ද දුර්ලභ වූ බව මේ ගීයෙන් හැඟේ. එලුසඳැස් කතීෘ පාදයන් ඒ ඒ වෘත්තයන්ට නිදශීන අන්‍ය කාව්‍ය ග්‍රන්ථයන්ගෙන් ම ගෙණ යෙදූ බව පෙණේ. එහෙත් මෙහි දී එසේ නිදශීන ගන්නට නැති හෙයින් තමා විසින් අමුතුවෙන් බැඳ යෙදිය යුතු ය. එසේ කරන්නට වුවොත් පද්‍ය අධික වීමෙන් ග්‍රන්ථය ඉතා මහත් වෙතැයි මේ කතීෘපාදයෝ බිය වූහ. 'බියෙන් නො ම බඳින්නෙමු'යි කියන ලද්දේ එහෙයිනි. මේ රසහැලි ආදියට නිදශීන තනා ගැණීම ශිෂ්‍යයන්ට අපහසු නො වේ. එහෙයින් අපි ද එහි උපෙක්‍ෂා වෙමු.

**106. සිතිලිගි දෙළසක්-දනු සරගහැල්ලෙහි [1],**
**මන පමණ වෙසි සිව්පද-විරිතෙහි තමා [2] හැගි සේ.**

**සරගහැලි සඳ යි.**

---

"සඳැස්ලකුණ' වණ්නාවෙහි ඇහැලි ආදි වෘතතයන්ට දක් වන ලද, නොයෙක් සමබන්ධ ඇති, කිසිසේත් එකට නො ගැළපිය හැකි, පද්‍යයන් යට දැක්වූ සවකීය විස්තරය පරිදි එක්තැන් කොට ඊට පෙර මුද්‍රිත පොත අසම්පූණ් ය යි ද, ඒ සඳැස් ලකුණ ම සම්පූණ් ය යි ද, තත්කතීඃපාදයෝ උදන් අතති. එසේ නම් ඒ භද්‍ර සථවිරයන්වහන්සේගේ ම දෙෂයෙකි. එළුසඳස්ලකුණ මුද්‍රණය කරවූවන්ගේ දෙෂයෙක් නො වේ.

**106.** අණි:— 'සරගහැලි' නම් සැහැලි වෙසෙසෙහි සිතිලිගි දෙළසක් (වේ යයි) දත යුතු යි. සිව්පද සිත් (කැමැති) පමණ වෙයි. ඒ සිව්පදයන්හි වෘතත තමන්ගේ අභිප්‍රාය පරිදි වෙයි.

**විස්තර:**— සිතිලිගි දෙළසක අවසන්හි තමන්ට කැමැති ගණනක් සිව්පද යොදා බැන්දෙත් **'සරගහැලි'** නම් වෘතත විශෙෂය වේ. යථොකත මතභෙදයට ගරු කරතොත් මෙහි ද සිව්පද දහයකට වඩා යෙදිය හැකි නො වේ. ඒ සිව්පද ද තමන්ට අභිමත වෘතතයකින් බැන්ද හැකියි. මෙහි දැක්වූ සරගහැලි නිදසුනෙහි සිතිලිගී එකොළසක් මිස එක් සිතිලිගියක් ද, අවසන්හි සිව්පද ද නො පෙණේ. එය ලියන්නන්ගේ ප්‍රමාදය කින් වූවකැයි හගිමු. සිතිලිගී දෙළොසක් හා ඒ අවසන්හි සිව්පද කීපයක් ද ඇති සේ අමූතු නිදසුනක් ශිෂ්‍යයන් විසින් ම තනා ගත යුතු යි. ඒ පැරණි සිතිලිගී දෙළස මෙහි දක්වනු ලැබේ. එනම්:—

**1. නිසැලෙනැකනියපා-අපට වැඩක් මේ කරව**
**වහලේ හදිය පැහැ ද නා**
**සිම්ගෙලෙමූ හෝ ව ද නා**

**2. නො ගන නොවග රූපු දෙසෙ-කිද සකිරූ මහ කුපිරූ**
**අදහා මා සෙන් බ ඳ නා**
**ඉනි ගෙල නොලදින් නි ද නා**

---

1. සරගහැලි නම් වේ.– සඳැස් ලකුණ.
2. පමණ සිව්පද අතැ විරිත් තමා–සඳැස්ලකුණ.

3. දසලු එසේ හොත් සිරි-දකුණට දනවා දින්
ලඹුබලගෙලෙ රුවැ ත් ති ය
නැඹුමු මුව රුවැ ත් ති ය

4. අග බසබ දෙසෙ හිටි-කුරිරු අගහරු නමදිම්
නොලා නොලා නො ගත් ති ය
ගත නො ලගිනෙත ඉත් ති ය

5. එසේ හොත් එදෙසට-පලට පල කොට දිත් ලමු
කිම සුවදෙහි දෙස් නැති හෝ
කියග කියග නෙවිරිදු හෝ

6. කිවි එදෙසලදද-සෙනසුරු බුද ද රාහුදු
වකුරග ඇම නෙත්ත ද හා
සඳින් සඳින් මැති ල ද හා

7, අහෝ එසේ වුව-ලතුරු දසගින් දිවිලනු
දෙස් නැති තොසසෙ ඔත්තා හා
මසුරු ගෙවා දන් බුද හා

8. රාහු ද සසගඩ ද-එදෙස සනත් ලමුදුවහ
නො කැලෙත් ද ඔහු බුහුම න
අද පණති දිවි කනහ න

9. එකනඩ බා බිම පිලි-එකපසින් නික්ම යා
ඔහ ඔබ දනෝ ද ල්වාය
ලමු දින් බිම් බ ල්වාය

10. අතග මෙතෙදග දුම්-කෙහෙල් වෙසෙ සරස්ලෙහි
විසිනැති එවටනට මා ගතන ග ත
ලමු එම ඉති වුව හොත ඉතිවුව හො ත

11. ඉටන්පසින් අහස්-බලවා දිලුව කියවෙව
මෙනෙහේ අන්තෙසු පිරිපතක් නැ ත
නැතිගේ සක්දෙවියගෙ පහබර ත

12. සිතිලිගිය ඌනයි.
සිව්පද ,,
,, ,,

මේ පොතට සන්න ලියන කාලයේ දීත් මේ සරහහැලි නිදසුනෙහි ඌනත්වය විද්‍යමාන වූ බවත්, සම්පූර්ණ නිදසුන

**107.** (දසනවමතින් ගුරු-යති කළ පද වී නම්,
සිව් අට සතරමත්තෙන්-ගුරු යතිය තුන්පද මේ.

**108.** මේ ගුණ කළ පස් සඳ-දස සපිරුණු විස්සෙක,
පිරියත්හි සිව්පද වුව-ඒ දනු අඹහැලි නම්.)

---

සොයා ගැණීමට බොහෝ උත්සාහ කළ නමුත් නො හැකි වූ බවත් සන්න කතීෘ කිය යි.

**සරගහැලි ඡන්දස නිමි.**

—||—

**සම විෂින් සඳ නිමි.**

---

**107-108.** මේ ගී දෙක අතිශය ආකූලව්‍යාකූල බව පෙණේ. නිදසුන ද ව්‍යාකූල හෙයින් ඒ අනු ව ද මේ දෙක ශුද්ධ කර ලීම අපහසු ය. මේ සම්බන්ධයෙන් එක් පොතක මතු පෙණෙන වාක්‍යය පෙණේ.—

"මෙහි අඹහැල්ලට නිදර්ශන තිබෙන්නේ වී නමුත් සැක සහිත ය. එහෙයින් මේ වරට මෙලෙස ගුරු කම ප්‍රකාශ ගී ම පමණක් පොත සම්පූර්ණ කර ගැන්ම සඳහා තැබුයෙමි. (ස. ක.)"

'සඳැස්ලකුණු' වර්ණනා කතෘෘන්වහන්සේ මේ ගී දෙක ශුද්ධ කර දක්වීමට මහත් උත්සාහයක් දරණලද බව ප්‍රශංසා මුඛ යෙන් පවසන අතර ම ඒ ශුද්ධියත් අර්ථව්‍යාඛ්‍යානයත් ඉතාමත් නිර්මල ය යි ද නො කියමු. එසේ ද වුවත් මෙහි දී අතික් උපකාරයක් නැති හෙයින් සඳැස්ලකුණු වර්ණනාවෙහි එන ශුද්ධි යත් වර්ණනාත් එසේ ම දක්වමු. එහි ගී දෙක මෙසේ යි:—

"දසනවමතින් ගුරෙක-යති කළ එක් පද වුව,
සිව්පද පස් පස් මතින්-යතියැති පදන් යුත් වූ.

මෙම ගුණ කළ පස්-පද දස පිරුණු විස්සෙක,
පිරියත්හි සිව්පද වුව-ඒ දනු අඹහැලි නම්"

මීට කළ අර්ථව්‍යාඛ්‍යාන හා වර්ණනා ද මෙසේ යි:—

19-20. "දසනවමතින්, දසනව මාත්‍රාවකින් පර වූ; ගුරෙක, ගුර්වක්‍ෂරයෙක්හි; යති කළ, යති තබන ලද; එක්පද වුව, එක් සිව්පදයක් වුව හොත්; (යලිත්) පස්පස්මතින් යති ඇති, මාත්‍රා පසෙන් පසෙන් යති ඇත්තා වූ; පදන් යුත් වූ, පදයන්ගෙන් යුක්ත වූ; සිව්පද, සිව්පද සාවක් වේ නම්;- මෙම පස් පද,

මෙ කියන ලද පඤ්චපදය; ගුණ කළ, ගුණ කරණ ලද්දේ; දස, දසපදයක් ද; (යළිත් ගුණ කරණ ලදු ව) පිරුණු, සම්පූර්ණ වූ; විස්සෙක, පද විස්සක් ද (වෙත් නම්); පිරියත්හි, මේ පද විස් සගේ අන්තයෙහි; සිව්පද වුව, සිව්පදයක් වූයේ නම්; ඒ, තද් වෘත්තය තෙම; අඹහැලි නම්, අඹහැලි නම් වෘත්ත ය යි; දනු, ජානනය කරණු.

"19–20. මේ අඹහැලි වෘත්තය නියම කරණ සූත්‍ර පද්‍යවය සියලු පොත්හි ම ආකුලව්‍යාකුල ව දක්නා ලැබේ. මෙයින් ප්‍රකාශ වන්නේ කුමක් ද යන බව වත් සිතා ගැණුමට අපහසු තරම් ඉතා අවුලක මේ පද්‍යවය වැටී තිබේ. මීට දක්වනලද නිදර්‍ශන පද්‍යයන්ගේ අතිශයාකුලත්‍වය ගැණ සලකන විට ද මෙය ශුද්ධ කිරීම නො ව අත්හැර දැමීම අතිශයින් ම යුතු ය යි අපට ද වැටහෙන. නමුත් ආධුනිකානුග්‍රහය ශ්‍රෙෂ්ඨ කාර්‍ය්‍යයක් බැවින් මේ සඳහා මෙහි දී ව්‍යායාම කිරීමට ආසක්ත වූ බැව් කියමු.

"මේ අඹහැලි වෘත්තය සෑදීමට මුලින් ම කව්පද එකක් හා ඊට අගින් සිව්පද කවක් යෙදිය යුත්තේය. ඒ යෙදූ මූල කව් පදය මාත්‍රා දසනවයකින් වන යතියෙන් යුක්ත විය යුතු බැව් කියා තිබේ. ඒ පදය නැවතත් දසයක් කොට ද, ආයෙත් එම දසපදය විස්සක් කොට ද, හෙවත් තනිපදයක් සහිත තනි සිව්පද කවක් බැගින් සතරවාරයක් යොදා, එහි අගට තවත් සිව්පද කවක් යෙදූ විට මෙ වෘත්තය සිද්ධ වන අයුරු සිතා ගැණීමට ඉඩ තිබේ. එවිට මේ වෘත්තය තෙම කව්පද සූවිස්ස කින් ම සමන්විත වේ ය යි නිශ්චය කළ හැකි ය. ඊට දක්වන ලද නිදර්‍ශන ද මෙසේ යි:—

## අඹහැලි.

1. අහස ගඟ තරඟ සිසිකඩ සලය යන ල — බා(ක. ප.)
   දුලුලු වරලසෙහි පලු සමලතලස මලුව — ත්
   නදනදන සොම්ගුණය කොම සිසි කල තෙනෙ — ත්
   නෙද දුලන රිවිරුසය බැහැර ලන නොව නැව — ත්
   නොමද රුප්‍රුකැල අඳුරදුරලු රිවිකිරණ යු — ත් (කව.)

2. මුහුන හැලුනවර උරදරණ වැල හර — දී(ක. ප.)
   සරු නන හිසෙහි කොකුම තැවරුයෙහි රත කිර — න
   උරෙහි සඳ සොම් සඳන සුණු වතල හද අද — න
   සරණ තල සලඹ සුම්හිරි නදින සවන ද — න
   අතයුවල වලලු යුග මිණිකිරණ උදුල ව — න(කව.)

**109.** සම විසිමතින් මතු-සම මෙළෙ යති 1 පද දෙකක්,
පිහිය නෑ සිව්පද වුව-සුනිස් නම් මේ නිදසුන්.

---

3. කලත රුසිර දන දන එපුරහන සබ බැ සා (ක. ප.)
සිකිපිල් සෙ දිගු වරලසෙහි උදුල තෙමලි නා
බන් උකුල රසුවැලය ගජ සමිනි උදුල නා
තිරිඳු පද කමල වැඳ සිරස නම කරමි නා
සතොස වන විලස නරනිදුට සෙත් කරමි නා (කව.)

4. මහරු වන තෙදන යසගුණග පිවිතුරු දු ලා (ක. ප.)
පසි දු සුරකැල දියත සුරුකා දී නිති‍යෙ නා
නිරිඳු අප සියල් සත මිතුරු කර දෙවමි නා
දෙවිඳු බල මුලු ලොවට පෙන්වමිනි ලෙස ම නා
නිරිඳු සඳ දීනානුමැන කියමිනෙහි තොරද නා (කව.)

5. මෙවුලතට මිණිලු පය සලන්නි සක් ව ලා
තබා පැහැසර සරණ පියුම් සිරස ම ලා
තුරු පද තබා කොට තමතුරු කිකරු මු ලා
මෙ මෙහෙසුරු හට යැදිය සෙතය සතරන් ව ලා (කව.)

"මේ අඹහැලි වෘත්තය හා ඊට නිදර්ශන පද්‍යයන් ද යෙදෙන අයුරු දුන් මඳක් දුර වත් මෙයින් ආධුනිකජනතාවට පහසු වෙන් දූන ගැණිමට හැකි වීම අපට ඉතා සතුටුදායක වේ"

සඳැස්ලකුණු වණ්නා කතීෘන් වහන්සේගේ මේ උත්සාහය ගැණ පසසන අතර ම අනික් කාව්‍යග්‍රන්ථයක නැති, මෙහි ද ඉතා ව්‍යාකූල වූ මේ අඹහැලි ලක්‍ෂ්‍ය ලක්‍ෂණයන් මුළුමනින් අස් කර දැම්ම වඩා යොග්‍ය ය යි අපි කියමු. මෙය තිබීමෙන් ආධුනික ජනතාවට වන වැඩෙක් නම් අපට නො පෙණේ. හුදෙක් ඔවුන්ට මෙය තිබීමෙන් කරදරයක් ම වේ.

අඹහැලි විරිත් නිමි.

---

**109.** අර්:— සම විසි මාත්‍රාවකින් මත්තෙහි සමාන වූ මෘත්‍යාක්‍ෂරයෙහි යති ඇති දෙපද සාවක් අවසන්හි සිව්පදයක් වුවොත් **'සුනිස්'** නම් වෘත්තය වේ.

---

1. උනු විසිමතින් පුන යති සම මෙළෙ.-සඳැස්ලකුණ.
2. නිදසුන් මේ සුනිස් නම්.

**110.** (දෙවිසි මතින් ගුරෙක-සති සතරින් ඇරින් වෙ,
ගුරු සුවල එක් දනු-මේ විරිත් දියුණු ද කොට.
**111.** පුන සිව් පෙදෙන් මතු-නවමතිනි අඩපද වුව,
ගල සඳ නමැයි දන්නේ-නිදසුන් දනු මත්තේ.)

---

මේ නිදර්ශනය යි:—

තො දන්ව තෙපි මහා සෙස් දවකු දකිසෙන් එ ග න්
හැඟවිසා දූව ගන්නා සරිමග නිති ගිනි ග න්
තෙසිතා ගන්මි දහ ඛ යා
වේ පොලෙ ගෙම ඡ්නු ඛ යා
සර සර සඳ ලඛ ල ඛ යා
ඇද ඇර ලුව මා මු බ යා

**විස්තර:—** මේ වෘත්ත විශෙෂයෙහි මුලට යෙදෙන්නේ දෙපා කවකි. ඒ ද මාත්‍රා එක්විස්සකින් යුක්ත විය යුතු ය. එසේ ම එළි සම කළ යුත්තේ අල් අකුරකිනි. මීට වෙනස් ව යෙදීමට මේ සූත්‍රය ඉඩ නො දෙයි.

“අලතුරු මෙළේ දන්-පද අත්හි නො ම සිටුවවු” යනුවෙන් මාතෘකෂර හෙවත් අල් අකුරු පාදාවසානයෙහි නො යෙදිය යුතු ය යි ලකුණු සරෙහි කළ නියමය මේ සුතිස්විරිතෙහි දෙපා කව සම්බන්ධ තන්හි නො සලකනලද බව මෙයින් ඔප්පු වේ. මෙහි පමණක් නො ව මෙයින් අන්‍ය නොයෙක් තන්හි ද පාදාන්ත යෙහි මළකුරු යෙදීමෙන් සිංහල කවීහු ලකුණුසරෙහි කළ ඒ නියමය උල්ලඞ්ඝනය කළහ. එසේ වුවත් මෙහි වනාහි එළිසමය නිත්‍යයෙන් අල් අකුරෙන් ම කළ යුතු වේ.

මෙහි “සමමෙළෙ යන පදයෙන් ද ‘සම එළි’ යන අර්ථය ම ප්‍රකාශ වේ” ය යි සමහරු කියති. ඒ භ්‍රාන්තියකි.

‘උනුවිසිමතින්’ යන පාඨය ගෙණ මාත්‍රා දහනවයකින් යතියක් වේ යයි ද ඇතැම්හු කියති. එහි යතියක් විය නො හැකි ය. එයින් පසු ව තිබෙන්නේ මාත්‍රා දෙකකි. එහෙයින් මාත්‍රා දහනවයකින් වන යතිය පාදාවසානයට ඉතාමත් කිට්ටු ය. පාදාන්තයතියට එතරම් කිට්ටුවෙන් යතියක් තැබීම අවශ්‍ය නො වේ.

**110-111.** මේ ගී දෙක ද, මෙයින් ප්‍රකාශ වන ගල සඳ විරිතට දක්වන ලද නිදසුන ද ඉතා ආකූල ය. එහෙයින් ම

මුද්‍රිත එක් පොතක මීට අර්ථව්‍යාඛ්‍යානයක් වත් නිදසුන් වත් නො දක්වන ලදී.

**සඳැස් ලකුණු වර්ණනාවෙකි:—**

"දෙවිසි මතින් ගුරෙක-නව සත් සත් මතින් වූ,
යතිතුරු වූ යලිත්-මෙ ම කව්පද දියුණු කොට.

පුන සිව්පෙද අතැ-සමත අඩු එක් පද වුව,
ගලසඳ නමැයි දන්නේ-නිදසුන් ද දනු මත්තේ"

යන වශයෙන් මෙය සංස්කරණය කොට—

"දෙවිසිමතින්, මාත්‍රා දෙවිස්සකින් පර ව; ගුරෙක, ගුරු අක්ෂරයෙක් වේ; නව සත්සත්මතින් වූ, මාත්‍රා නවයකින් හා සතකින් හා සතකින් යෙදුනා වූ; යතිතුරු වූ, යතියෙන් අධික වූ; මෙ ම කව්පද, මේ කාව්‍යපාදය; දියුණු කොට, විගුණ කොටින්; පුන, යලිත්; සිව්පදඅතැ, සිව්පදයාගේ අන්තයෙහි; සමත අඩු, මාත්‍රා සයක් අඩු වූ; එක පද වුව, එක පදයක් වුව හොත්; **ගලසඳ** නමැ යි, **ගලසඳ** නම් වෘත්තය යි; දන්නේ, ජානනය කරන්නේ ය; නිදසුන් ද, (ඊට) නිදර්ශන ද; මත්තේ, මතුයෙහි; දනු, ජානනය කරනු" යි

අර්ථ ද කියා—

"මේ ගලසඳ නම් වෘත්තය සැදෙන අයුරු මේ සූත්‍රවයෙන් කියනු ලැබේ. එනම්: මාත්‍රා දෙවිස්සකින් පර ව ගුරු අක්ෂරයෙක් වේ. යලිදු නව මාත්‍රාවකින් හා මාත්‍රා සතෙන් සතෙන් යති ඇති කව් දෙපදයක් මුලට මෙදිය යුතු ය. ඊට අයින් තවත් කවක් යෙදිය යුතු ය. එම කවිහි අගපදයේ අතිස් පද වලට වඩා මාත්‍රා සයක් අඩුවිය යුතු යි. මෙසේ වූ කල්හි මෙ වෘත්තය තෙම ගලසඳ ය යි කියනු ලැබේ" යි.

විස්තරයක් ද කර—

"දියවැඩ හෙයින් වැඩිහ කුළුනෙන් නොවැළහා මෙන් ගි
දියට සුමඟුල් ලැබ සිරිබර ලකල් කලග කිත්නෙ ගි

උනා පහලෙ දූහැ සව්සනගෙන යො නෙ ගි
සිරිසිඳු සැප වැද ඉසිදහසම වෙ නෙ ගි
ඉසිවදන් සුමුසුවන සුමිහිරි වෙ නෙ ගි
සග පහවැඩ හිම වෙ නෙ ගි" යි

112. මුනිනඳන පෙර පද[1]-දිගුණු කොට බඳ හොත්,
පිරියත්හි සිව්පද වුව-වසම් සඳ නම් හෙ මෙසේ.

113. මුනිනඳන පරපද-අන්තහි විෂම් පද ලා,
දිගුණු කොට බඳ හොත්-වසම්උනුසඳ නම් වේ.

---

නිදසුන් ද දක්වන ලදී.

ඒ ශුද්ධියත් නිදශීනත් ඉතාමත් ආකූලබව කියමු. මෙය පූර්ණත්වයට පැමිණවීමට කිසි ම පිටිවහලක් නැත. මෙය ද එලු සඳස්ලකුණෙන් පහ කළ යුත්තකි.

ගලසඳ යි.

**112.** අර්ථ:— මුනිනඳන නම් වෘත්තයෙහි පූර්වපදය දිගුණු කොට බැන්දෙත් ඒ අවසන්හි සිව්පදයක් වුවොත් 'වසම්සඳ' නම් වෘත්තය වේ.

ඒ මෙසේ යි:—

කල් කුළුපුළු ඉඟිල්ලිනි ගෙලග වතළ වරල්ලි නී
විශවුලි එසුනු මල්ලි නී කියඹුවැලය සුනිල්ලි නි
පිල්බර නෙත් සඳිසි වූ මද නෙ ත් නී
බුලතිනළුත් කොමලරත ලවන ත් නී
ඉඟිලස වරල් වුවන ලෙල කණ ත් නී
සොමු කළ පස්කැන් ලලන කොපුල ත් නී

**විස්තර:—** මුනිනඳන පෙරවිලඹු දෙපා කවෙහි පූර්ව පාදය විගුණ කොට හෙවත් විරුවෘත්ත කොට ඒ අවසන්හි සිව්පද කවක් යෙදූ විට වසම්සඳ විරිත ලැබේ. මුනිනඳන පෙරවිලඹු විරිතෙහි ගුරුලඝුමාත්‍රාදි නියමයක් නැති හෙයින් මුනිනඳන පෙරවිලඹු පෙරපදය කෙබන්දක් දෑ යි නිශ්චය කිරීම අපහසු ය. එහෙත් යට දෙපා කව් කොටසෙහි හා මෙහිත් දක්වන ලද නිදසුන් අනු ව එය නිශ්චය කට යුතු සේ පෙණේ. මුනිනඳන පෙරවිලඹු පූර්වපාදය වශයෙන් දක්වූ නිදසුන් අනු ව එහි මාත්‍රා විසිහතරකි. මාත්‍රා දෙළසින් දෙළසින් එළිසමය සහිත යතිය ද පෙණේ.

වසම් සඳ යි.

**113.** අර්ථ:— මුනිනඳන පරපාදයාගේ අන්තයෙහි විෂම පාදයක් ලා එය විගුණ කොට බැන්දෙත් වසම්උනුසඳ නම් වේ.

---

1. මුනිනඳ පෙර දෙපද.

**114. බඳ සත්මතින් අතැ-එක් විරිතින් සතරපද,**
**පිහියොඹ නමැයි දන්නේ-නිදසුන් එයට මේ වෙ,**

---

**විස්තර:**—මූනිතනඳතවෘත්තයාගේ පරපදයට, ඊට මාත්‍රා ගුරු ලඝු ආදියෙන් වෙනස් වූ තවත් පදයක් එකතු කළ විට දෙපා කවක් සිද්ධ වේ. එය දියුණු කළ විට හෙවත් එවැනි තවත් දෙපා කවක් ඊට එකතු කළ විට වසම්උනුසඳ විරිත සැදේ. මූනිතනඳත වෘත්තයන්ගේ ලක්‍ෂණ අකපිත හෙයින් ද නිදශිත ව්‍යාකුල හෙයින් ද මෙහි දු ස්ථිර වූ ලක්‍ෂණ නියමයක් කළ නො හැකි ය.

මීට දක්වූ නිදසුන මෙසේ සි:—

**අවුල්හගින් කපුරැහගින් එ තැන පස ලැ ගි නි**
**ඉඟිලස කොමල අ ගි නි**
**දෙව්දුගු ඇඟිලි ගැමෙන් මිරිකි තන කොකුමහර ගි නි**
**මද මත කෙළි නර ඝිනි සිරි ගි ණි**

වසම් උනු සඳ සි.

**114.** අර්ථ:— මාත්‍රා සතකින් අනතයෙහි එක් විරිතකින් සිව්පදය බැන්දෙත් (ඒ විරිත) පිහියොඹ නමැයි දත යුතු සි.

ඊට නිදසුන් මේ සි:—

**අහස් විල එව්, සඳ මිණ් පුල් හි**
**පිවිහුර සෙයින්, කුමුදන වැස් හි**
**කොඳ කුමුදුසක්, පැහැසුබ වජ් හි**
**සිකියොන් යතව, නහ ඇපැලුම් හි**

**විස්තර:**— මේ නිදසුනෙහි සිව්පදයෙහි ම මූලට මාත්‍රා හත බැගින් ද ඊලඟට එක ම විරිතින් බැඳි එළිසම සිව්පදයක් ද වේ. මාත්‍රා හතෙන් අග යෙදෙන සිව්පදය තමන් කැමැති විරිතකින් බැඳිය හැකි හෙයින් අසඞ්ඛ්‍ය ගණනක් පිහියොඹ විරිත් තිබේ.

සඳැස්ලකුණු වණ්නාවෙහි සූත්‍ර ගීය:—

"බඳ යති සත්සතෙක්-විරිතින් සතරපද වත,
පිහියොඹ නමැයි දන්නේ-නිදසුන් එයට මේ වේ" යි

සංස්කරණය කොට "එක ම වෘත්තය කින් බඳනා ලද සිව්පද යක්හුගේ සත් සත් මාත්‍රාවකින් විශ්‍රාමය වත හොත් එය' පිහියොඹ නමැ" යි කියන ලදී. එකී ලක්‍ෂණ අනු ව නම් මේ

115. කොළ සුවහස් විරිත්-සඳස්ලකුණු දනු එලුවෙ,
එබඳුන් හොත් කිවියරන්-නො විරිත් නමැයි කො විරිත්.

116. මිණ් ආරෙව් මිණි-තෝරා නන් උතුම්තුම්,
විරිත් මිණ් ආරන්-කිවි ගෙණ බඳනේ විරිත්. 1

---

වෘත්තය සෙල්සඳසට අයත් විරිතක් වේ. එහෙයින් එහි මිස මෙහි යෙදිය නො හැකි වේ. මෙහි දී කියන ලද හෙයින් ම මෙය සපිර වූ ලක්‍ෂණයක් නැති වෘත්තයක් බව ඔප්පු වේ. එහෙයින් ඒ සංස්කරණය යොග්‍ය ය යි සිතිය නො හේ.

මූල දෙපාකව් අතර ද පිහියොබ නමින් වෘත්තයක් උදෙසන ලදී. එක නමින් වෙනස් ලකුණු ඇති විරිත් දෙකක් ඇති වීම නො මැනවි. මෙය ග්‍රන්ථ කර්තෘගේ ප්‍රමාදයෙන් වූවක් ද නැත හොත් ලෙඛකයන්ගේ වරදින් වූවක් දැ යි කිය නො හේ. කෙසේ වූවත් එකක් අධික ය.

පිහියොබ යි.

මියුරු සඳ නිමි.

---

වෘත්තලක්‍ෂණ කථනය සමාප්ත කොට එයින් අන්‍ය වූ ද කෙළ සුවහස් ගණන් විරිත් ඇතිබව දක්වන්නාහු "කෙළ සුවහස්" යනාදිය කියත්.

**115** අ:ඊ:— සිංහලයෙහි කොටි ශත සහස්‍ර වෘත්ත ඇති ඡන්දෝලක්‍ෂණ දත යුතු යි. කාව්‍යකාරයන් ඒ බඳිතොත් කවර නම් වෘත්තයක් වෘත්තයක් නම් නො වේ ද?

**විස්තර.**— ඡන්දස්හි අසංඛ්‍ය ගණන් වෘත්ත ඇති බව යට දැක්වූ සංඛ්‍යානප්‍රත්‍යයාදියෙන් පැහැදිලි වේ. ඒ වෘත්ත ද සම විෂමාදි නොයෙක් ප්‍රභෙද වලට පැමිණේ. කවර ලෙසකින් පද්‍ය බන්ධනය කළත් ඊට ඡන්දසෙහි වෘත්තයක් ද ඇත්තේ ය. එහෙයින් වැරදි වෘත්තයකැයි කියහැක්කක් නැත්තේ ය. සියල්ල ම වෘත්තසංඛ්‍යාවට ම වැටේ. එසේ වුවත් ශ්‍රැති සුඛය නො නැසෙන. සේ යහපත් විරිත් ම තෝරා ගෙණ පද්‍යබන්ධනය කළ යුතු බව අනතුරු ගීයෙන් කියත්. මෙසේ ඉඛ දෙනලද නමුදු ඡන්දශ්ශාස්ත්‍ර නියමයන් නො පිරිහෙලා ම පද්‍යබන්ධනය කළ යුතු යි.

**116.** අ:ඊ:— රත්නාකරයෙහි වූ නොයෙක් උතුම් උතුම් රත්න තෝරා ගෙණ (ආභරණයන්හි) බන්ධනය කරන්නාක්

---

1. චර විරිත්.

117. ඇත හොතුදු රුවන්-ගනඅඳුරේ කොටාරේ,
පිවිරසිනසක් දක්නේ-පලම නැත ඉතිරියන්.

118. එමෙනි මා නිය අස-කින් කළ විරිත් මිණිමල්,
රැඳෙවා ගෙලෙ යෙහෙන්-සිරිලක එළු කිවියරන්.

119. සියබස් පද නිදොස්-පහනත සඳස් මෙ වැටුප්,
විමලග සසුන් වැසි වූ-බඳ නම විසින් දුටුයේ.

එළුසඳස්ලකුණ නිමි.

---

මෙන් කවිතෙම වෘත්තරත්නාකරයෙන් (=ඡන්දසින්) උතුම් උතුම් විරිත් (තෝරා) ගෙණ බන්ධනය කරන්නේ ය.

**විස්තර:—** ආකරයෙහි නානාවිධ මාණික්‍ය ඇත ද ආභරණ කර්මාන්තයෙහි දක්ෂ පුරුෂතෙමේ ඒ සියල්ල ම නො ගෙණ එයින් උතුම් උතුම් මැණික් පමණක් තෝරා ගෙණ ආභරණයන්හි බැඳ ලොකයාගේ ප්‍රශංසාවටත් ධනපරිත්‍යාගයටත් භාජන වේ. එසේ ම දක්ෂ කවිතෙමේ, ඡන්දස්හි නොයෙක් වෘත්ත ඇත ද, එයින් උතුම් වෘත්ත පමණක් තෝරා ගෙණ කාව්‍ය බන්ධනය කරන්නේ ය.

**117.** අර්ථ:— ඝනාන්ධකාර ඇති කොෂ්ඨාගාරයෙහි රත්න ඇතත් සූර්යරශ්මියෙන් දක්නේ අංශයකි (=කොටසකි). ඉතිරි රත්නයන්ගේ ප්‍රකට භාවයක් (පෙණීමක්) නැත්තේ ය.

**118.** අර්ථ:— එලෙසින් මාගේ ඥානාංශුවකින් කළා වූ වෘත්ත නමැති මණිමාලාව ශ්‍රීලඞ්කාවෙහි සිංහල කාව්‍යකාරයන්ගේ කණ්ඨයෙහි යෙහෙන් රැඳේවා.

**119.** අර්ථ:— ස්වකීය භාෂාමය පද්‍ය නමැති නිර්මල ප්‍රදීපයෙහි මේ ඡන්දස් නමැති වෘත්තිය (=පහන්තිරය) නිර්මල වූ අග්‍ර වූ ශාසනයෙහි වාසි වූ (=පැවිදි වූ) භද්‍ර නමැතියන් විසින් දක්නා ලද්දේ ය.

එළුසඳස් ලකුණට කළ සඤ්ජීවනී ව්‍යාඛ්‍යාව

සමාප්ත යි.

# ඡන්දෝ වෘත්ත නාමයන්ගේ අකාරාදි
# අනුක්‍රමණිකාව.


| | |
|---|---|
| අණවිදඬු | 69 |
| අතිඋනු | 47 |
| අඹහැලි | 74, 93 |
| අරී | 50 |
| ඇහැලී | 74, 87 |
| උතු | 44 |
| උනුවිලඹුගී | 22, 24 |
| උනුහැලි | 83 |
| උපජාති | 52 |
| උමතුගී | 16, 24 |
| උවදූ | 52 |
| උවදූසැහැලි | 78 |
| කඩවක් | 74, 77 |
| කඳ | 49 |
| කනීල් | 54 |
| කමලා | 63 |
| කාවිගී | 16, 24 |
| කාරිකා | 18, 24 |
| කිඳුරු කෙළි | 60 |
| කුසුම් සිරිහර | 63 |
| ගඟහැලි | 66 |
| ගජ | 44, 55 |
| ගජගාමි (ගැමි) | 4, 22; 24 |
| ගලසඳ | 96 |
| ගාහ | 79 84 |
| ගී | 13, 24 |
| තරඟවැල | 57 |
| තලා | 47 |
| තිරියත්සර | 49 |
| තුරඟරඟ | 63 |
| තෙතොත් | 44, 63 |
| තොශොල්ගී | 19, 24 |
| තෝටක | 4, 57 |
| දකුණුතොහොල්ගී | 19, 24 |
| දණ්ඩක (දඬු) | 69 |
| දිගහුරු | 65 |
| දිගෝවිලි | 64 |
| දියකෝලි | 56 |
| දුවහගී | 18, 24 |
| දෙපා | 71 |
| දෙව්ගීගාහ | 58 |
| දෙව්තළ | 75 |
| දෙව්පාණී | 72 |
| දෙධක | 4, 58 |
| දෙඹ | 56 |
| නරඟරඟ | 61 |
| නලහව් | 62 |
| නළගාහ | 53 |
| නළගී | 20, 24 |
| නුපුන්සඳ | 66 |
| පද්මාකර | 48 |
| පමද | 65 |
| පසුකෙළි | 75 |
| පියුමකර | 48 |
| පියුම්ගී | 15, 24 |
| පිහිටි | 44 |
| පිහියොඹු | 73–99 |
| පුණුඅතිපුණු | 67 |
| පෙද | 58 |
| ප්‍රහරණකලිතා | 59 |
| බමරගී | 16, 24 |
| බහුරුවිදඹ | 60 |

| | |
|---|---|
| බැහැලි | 74, 85 |
| බිඟුවෙණ | 50 |
| බිඳු | 47 |
| භුජඟයා | 50 |
| භුජඞ්ගප්‍රයාත | 51 |
| මත්වලගී | 15, 24 |
| මඳු | 44 |
| මැඳුම් | 44, 47 |
| මිණිපොකුරු | 54 |
| මිණිමල් | 55 |
| මිණිරිළු | 61 |
| මින්ගති | 52 |
| මියුරුසඳ | 74 |
| මිසුලු | 47 |
| මිහිඳු | 74, 89 |
| මී | 44, 65 |
| මුනිඳන පෙර-පරවිලඹු | 73, 98 |
| මුවරදද | 59 |
| යා ගී | 17, 24 |
| යොන්ගී | 18, 24 |
| යොන්මත්වැල | 51 |
| රවුළු | 44. 61 |
| රසහැලි | 74, 89 |
| රාහැලි | 74, 89 |
| රුදි | 44, 59 |
| ලියකේලි | 59 |
| ලියහැලි | 74, 84 |
| වම්තොහොල්ගී | 19, 24 |
| වසත් | 51 |
| වසම්සඳ | 98 |
| වසම්උනුසඳ | 98 |
| වියත් | 62 |
| විරිලි | 74, 89 |
| විලඹුසිතිලිගී | 76 |
| සක්වා | 57 |
| සදුල්කෙළි | 55 |
| සඳ | 44, 46 |
| සඳහටගී | 19, 24 |
| සඳහැලි | 74, 86 |
| සඞ්ෂවයමක | 20 |
| සබරතළු | 75 |
| සමුදුරුඝොස් | 61 |
| සරඟහැලි | 74, 91 |
| සසපුලුතුගී | 21, 24 |
| සැහැලි | 74 |
| සිතිලිගී | 74, 75 |
| සිරි (සඳ) | 44, 47 |
| සිරි (විරිත්) | 46 |
| සුතිස් | 74, 95 |
| සුපිහිටි | 44, 49 |
| සුරමත්වැල | 52 |
| සුරිඳු | 74, 89 |
| සෙල් | 44, 53 |
| සෙවියත්සර | 49 |
| සෝදූමිණි | 64 |
| හසගැමි | 48 |
| හිරු | 44 |



